


# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## වාර්ෂික වාර්තාව

# 2020

## විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය




විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය කහ පැහැති පසුබිමක වෘත්තාකාර ස්වරූපයකින් තිබෙන අතර එහි පරිවරණයෙහි ඒක කේන්ද්‍රීය වෘත්ත තුනක් එකිනෙකට සමීපව පිහිටා ඇත. මෙම වෘත්තය මධ්‍යයේ කුඩා ඒකකේනද්‍රීය වෘත්තයක නෙලුම් මලක් සටහන් වී ඇති අතර නෙලුම් මලේ එක් පෙති තට්ටුවක් යටින් තව පෙති තට්ටුවක් ආකාරයට පෙති තට්ටු දෙකක් වේ. වෘත්තය මධ්‍යයේ ඒකකේන්ද්‍රීය වෘත්ත දෙකට මැදිව මලේ කේශර පහිටා ඇත. නෙලුම් මල පිහිටි ඒකකේන්ද්‍රීය වෘත්තයන්ට පිටතින්ද ඒකකේනද්‍රීය වෘත්ත තුනට මැදිවන සේ විශ්වවිද්‍යාලයේ නම සිංහල අක්ෂර වලින් දැක්වේ. එහි ඉහලින් පුරාණ බෞද්ධ ග්‍රන්ථයකින් උපුටාගත්

‘‘ **විජ්ජා උප්පතතං සෙට්ඨා** ’’ (**‘‘සියල්ල අතරින් ප්‍රඥාව ශ්‍රේෂ්ඨය’’)**

යනුවෙන් සඳහන් ආදර්ශ පාඨය සඳහන් වේ.

## විශ්වවිද්‍යාලයේ දැක්ම

**“**ඉගෙනීම තුලින් ජීවිත සෞභාග්‍යවත් කිරීම**”**

## විශ්වවිද්‍යාලයේ මෙහෙවර

‘‘අපගේ සංස්කෘතික උරුමයන්ගෙන් උද්දාමයට සහ ප්‍රබෝදයට පත් වෙමින් ජාතියේ සෞභාග්‍ය උදෙසා දැනුම වර්ධනය කිරීම සහ බෙදා හැරීම’’

# උපකුලපතිතුමාගේ සමාලෝචනය



2020 වර්ෂය අභියෝගයන්ගෙන් පිරුණු වසරක් වුවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට බොහෝ වෙනස්කම්, වර්ධනයන් මෙන්ම ජයග්‍රහණයන්ගෙන් සපිරුණු වසරක් විය. මුළු ලෝකය පුරාම කෝවිඩ් 19 වසංගත තත්වය පැතිරෙමින් පැවති දුෂ්කර කාලයක් තුල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටද ඒ හරහා ගමන් කිරීමට සිදු විය.

2020 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ සංයුතිය පහත පරිදි වේ: ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලය අධ්‍යයයන පීඨ 08 කින් සමන්විත වේ. මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය, වෛද්‍ය විද්‍යා පීඨය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, තාක්ෂණ පීඨය, ඉන්ජිනේරු පීඨය, හා සම සෞඛ්‍ය විද්‍යා පීඨය ඒම අධ්‍යයන පීඨයන් වේ. තවද විශ්වවිද්‍යාලය ඒක් පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනයකින් සමන්විත වන අතර එම ආයතනය කොළඹ 08 හි පිහිටා ඇත.

2020 වර්ෂය ආරම්භයේදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 25 වන උපකුලපති වරයා ලෙස ජ්‍යෙෂ්ඨ මහාචාර්යය සම්පත් අමරතුංග මහතා කටයුතු කල අතර 2020 ජනවාරි 03 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් එතුමාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරන ලදි. ඉන් අනතුරුව ඔහු වෙනුවට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ හා තාක්ෂණ පීඨයේ පීඨාධිපති ධුරය දැරූ ජ්‍යෙෂ්ඨ මහාචාර්යය සුදන්ත ලියනගේ මහතා 2020 ජනවාරි මස 06 වන දින වැඩ බලන උපකුලපතිවරයා ලෙස පත් කර න ලදි. පසුව ඒතුමාව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 26 වන උපකුලපතිවරයා ලෙස 2020 සැප්තැම්බර් 09 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදි.

2020 නොවැම්බර් 30 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 10 වැනි ලේඛකාධිකාරිවරයා ලෙස ඩබ්ලිව්.එම්.ආර්.ඩබ්ලිව්.අනුරුද්ද බී.වැලිවිට මහතා පත් කරන ලදි. ඔහු මෙම තනතුරට පත් කරනු ලැබුවේ කේ.ජී.බ්‍රිටෝ මහතා විශ්‍රාම යාමෙන් අනතුරුවයි.

කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම හේතුවෙන් දීප ව්‍යාප්තව රට වසා දැමීමත් සමඟ 2020 මාර්තු 14 සිට මැයි 11 දක්වා සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාලය වසා දැමුණු අතර එම කාලය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු ඇණහිට තිබුණි. කෙසේ වෙතත්, වෛද්‍ය විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ කෝවිඩ්-19 වෛරසයේ වික්‍රියා පිළිබඳව පර්යේෂණ කරමින් සහ නිරන්තර පී.සී. ආර් පරීක්ෂණ අඛණ්ඩව සිදු කරමින් ජාතියට උපරිම සහයෝගය ලබා දන ලදි.

දිවයිනේ විශ්වවිද්‍යාල වසා දැමීමත් සමඟ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් මාර්ගගත මාධ්‍ය හරහා අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා කාලීන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු කරන ලදී. සියලුම දේශන පාඨේ සූම් තාක්ෂණය හරහා සිදු කරන ලද අතර අමතර ඉගෙනුම් ද්‍රව්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) හරහා සම්පාදනය කරන ලදී. අධ්‍යයන කටයුතු සඳහා එල්ල වූ දැවැන්ත අභියෝග මධ්‍යයේ වුවද, නව සාමාන්‍යකරණ තත්ත්වයන්ට අනුගත වෙමින් මධ්‍ය සහ අවසාන සමාසික පරීක්ෂණ පැවැත් වීමට මෙන්ම අධ්‍යයන කටයුතු අඛණ්ඩව සම්පූර්ණ කිරීමට විශ්වවිද්‍යාලය සිය කාර්ය මණ්ඩලය සහ සිසුන් එක්ව සමත් විය. දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් මාර්ගගත මාධ්‍ය ඔස්සේ විශ්වවිද්‍යාලයීය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ සහ සමුළු රාශියක් පැවැත්වීම මේ සඳහා දිය හැකි පැහැදිලි උදාහරණ වේ.

තවද, ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂක ප්‍රජාවගේ දැණුම් නිම් වළලු පුළුල් කිරීමේ දැක්ම ඇතිව 2020 වර්ෂය තුළ නව අධ්‍යයනාංශ අටක් ස්ථාපිත කරන ලදී. ඒවා නම්, තාක්ෂණ පීඨයේ ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය, සිවිල් හා පරිසර තාක්ෂණ අධ්‍යයනාංශය සහ තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා අධ්‍යයනාංශය, සංගීත හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය සහ තොරතුරු හා සන්නිවේදන අධ්‍යයනාංශය, සහ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය අධ්‍යයනාංශයයි.

විශ්ව විද්‍යාලයට නව යටිතල පහසුකම් එක් කිරීම හේතුවෙන් 2020 වසර ද වැදගත් වර්ෂයක් විය. පිටිපන පිහිටි නව තාක්ෂණ පීඨ ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීම 2020 ජුනි 8 වැනි දින පැවැත්විණි. තාක්ෂණ පීඨයේ නව පීඨ සංකීර්ණය අක්කර 20ක භූමිභාගයක් තුළ රුපියල් බිලියන 3.5ක ආයෝජනයකින් ඉදිකෙරුණු අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් එය ශිෂ්‍ය පරිහරණය සඳහා උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයට මුල්ගල තැබීමේ උත්සවය 2020 ජූලි 17 වැනි දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නව ඉංජිනේරු පීඨයට මුල්ගල තැබීමේ උත්සවය ද 2020 දෙසැම්බර් 31

වැනි දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති පූජ්‍ය ආචාර්ය ඉත්තෑපානේ ධම්මාලංකාර මහා නායක ස්වාමීන් වහන්සේ, ගරු අධ්‍යාපන අමාත්‍ය, ගරු වෙළඳ අමාත්‍ය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති සහ ඉංජිනේරු පීඨයේ පීඨාධිපතිගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

පැවති වසංගත තත්ත්වය හේතුවෙන් පිළිවෙළින් 2020 සැප්තැම්බර් 2, 3 සහ 16 යන දිනවල පැවැත්වීමට නියමිතව තිබූ විශ්වවිද්‍යාලයේ 46 වැනි උපාධි ප්‍රදානෝත්සවය සහ බාහිර උපාධි උපාධි ප්‍රදානෝත්සවය කල් දමන ලදී. සියලුම සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව උපාධි ප්‍රදානෝත්සවය හැකි ඉක්මනින් යළි සංවිධානය කිරීමට පියවර ගෙන ඇත.

විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල සිසුන් සංඛ්‍යාව 2019 වසරේ 12,982 සිට සමාලෝචිත වර්ෂයේදී 13,758 දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. වඩා දැනුමැති,පළපුරුදු උපාධිධාරීන් බිහිකිරීමේ ජාතියේ ප්‍රයත්නයට විශ්වවිද්‍යාලයෙන් ලැබෙන දායකත්වය මෙයින් පිළිබිඹු කෙරේ.

2020 වසරේ දී කාර්ය මණ්ඩල බඳවාගැනීමේ  වැඩි වීමක් ද දක්නට ලැබේ. 2020 දෙසැම්බර් වන විට විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය 2019 වර්ෂයේ 946ක සිට 2020 දී 1061ක් දක්වා ඉහළ ගොස් ඇත.ස්ථීර කාර්ය මණ්ඩල සංඛ්‍යාව 2019 දී 1759 සිට 2020 දී 1802 දක්වා ඉහළ ගොස් ඇත. ස්වයං තිරසාර වීමේ ඉදිරි පියවරක් ලෙස 2020 දී විශ්වවිද්‍යාලය විසින් අභ්‍යන්තර ආදායම ලෙස රු. 609,926,178ක් උපයන ලදී. පාඨමාලා සහ උපාධි පාඨමාලා අත්හිටුවීම සහ  කොවිඩ් -19 වසංගතය මධ්‍යයේ මෙය 2019 වර්ෂයේ උපයන ලද රු. 817,429,736ක ආදායමට සාපේක්ෂව සුළු අඩුවීමක් වියහැකි වුවද, එමගින් අධ්‍යාපනයේ ඩිජිටල් යුගයකට පිවිසීම වැනි දිගුකාලීන ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ලැබී ඇත.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් එල්ලවූ අභියෝග මධ්‍යයේ වුවද 2020 වසර පුරා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පානැගුව මාවත ප්‍රසංශනීය වේ. නව සාමාන්‍ය තත්ත්වයන් යටතේ විශ්වවිද්‍යාලය බොහෝ නව වැඩිදියුණු කිරීම් සමඟ සමෘද්ධිමත් විය. ඉදිරි වසර වලදී ද විශ්වවිද්‍යාලය අඛණ්ඩව සෞභාග්‍ය කරා පිය මනිනු ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ
බී.එස්.සී (ගෞරව) (ජපුර.), පීඑච්ඩී (කාඩිෆ්), C Chem, FRSC, FIChem C, FPRISL

උප කුලපති

# පටුන


විශ්වවිද්‍යාලයේ නිල ලාංඡනය ..... i

විශ්වවිද්‍යාලයේ දැක්ම ..... i

විශ්වවිද්‍යාලයේ මෙහෙවර ..... i

උපකුලපතිතුමාගේ සමාලෝචනය ..... ii

විශ්වවිද්‍යාලය ..... 1

සම්පත් හා සිසුන් පිළිබඳ තොරතුරු ..... 2

දේශීය සිසුන් පිළිබඳ තොරතුරු ..... 2

විදේශීය සිසුන්ගේ විස්තර ..... 4

විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2020 ..... 4

විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2020 ..... 4

නව ශිෂ්‍ය ලියාපදිංචිය ..... 5

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018/2019 අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු ..... 5

පසුගිය වසර හතර තුළ අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු ..... 5

උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ..... 7

ශිෂ්‍ය සුභසාධන පහසුකම් ..... 8

මහපොළ ශිෂ්‍යත්වය ..... 8

ශිෂ්‍යාධාර ..... 8

නේවාසිකාගාර පහසුකම් ..... 9

කාර්ය මණ්ඩල විස්තර ..... 10

කාර්ය මණ්ඩල සාරාංශය (සේවා කාණ්ඩ ලෙස )2020 දෙසැම්බර් 31 දිනට ..... 10

2020 වර්ෂය තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ..... 11

පීඨ අනුව ස්ථීර අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2020 ..... 17

විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්: 2018 - 2020 ..... 18

පොදු කළමනාකරණය ..... 20

2020 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරි මණ්ඩලය ..... 20

පරිපාලන ව්‍යුහය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ..... 22

විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩලය ..... 23

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයන පීඨ ..... 25

මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය ..... 26

පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා ..... 27

අධ්‍යාපනය හා සංවර්ධනය ..... 28

උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්ති නිපුණතා ශක්තිමත් කිරීම ..... 30
වසංගතය අතරතුර මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් සහ ප්‍රවේශයන්. ..... 30
පර්යේෂණ සහ සමුළු ..... 31
වැදගත් සහයෝගිතා සහ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ..... 31
2020 දී කමිටු වසින් සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන් ..... 32
යටිතල පහසුකම් සංවර්ධනය ..... 33
2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය ..... 33
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020 ..... 34
දේශීය සිසුන් පිළිබඳ විස්තරය - 2020 ..... 35
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ..... 36
අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020 ..... 37
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020 ..... 38
ව්‍යවහාරික විද්‍යා පීඨය ..... 38
පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා ..... 39
2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය ..... 41
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020 ..... 42
දේශීය සිසුන් පිළිබඳ විස්තර- 2020 ..... 43
අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020 ..... 43
අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර - 2020 ..... 44
සිදු කරන ලදපර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන - 2020 ..... 44
ලැබූ ප්‍රදාන පිළිබඳ තොරතුරු- 2020 ..... 45
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ..... 45
පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි,ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා ..... 47
2019 හා 2020 නිකුත් කරන ලද ප්‍රතිඵල අතර සංසන්දනය ..... 48
දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2020 ..... 49
කාර්යය මණ්ඩල විස්තරය – 2020 ..... 50
අධ්‍යයන කාර්යය මණ්ඩලය -2020 ..... 50
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020 ..... 51
වෛද්‍ය විද්‍යා පීඨය ..... 52
පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා ..... 53
2019 හා 2020 වසර වල ප්‍රතිඵල සැසඳීම ..... 54
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020 ..... 54
දේශීය ශිෂ්‍ය විස්තරය - 2020 ..... 54
අධ්‍යයන කාර්යය මණ්ඩලය – 2020 ..... 55
අනධ්‍යයන කාර්යය මණ්ඩලය – 2020 ..... 56
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020 ..... 56

ප්‍රදාන පිළිබඳ විස්තර – 2020 ..... 57
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ..... 57
ශිෂ්‍ය තොරතුරු - 2020 ..... 59
උපාධි අධ්‍යයන පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව ..... 61
පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක රචනය පිළිබඳ සහතික පත් පාඨමාලාව ..... 62
බහුවිෂයික ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ..... 62
බහු විෂයික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව ..... 63
නව පශ්චාත් උපාධි පාඨමාලා ..... 63
තාක්ෂණ පීඨය ..... 63
2020 වසර සඳහා පීඨයෙන් නිකුත් කරන ලද ප්‍රතිඵල විස්තරය ..... 65
ශිෂ්‍ය සම්පත් විස්තරය - 2020 ..... 66
දේශීය සිසුන් පිළිබඳ තොරතුරු 2020 ..... 66
අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020 ..... 67
අනධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020 ..... 67
පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020 ..... 67
ප්‍රදාන පිළිබඳ විස්තර – 2020 ..... 68
ඉන්ජිනේරු පීඨය ..... 68
පීඨය මඟින් පිරිනමන උපාධි හා ඩිප්ලෝමා පඨමාලා ..... 69
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020 ..... 69
දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2020 ..... 69
අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020 ..... 70
අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020 ..... 70
සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020 ..... 71
සම සෞඛ්‍ය විද්‍යා පීඨය- 2020 ..... 71
පීඨය මඟින් පිරිනමනු ලබන උපා - 2020 ..... 72
2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය ..... 72
ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020 ..... 73
දේශීය සිසුන් පිළිබඳ විස්තරය - 2020 ..... 73
අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ..... 73
අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020 ..... 74
පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020 ..... 74
ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර- 2020 ..... 74
ශාරීරික අධ්‍යාපන අංශය ..... 75
ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයේ අරමුණු ..... 75
ක්‍රීඩා උපදේශක මණ්ඩලය ..... 75
ක්‍රීඩා සභාව ..... 76
ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ තරඟාවලි ..... 76

වර්ණ ප්‍රදාන ..... 77
වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ..... 78
තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය ..... 85
පුස්තකාලය ..... 86
බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය ..... 87
විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය ..... 90
2020 දී වෛද්‍ය මධ්‍යස්ථානය විසින් සපයන ලද සේවා පිළිබඳ සංඛ්‍යාලේඛන ..... 91
පර්යේෂණ සභාව ..... 91
විවෘත ප්‍රවේශ සහ ප්‍රකාශන ගාස්තු සඳහා ගෙවීම (2016-2020) - * (ඇ.ඩො.) 182.46 ..... 93
පර්යේෂණ සම්මාන සඳහා ඉල්ලුම් කර ඇති විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශන - (2015-2019) ..... 94
පර්යේෂණ මධ්‍යස්ථාන ..... 95
පර්යේෂණ සම්මාන - 2019 ..... 96
ලෝක බැංකු ආධාර යටතේ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීම ...97
උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ මෙහෙයුම් ඉලක්ක ..... 97
ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර ..... 97
මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය ..... 98
ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වියදම් ..... 99
නිගමනය ..... 101
තත්ත්ව සහතික මධ්‍යස්ථානය ..... 102
තිරසර ප්‍රගති වාර්තාව 2020 ..... 119
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය ..... 119
1. ඉගෙනීම සහ අධ්‍යාපනය ..... 119
2. පර්යේෂණ සහ සංවර්ධනය ..... 123
3. මහජනතාව ..... 125
4. යටිතල පහසුකම් ..... 126
5. මූල්‍ය ..... 128
6. ශිෂ්‍යයින්ගේ විශිෂ්ට අත්දැකීම් ..... 129
7. යාවජීව ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය/කලාපීය බලපෑම ..... 130
2020 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තාව ..... 133
2020 වර්ෂයේ පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර ..... 133
මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය- පීඨ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය 2020 ..... 134
ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු ..... 134
මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2020 රු.( '000) ..... 135
පූර්ව වර්ෂ 5ක මූල්‍ය සුවිශේෂිතා (සංඛ්‍යා රු '000) ..... 135
පූර්ව වර්ෂ 05 ක මූල්‍ය ප්‍රදාන ලැබීම පිළිබඳ තොරතුරු ..... 135
පූර්ව වර්ෂ 05 ක මූල්‍ය වියදම් පිළිබඳ විශේෂ තොරතුරු ..... 136
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය ..... 138

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය.....140

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....142

2020 දෙසැම්බර්31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශනය..... 144

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගනු ලැබූ වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය - 2020 .....146

සටහන් .....156

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව.....196

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාවට අනුකූලව ගන්නා ලද ක්‍රියාමාර්ග.....205

# විශ්වවිද්‍යාලය




කොළඹ නගර මධ්‍යයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය දීර්ඝ හා කීර්තිමත් ඉතිහාසයකට හිමිකම් කියයි. 1959 දී ගංගොඩවිල ආරම්භ කළ එහි මූලාරම්භය 1873 දී අතිපූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසින් මාලිගාකන්දේ ස්ථාපිත කරන ලද විද්‍යෝදය පිරිවෙන දක්වා දිව යයි. අද වන විට විශ්වවිද්‍යාලය වසර 62ක ඉතිහාසයක් පසු කරන අතරම වසර 148 ක ගමනට උපහාර පුදකරයි.

ශ්‍රී ලාංකේය අධ්‍යාපනයේ පුනර්ජීවනයේ හරය වූයේ විද්‍යෝදය පිරිවෙන නමින් අතීතයේ හැඳින්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. එය ශ්‍රී ලංකාවේ දෙවන පැරණිතම විශ්ව විද්‍යාලය වන අතර ස්වාධීන ලංකාවේ ස්ථාපිත ප්‍රථම විශ්ව විද්‍යාලය වේ.

අද වන විට විශ්ව විද්‍යාලය පීඨ අටකින් සමන්විත වේ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය, වෛද්‍ය විද්‍යා පීඨය, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ඉංජිනේරු පීඨය, තාක්ෂණ පීඨය සහ නවතම පීඨය ලෙස සම සෞඛ්‍ය විද්‍යා පීඨයකින්ද ශක්තිමත්ව පවතී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයින් 13,000 කට අධික සංඛ්‍යාවක් සහ පශ්චාත් උපාධි සිසුන් 2000 කට අධික සංඛ්‍යාවකට නිවහන වේ. එබැවින් ශ්‍රී ලංකාවේ ශිෂ්‍ය ජනගහනය අනුව විශාලතම විශ්වවිද්‍යාලය ලෙස සැලකේ.

තවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පර්යේෂණ මධ්‍යස්ථාන 22 කට අධික සංඛ්‍යාවක පර්යේෂණ සහාවකින් සහ 50කට අධික ව්‍යවසායකයින් සහ පාර්ශවකරුවන්ගෙන් යුත් 15කට අධික පේටන්ට් බලපත්‍ර සහිත නව නිපැයුම්, නවෝත්පාදන සහ ව්‍යාපාර නිර්මාණ කවුන්සිලයක්ද සමඟින් පර්යේෂණ හා නවෝත්පාදනයන් අතින්ද ඉදිරියෙන්ම සිටී.

විශ්ව විද්‍යාලය බොහෝ ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමඟ සුහද සබඳතාවක් පවත්වාගෙන ඇති අතර ජාත්‍යන්තරව පිළිගත් විශ්ව විද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් (MoUs) 60 කට වඩා අත්සන් කර ඇත. තවද ස්ථාපිත ජාත්‍යන්තර සහ දේශීය සමාගම් සමඟ අවබෝධතා ගිවිසුම් 60කට අධික ප්‍රමාණයක් අත්සන් කර ඇත. එමෙන්ම විශ්වවිද්‍යාලය තම සිසුන්ට ජාත්‍යන්තර අත්දැකීමක් ලබා දීමට උත්සාහ දරා අති අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ සීමාවාසික පුහුණුවිම්ද සිසුනට ලබා දී ඇත.

වසර ගණනාවක් පුරා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සිය නිම් වළලු පුළුල් කරමින් බොහෝ ක්ෂේත්‍රවල සංවර්ධනයට සමත් වී ඇත. අපගේ මාතෘ භූමියේ සංවර්ධනයට උපකාරී වන බුද්ධිමත්,කාර්යක්ෂම, දක්ෂ සහ වෘත්තීය පුද්ගලයින් බිහි කිරීමේ ප්‍රබල සන්ධිස්ථානයක් වූ අතරම මෙම ගමන ඉදිරියටත් එලෙසම ඉටු කරනු ඇත.

## සම්පත් හා සිසුන් පිළිබඳ තොරතුරු

| පීඨය | දෙපාර්තමේන්තු සංඛ්‍යාව | මුළු උපාධි අපේක්ෂකයින් (අභ්‍යන්තර) | මුළු අධ්‍යයන කාර්යය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 16 | 3462 | 139 | 69 | 57 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 11 | 2464 | 144 | 124 | 128 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 12 | 4843 | 187 | 43 | 87 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 17 | 951 | 119 | 16 | 147 |
| තාක්ෂණ පීඨය | 5 | 1246 | 54 | 48 | 40 |
| ඉන්ජිනේරු පීඨය | 5 | 472 | 16 | 47 | 43 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨ | 4 | 320 | 31 | 14 | 28 |

## දේශීය සිසුන් පිළිබඳ තොරතුරු

| උපාධි පාඨමාලාව/පීඨය | නව ලියාපදිංචි සංඛ්‍යාව | මුළු ලියාපදිංචි සංඛ්‍යාව | උපාධිධාරීන් ගණන |
|---|---|---|---|
| **අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින්** | | | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 939 | 3455 | 884 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 781 | 2464 | 545 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1216 | 4843 | 1200 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 160 | 947 | 144 |
| තාක්ෂණ පීඨය | 323 | 1246 | * |
| ඉන්ජිනේරු පීඨය | 120 | 472 | * |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨ | 88 | 320 | 71 |
| **මුළු අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්** | 3627 | 13747 | 2844 |

*සටහන * ප්‍රථම කණ්ඩායම 2021 දී උපාධිය සම්පූර්ණ කිරීමට නියමිතය.*

| උපාධි පාඨමාලාව/පීඨය | නව ලියාපදිංචි සංඛ්‍යාව | මුළු ලියාපදිංචි සංඛ්‍යාව | උපාධිධාරීන් ගණන |
|---|---|---|---|

**බාහිර ප්‍රථම උපාධි අපේක්ෂකයින්**

| | | | |
|---|---|---|---|
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 0 | 66758 | 0 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව (සාමාන්‍ය) බාහිර උපාධිය | 0 | 6550 | 172 |
| සමාජ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) පාරිසරික හා සංවර්ධන අධ්‍යයනය පිළිබඳ බාහිර උපාධිය | 181 | 637 | 50 |
| ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධිය | 248 | 2926 | 0 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය) බාහිර උපාධිය | 0 | 8906 | 306 |
| විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (සාමාන්‍ය) බාහිර උපාධිය | 572 | 9503 | 138 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | 661 | 12909 | 83 |
| **මුළු බාහිර උපාධි අපේක්ෂකයින්** | 1662 | 108189 | 749 |

**පශ්චාද් උපාධි අපේක්ෂකයින්**

| | | | |
|---|---|---|---|
| පශ්චාද් සහතික පත්‍ර පාඨමාලාව | 23 | 50 | 0 |
| පශ්චාද් ඩිප්ලෝමා පාඨමාලාව | 30 | 242 | 60 |
| පශ්චාද් උපාධි | 623 | 2047 | 243 |
| දර්ශනපති උපාධි | 26 | 178 | 20 |
| ආචාර්යය උපාධි | 45 | 175 | 30 |
| මුළු පශ්චාද් උපාධි | 747 | 2692 | 353 |
| **මුළු සිසුන් සංඛ්‍යාව** | **6036** | **124628** | **3946** |

# විදේශීය සිසුන්ගේ විස්තර

## විදේශීය ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2020

**(විදේශීය කාණ්ඩය යටතේ තෝරාගත් සිසුන්)**

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | බඳවාගත් වර්ෂය | ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය | දෙවන වසර | 2017/2018 | 3 | 0 | 3 |
| | ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය | සිව් වන වසර | 2015/2016 | 4 | 0 | 4 |
| වෛද්‍ය විද්‍යා පීඨය | එම්.බී.බී.එස්. | පළමු වසර | 2018/2019 | 1 | 0 | 1 |
| | | දෙවන වසර | 2017/2018 | 1 | 1 | 2 |
| | | පස් වන වසර | 2013/2014 | 0 | 1 | 1 |
| **මුළු සංඛ්‍යාව** | | | | **9** | **2** | **11** |

## විදේශීය පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් ලියාපදිංචිය - 2020

| අධ්‍යයන වැඩසටහන | රට | ලියාපදිංචි මුළු සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන |
| බෞද්ධ දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | ඉන්දියාව | 1 | 0 | 1 |
| | මියන්මාරය | 1 | 0 | 1 |
| | චීනය | 1 | 0 | 1 |
| පාලි භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිය | මියන්මාරය | 1 | 0 | 1 |
| **මුළු සංඛ්‍යාව** | | **4** | **0** | **4** |

## නව ශිෂ්‍ය ලියාපදිංචිය

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2018/2019 අධ්‍යයන වර්ෂයට අදාල ව බඳවා ගත් අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු

| පීඨය | බඳවා ගැනීම් එකඟ වූ සංඛ්‍යාව | ලියාපදිංචි සංඛ්‍යාව | අධ්‍යයන වර්ෂය ආරම්භ කරන දිනය |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 700 | 939 | 13.03.2020 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 785 | 781 | 13.01.2020 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1230 | 1216 | 04.12.2019 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 160 | 160 | 06.01.2020 |
| තාක්ෂණ පීඨය | 322 | 323 | 06.07.2020 |
| ඉන්ජිනේරු පීඨය | 120 | 120 | 05.02.2020 |
| සම සෞඛ්‍ය පීඨය | 90 | 88 | 17.02.2020 |
| **මුළු සංඛ්‍යාව** | **3407** | **3627** | |

### පසුගිය වසර හතර තුළ අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචි කිරීම් පිළිබඳ තොරතුරු

| අධ්‍යයන වර්ෂය | පීඨය | | | | | | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය (සම සෞඛ්‍ය විද්‍යා ඇතුළත්) | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | |
| 2015/2016 | 837 | 628 | 1215 | 221 | 321 | 121 | 3343 |
| 2016/2017 | 877 | 698 | 1213 | 231 | 321 | 120 | 3460 |
| 2017/2018 | 942 | 743 | 1223 | 235 | 318 | 121 | 3582 |
| 2018/2019 | 939 | 781 | 1216 | 248 | 323 | 120 | 3627 |


අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයින්ගේ නව ලියාපදිංචිය
2018/2019
939
781
1216
248
323
120
2017/2018
942
743
1223
235
318
121
2016/2017
877
698
1213
231
321
120
2015/2016
837
628
1215
221
321
121
0
500
1000
1500
2000
2500
3000
3500
4000
මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය
ව්‍යවහාරික විද්‍යා පීඨය
කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
වෛද්‍ය විද්‍යා පීඨය (සම සෞඛ්‍ය විද්‍යාවන්ද ඇතුළත්)
තාක්ෂණ පීඨය
ඉන්ජිනේරු පීඨය


ලියාපදිංචි වූ මුළු අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක සංඛ්‍යාව (2017 - 2020)
14000
12000
10000
8000
6000
4000
2000
0
12131
12608
12982
13758
2017
2018
2019
2020

## උපාධිධාරීන් පිළිබඳ තොරතුරු - 2020

| පීඨය | පළමු පෙළ | දෙවන පෙළ ඉහල | දෙවන පෙළ පහල | සමත් සාමාර්ථ | මුළු උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 52 | 439 | 258 | 135 | 884 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 44 | 184 | 110 | 207 | 545 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 148 | 354 | 254 | 444 | 1200 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 11 | 46 | 62 | 96 | 215 |
| මුළු සංඛ්‍යාව | 255 | 1023 | 684 | 882 | 2844 |



# ශිෂ්‍ය සුභසාධන පහසුකම්

## මහපොළ ශිෂ්‍යත්වය

**මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් - 2020 දෙසැම්බර් දක්වා**

කුසලතා ශිෂ්‍යත්ව සඳහා රු. 5050/- ගෙවනු ලබන අතර රු. 5000/- සාමාන්‍ය ශිෂ්‍යත්ව සඳහා ගෙවනු ලබයි. විශ්වවිද්‍යාල දායකත්වය රු. 2450/- පහත පරිදි දැක්වේ

| පීඨය | අධ්‍යයන වර්ෂය (ඇතුළත් වීම) | | | | | | මුළු ගෙවීම් (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|
| | 2012/2013 | 2013/2014 | 2014/2015 | 2015/2016 | 2016/2017 | 2017/2018 | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | නොමැත | නොමැත | 403 | 534 | 621 | 617 | 53,282,600.00 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | නොමැත | නොමැත | 101 | 240 | 287 | 302 | 22,948,400.00 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | නොමැත | නොමැත | 837 | 848 | 939 | 950 | 87,999,300.00 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 65 | 86 | 89 | 104 | 107 | 119 | 14,060,550.00 |
| ඉන්ජිනේරු පීඨය | නොමැත | නොමැත | 37 | 51 | 52 | 61 | 4,581,500.00 |
| තාක්ෂණ පීඨය | නොමැත | නොමැත | 210 | 214 | 247 | 253 | 18,186,350.00 |
| **මුළු එකතුව** | **65** | **86** | **1677** | **1991** | **2253** | **2302** | **201,058,700.00** |

## ශිෂ්‍යාධාර

වසර තුළ ශිෂ්‍යාධාර ගෙවීම පහත දැක්වේ (අධ්‍යයන වර්ෂය සහ පීඨ අනුව) 2020

| අධ්‍යයන වර්ෂය | මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | ඉන්ජිනේරු පීඨය | තාක්ෂණ පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වාර්ෂික වියදම් (රුපිය.) |
|---|---|---|---|---|---|---|---|
| 2013/2014 | නොමැත | නොමැත | 4 | නොමැත | නොමැත | නොමැත | 160,000.00 |
| 2014/2015 | 91 | නොමැත | 17 | නොමැත | නොමැත | නොමැත | 900,000.00 |
| 2015/2016 | 156 | 109 | 28 | නොමැත | 22 | 45 | 12,184,000.00 |
| 2016/2017 | 183 | 103 | 28 | 6 | 25 | 116 | 16,095,000.00 |
| 2017/2018 | 163 | 39 | 19 | 8 | 11 | 124 | 12,924,000.00 |
| 2018/2019 | 101 | 24 | 23 | 6 | 12 | 114 | 9,152,000.00 |
| **මුළු එකතුව** | **694** | **275** | **119** | **31** | **70** | **399** | **51,415,000.00** |
| අත්තිකාරම් ගෙවීම | | | | | | | |
| 2018/2019 | - | 751 | 81 | 56 | 209 | 330 | 12,684,000.00 |

## නේවාසිකාගාර පහසුකම්

විශ්වවිද්‍යාල සිසුන් සඳහා නේවාසිකාගාර ලබාදීම සහ සිසුන් සඳහා ලබාදී ඇති නවාතැන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| පීඨය | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 2107 | 489 | 2596 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 233 | 117 | 350 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 1724 | 309 | 2033 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 135 | 155 | 290 |
| සම සෞඛ්‍ය පීඨය | 187 | 38 | 225 |
| තාක්ෂණ පීඨය | 499 | 600 | 1099 |
| ඉන්ජිනේරු පීඨය | 52 | 188 | 240 |
| **එකතුව** | 4937 | 1896 | 6833 |

**විශ්වවිද්‍යාලයට හිමි නේවාසිකාගාර**

| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2096 | 1472 | 321 | 200 | 1099 | - | 5188 |

**කුලී පදනම මත ලබාගත් පහසුකම්**

| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | වෛද්‍ය විද්‍යා පීඨය | තාක්ෂණ පීඨය | ඉන්ජිනේරු පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 500 | 561 | 29 | 315 | - | 240 | 1645 |

නේවාසිකාගාරයේ සිටින මුළු සංඛ්‍යාව = 6833
මුළු සිසුන් සංඛ්‍යාව = 13758
ප්‍රතිශතයක් ලෙස = 50%

# කාර්ය මණ්ඩල විස්තර

## කාර්ය මණ්ඩල සාරාංශය (සේවා කාණ්ඩ ලෙස )2020 දෙසැම්බර් 31 දිනට

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | අනුමත සේවක ගණන | සැබෑ සේවක ගණන | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **1. ප්‍රාථමික මට්ටම** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | U - PL 1 | 576 | 321 | 56 |
| ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු | U - PL 2 | | 84 | |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | U - PL 3 | | 115 | |
| **2 ද්විතියික මට්ටම** | | | | |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U - MN 1 | 599 | 260 | 88 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික | U - MT 1 | | 107 | |
| සහකාර නිලධාරීන් - 2 කොටස | U - MN 2 | | 8 | |
| සහකාර නිලධාරීන් - 1 කොටස | U - MN 3 | | 19 | |
| මාණ්ඩලික සහකාර/ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සහකාර | U - MN 4 | | 117 | |
| **3 තෘතීයික මට්ටම** | | | | |
| තාවකාලික උපදේශක/ආදර්ශක/ උපදේශක/සහකාර. කථිකාචාර්ය / පර්යේෂණ සහකාර/කථිකාචාර්ය | Fixed | 388 | 343 | 45 |
| අධ්‍යයන සහාය - 2 කොටස | U -AS 1 | 41 | 20 | 21 |
| කනිෂ්ඨ විධායක / කළමනාකරුවන් | U -EX 1 | 30 | 26 | 4 |
| අධ්‍යයන සහාය - 1 කොටස | U -AS 2 | 37 | 27 | 10 |
| **4. ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| වෛද්‍ය නිලධාරී | U -MO 1 | 9 | 7 | 2 |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | U -MO 2 | 0 | 0 | 0 |
| මධ්‍යයම මට්ටමේ විධායකයින් | U -EX 2 | 25 | 25 | 0 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | U - EX 3 | 2 | 2 | 0 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති / කථිකාචාර්ය / කථිකාචාර්යය (පරිවාස) / සහකාර පුස්තකාලයාධිපති | U - AC 3 | 942 | 732 | 210 |
| සහකාර මහාචාර්යවරුන්/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති | U - AC 4 | | | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය / මහාචාර්ය / පුස්තකාලයාධිපති | U - AC 5 | | | |

## 2020 වර්ෂය තුළ අධ්‍යයන, පරිපාලන, අධ්‍යයන සහය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

**අධ්‍යයන, පරිපාලන, අනෙකුත් විධායක සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ විස්තර**

| අධ්‍යයන කාර්ය මණ්ඩලය | අනුමත සේවක සංඛ්‍යාව | වත්මන් සේවක සංඛ්‍යාව (2020 දෙසැම්බර් 31 දිනට) | | | | | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | | | කොන්ත්‍රාත් / තාවකාලික | | | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | 928 | 23 | 13 | 36 | | | | 188 |
| මහාචාර්යය | | 54 | 41 | 95 | | | | |
| සහාය මහාචාර්යය | | 4 | 4 | 8 | | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I වැනි ශ්‍රේණිය | | 84 | 96 | 180 | | | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II වැනි ශ්‍රේණිය | | 110 | 113 | 223 | 7 | 8 | 15 | |
| කථිකාචාර්ය | | 16 | 20 | 36 | 9 | 4 | 13 | |
| කථිකාචාර්ය (පරිවාස) | | 47 | 65 | 112 | | | | |
| තාවකාලික කථිකාචාර්ය | | | | | 10 | 12 | 22 | |
| තාවකාලික සහකාර. කථිකාචාර්ය / උපදේශක / ප්‍රදර්ශක / උපදේශක | 374 | | | | 91 | 225 | 316 | 58 |
| පුස්තකාලයාධිපති | 1 | | 1 | 1 | | | | |
| නියෝජ්‍ය පුස්තකාලයාධිපති | 1 | | 1 | 1 | | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති I ශ්‍රේණිය | 12 | | 3 | 3 | | | | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති II ශ්‍රේණිය | | 1 | | 1 | | | | |
| සහකාර පුස්තකාලයාධිපති | | 3 | 5 | 8 | | | | |
| තාවකාලික පර්යේෂණ සහකාර | 14 | | | | | 5 | 5 | 9 |
| **අධ්‍යයන කාර්ය මණ්ඩල උප එකතුව** | **1330** | **342** | **362** | **704** | **117** | **254** | **371** | **255** |
| **පරිපාලන නිලධාරීන්** | | | | | | | | |
| ලේඛකාධිකාරි | 1 | 1 | | 1 | | | | |
| මූල්‍යාධිකාරි | 1 | | 1 | 1 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 20 | 2 | 3 | 5 | | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | | 1 | 3 | 4 | | 1 | 1 | |
| සහකාර ලේඛකාධිකාරි | | | 9 | 9 | | | 0 | |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | 14 | | 2 | 2 | | | | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | | 3 | 4 | 7 | 1 | | 1 | |
| සහකාර මූල්‍යාධිකාරි | | | 4 | 4 | | | | |
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | 1 | 1 | | 1 | | | | |
| නියෝජ්‍ය සහකාර ලේඛකාධිකාරි/ නීති | 1 | | 1 | 1 | | | | |
| සහකාර ලේඛකාධිකාරි පුස්තකාල සේවා | 1 | | 1 | 1 | | | | |
| **පරිපාලන කාර්ය මණ්ඩල උප එකතුව** | **39** | **8** | **28** | **36** | **1** | **2** | **3** | **0** |
| **අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය** | | | | | | | | |
| තොරතුරු පද්ධති කළමනාකරු | 1 | 1 | | 1 | | | | |
| අධ්‍යක්ෂ / ශාරීරික අධ්‍යාපන | 1 | | 1 | 1 | | | | |
| ව්‍යාපෘති කළමනාකරු | 1 | | | 0 | 1 | | 1 | |
| ප්‍රධාන විනයාධිකාරී | 1 | | | 0 | | | | 1 |
| නියෝජ්‍ය ප්‍රධාන විනයාධිකාරි | 1 | | | 0 | | | | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිලධාරි | 1 | | | 0 | 1 | | 1 | 0 |
| වැඩ ඉන්ජිනේරු | 1 | 1 | | 1 | | | | |
| වැඩබිම් ඉන්ජිනේරු | 2 | | 1 | 1 | | | | 1 |
| උද්‍යාන පාලක | 2 | 1 | | 1 | 1 | | 1 | 0 |
| කෞතුකාගාර පාලක | 2 | 1 | 1 | 2 | | | | |
| සංඛ්‍යාලේඛන නිලධාරි | 2 | 1 | | 1 | | | | 1 |
| **අනෙකුත් විධායක කාර්ය මණ්ඩල උප එකතුව** | **15** | **5** | **3** | **8** | **3** | **0** | **3** | **4** |
| **වෛද්‍ය නිලධාරීන්** | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී / වෛද්‍ය නිලධාරී | 8 | | 2 | 2 | 1 | 3 | 4 | 2 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 1 | | 1 | 1 | | | | |
| **වෛද්‍ය නිලධාරීන්ගේ උප එකතුව** | **9** | **0** | **3** | **3** | **1** | **3** | **4** | **3** |
| **අධ්‍යයන සහයක** | | | | | | | | |
| උපදේශක (පරිගණක තාක්ෂණය) - I ශ්‍රේණිය | 19 | 9 | | 9 | | | | 4 |
| උපදේශක (පරිගණක තාක්ෂණය) - II ශ්‍රේණිය | | 4 | 2 | 6 | | | | |
| සහකාර සංඛ්‍යාලේඛනඥ - I ශ්‍රේණිය | 1 | 1 | | 1 | | | | |
| සහකාර ජාල කළමනාකරු | 6 | 5 | | 5 | | | 0 | 1 |
| සමාජ වැඩ පිළිබඳ උපදේශක | 1 | 1 | | 1 | | | | |
| වෘත්තීය මාර්ගෝපදේශ උපදේශකවරුන් | 4 | 1 | 1 | 2 | | | | 2 |
| වැඩ සටහන් සහ පද්ධති විශ්ලේෂක - II ශ්‍රේණිය | 3 | 1 | | 1 | | | | 2 |
| ජ්‍යෙෂ්ඨ උපදේශක - ඉංග්‍රීසි භාෂා | 1 | | 1 | 1 | | | | |
| උපදේශක - ඉංග්‍රීසි භාෂා | 21 | 1 | 1 | 2 | | | | 19 |
| ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - I ශ්‍රේණිය | 7 | | | 0 | | | | 0 |
| ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක - II ශ්‍රේණිය | | 4 | 1 | 5 | 2 | | 2 | |
| උපදේශක | 3 | 2 | 1 | 3 | | | | |
| ක්‍රීඩාගාර උපදේශක | 2 | | | 0 | 1 | | 1 | 1 |
| පරිගණක වැඩසටහන්කරු | 8 | 3 | 1 | 4 | 1 | 1 | 2 | 2 |
| විද්‍යාත්මක සහකාර - II ශ්‍රේණිය | 2 | 1 | 1 | 2 | | | | 0 |
| **අධ්‍යයන සහයක කාර්යය මණ්ඩල උප එකතුව** | **78** | **33** | **9** | **42** | **4** | **1** | **5** | **31** |
| **මුළු එකතුව** | **1471** | **388** | **405** | **793** | **126** | **260** | **386** | **293** |

අනධ්‍යයන සේවක කාර්යය මණ්ඩලය

| තනතුර | | අනුමත සේවක සංඛ්‍යාව | 2020.12.31 දිනට සේවයේ නියුතු | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | | | සේවා පැවරුම්/ කොන්ත්‍රාත් | | | පුරප්පාඩු |
| | | | පිරිමි | ගැහැණු | එකතුව | පිරිමි | ගැහැණු | ගැහැණු | |
| 1 | විනයාරක්ෂක | 7 | 7 | | 7 | | | | 0 |
| 2 | පූර්ණ කාලීන උප ශාලාධිපති | 14 | 5 | 7 | 12 | | | 0 | 2 |
| 3 | උපාධිධාරී භාෂා පරිවර්තක | 1 | | | 0 | | | | 1 |
| 4 | නියෝජ්‍ය ප්‍රධාන ආරක්ෂක නිලධාරී | 1 | | | 0 | | | | 1 |
| 5 | වැඩ අධිකාරී | 3 | | | 0 | | | | 3 |
| 6 | වැඩ අධිකාරී (සිවිල්) | 6 | 3 | | 3 | | | | 3 |
| 7 | වැඩ අධිකාරී (විදුලි) | 1 | 1 | | 1 | | | | 0 |
| 8 | වැඩ අධිකාරී (භූ දර්ශන) | 1 | 1 | | 1 | | | | 0 |
| 9 | විගණන සහකාර | 5 | 1 | 4 | 5 | | | | 0 |
| 10 | කළමනාකරණ සහකාර | 303 | 73 | 220 | 293 | | | 0 | 10 |
| 11 | කළමනාකරණ සහකාර (පොත් තබන්නා) | 8 | 5 | 3 | 8 | | | | 0 |
| 12 | කළමනාකරණ සහකාර (සරප්) | 5 | 1 | 1 | 2 | | | | 3 |
| 13 | කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | 8 | 5 | | 5 | | | | 3 |
| 14 | දුරකථන යන්ත්‍ර ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී | 2 | | 2 | 2 | | | | 0 |
| 15 | පුස්තකාල තොරතුරු සහකාර | 34 | 15 | 15 | 30 | | | | 4 |
| 16 | ආරක්ෂක පරීක්ෂක | 5 | 4 | | 4 | | | | 1 |
| 17 | පිහිණුම් තටාක අධීක්ෂක | 1 | | | 0 | | | | 1 |
| 18 | ශිල්පීය නිදර්ශක (යාන්ත්‍රික) | 1 | | | 0 | | | | 1 |
| 19 | ශිල්පීය නිදර්ශක (සවි කිරීම්) | 1 | | | 0 | | | | 1 |
| 20 | ශිල්පීය නිදර්ශක (විදුලි) | 1 | | | 0 | | | | 1 |
| 21 | වැඩ අධීක්ෂක (සිවිල්) | 5 | 5 | | 5 | | | | 0 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 22 | වැඩ අධීක්ෂක (විදුලි) | 3 | 1 | | 1 | | | | 2 |
| 23 | වැඩ අධීක්ෂක (භූ දර්ශ) | 1 | 1 | | 1 | | | | 0 |
| 24 | ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික නිලධාරී | 5 | 1 | | 1 | | | | 4 |
| 25 | දන්ත හෙද නිලධාරි | 1 | | 1 | 1 | | | | 0 |
| 26 | සැලසුම් ශිල්පි | 4 | 1 | 1 | 2 | | | | 2 |
| 27 | හෙද නිලධාරි | 11 | 1 | 5 | 6 | | 1 | 1 | 4 |
| 28 | ඖෂධවේදි | 4 | 3 | 1 | 4 | | | | 0 |
| 29 | භෞත චිකිත්සක | 1 | | | 0 | | | | 1 |
| 30 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2 | 2 | | 2 | | | | 0 |
| 31 | කාර්මික නිලධාරි | 124 | 54 | 54 | 108 | 7 | 4 | 11 | 5 |
| 32 | කාර්මික නිලධාරි (තොරතුරු තාක්ෂණ) | 21 | 1 | | 1 | | 1 | 1 | 19 |
| 33 | කාර්මික නිලධාරි (සිවිල්) | 4 | | 1 | 1 | | | | 3 |
| 34 | කාර්මික නිලධාරි (විදුලි) | 3 | 3 | | 3 | | | | 0 |
| 35 | කාර්මික නිලධාරි (යාන්ත්‍රික | 4 | 1 | 1 | 2 | | | | 2 |
| 36 | කාර්මික නිලධාරි (X-Ray/Dexa Scan) | 1 | | | 0 | | | | 1 |
| 37 | රියදුරු | 41 | 38 | | 38 | | | | 3 |
| 38 | පොත් බඳින්නා | 2 | 2 | | 2 | | | | 0 |
| 39 | විදුලි කාර්මික | 9 | 9 | | 9 | | | | 0 |
| 40 | වඩු කාර්මික | 8 | 7 | | 7 | | | | 1 |
| 41 | සවි කරන්නා (Fitter) | 1 | | | 0 | | | | 1 |
| 42 | යාන්ත්‍රිකයා | 1 | | | 0 | | | | 1 |
| 43 | පෙදරේරු | 8 | 8 | | 8 | | | | 0 |
| 44 | යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | | 0 |
| 45 | ජල නල කාර්මික | 8 | 8 | | 7 | 1 | | 1 | 0 |
| 46 | ඇලුමිනියම් ෆැබ්රික්ටර් | 1 | | | 0 | | | | 1 |
| 47 | වෑද්දුම්කරු | 1 | | | 0 | | | | 1 |
| 48 | පෑස්සුම්කරු | 2 | 1 | | 1 | | | | 1 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 49 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | | 0 |
| 50 | රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | | 0 |
| 51 | වායු උත්පාදක ක්‍රියාකරු | 1 | | | 0 | | | | 1 |
| 52 | විද්‍යාගාර සහයක | 102 | 75 | 24 | 99 | | | 0 | 3 |
| 53 | විද්‍යාගාර සහයක (ඇදීම්) | 1 | | | 0 | | | | 1 |
| 54 | සෞඛ්‍ය සේවා උපස්ථායක | 2 | | 1 | 1 | | | | 1 |
| 55 | ජීමනීසියම් සහයක | 2 | | | 0 | 1 | | 1 | 1 |
| 56 | පට්ටල යන්ත්‍ර ක්‍රියාකරු | 1 | | | 0 | | | | 1 |
| 57 | පින්තාරුකරු | 3 | 2 | | 2 | | | | 1 |
| 58 | පොලිෂ් කරන්නා | 2 | 2 | | 2 | | | | 0 |
| 59 | පොම්ප ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | | 0 |
| 60 | එන්ජින් හා පොම්ප ක්‍රියාකරු | 1 | 1 | | 1 | | | | 0 |
| 61 | නිදර්ශක එකතු කරන්නා | 2 | | | 0 | 1 | | 1 | 1 |
| 62 | නේවාසිකාගාර භාරකරු | 2 | 1 | | 1 | | | | 1 |
| 63 | බයිසිකල් පණිඩ්ඩකරු | 1 | | | 0 | | | | 1 |
| 64 | ගාඩ්නර් | 2 | 2 | | 2 | | | | 0 |
| 65 | Groundsman | 1 | 1 | | 1 | | | | 0 |
| 66 | සෞඛ්‍ය සේවා කම්කරු | 18 | 11 | | 11 | | | | 7 |
| 67 | වැඩ සහයක | 220 | 205 | 14 | 219 | | | 0 | 1 |
| 68 | මරණ පරීක්ෂක කම්කරු | 2 | 1 | | 1 | | | | 1 |
| 69 | කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු | 8 | 8 | | 8 | | | | 0 |
| 70 | පුස්තකාල සේවක | 24 | 10 | 4 | 14 | | 2 | 2 | 8 |
| 71 | ලොරි පවිත්‍රක | 2 | 2 | | 2 | | | | 0 |
| 72 | තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 1 | | | 0 | | | | 1 |
| 73 | ආරක්ෂක නිලධාරී | 88 | 53 | | 53 | 17 | | 17 | 18 |
| 74 | ගබඩා කරු | 2 | 1 | | 1 | | | | 1 |
| 75 | පිහිනුම් තටාක වැඩ සහයක | 2 | 2 | | 2 | | | | 0 |
| **එකතුව** | | **1178** | **649** | **359** | **1007** | **27** | **8** | **35** | **136** |

## පීඨ අනුව ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය - **2020**

| පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් | මහාචාර්යවරුන් | සහකාර මහාචාර්යවරු | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය | කථිකාචාර්යය | ආධුනික කථිකාචාර්යය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | 6 | 25 | **4** | 50 | 25 | 9 | 20 | 139 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 11 | 25 | | 29 | 51 | 10 | 18 | 144 |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | 11 | 17 | 1 | 62 | 53 | 9 | 34 | 187 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 8 | 26 | 3 | 29 | 24 | 4 | 25 | 119 |
| තාක්ෂණ පීඨය | | 1 | | 5 | 39 | 4 | 5 | 54 |
| ඉන්ජිනේරු පීඨය | | | | 1 | 15 | | | 16 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | | 1 | | 4 | 16 | | 10 | 31 |
| **එකතුව** | **36** | **95** | 8 | **180** | **223** | **36** | **112** | **690** |




## විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සුදුසුකම්: 2018 - 2020

| වර්ෂය | පළමු උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා ලාභීන්. | පශ්චාද් උපාධි | දර්ශනපති උපාධි | MD/MS උපාධි | ආචාර්යය උපාධි ලාභීන් | එකතු |
|---|---|---|---|---|---|---|
| 2018 | 74 | 147 | 42 | 61 | 296 | 620 |
| 2019 | 87 | 147 | 42 | 56 | 309 | 641 |
| 2020 | 73 | 149 | 43 | 63 | 361 | 689 |


අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සුදුසුකම් 2018 -2020
400
350
300
250
200
150
100
50
0
පළමු උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා
පශ්චාද් උපාධි
දර්ශනපති උපාධි
MD/MS
අවාර්යය උපාධි
2018
2019
2020


අවාර්යය උපාධි සංඛ්‍යාව මුළු කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස
60%
50%
40%
30%
20%
10%
0%
47.74%
48.21%
52.39%
2018
2019
2020

## පොදු කළමනාකරණය

### 2020 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ නිලධාරි මණ්ඩලය

| | |
|---|---|
| කුලපති | ඉත්තෑපානේ ධම්මාලංකාර මහ නායක නාහිමි |
| උප කුලපති | ජ්‍යෙෂඨ මහාචාර්යය . එස්.එස්.එල්.ඩබ්. ලියනගේ මහතා |
| **පීඨාධිපතින්** | |
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්යය එල්.කරුණානායක මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | මහාචාර්යය පී.ඩී.නිමල් මහතා (29.05.2020 දින සිට මේ දක්වා)<br>මහාචාර්යය යූ. අනුර කුමාර මහතා (28.05.2020 දක්වා) |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්යය ඒ.ඒ. පතිරණ මහතා (17.11.2020 සිට මේ දක්වා)<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය (16.11.2020 දක්වා) |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පද්මලාල් මහතා |
| තාක්ෂණ පීඨය | මහාචාර්යය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය |
| ඉන්ජිනේරු පීඨය | ආචාර්යය කේ.එම්.සී. කොන්තසිංහ මහතා |
| සම සෞඛ්‍ය පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ඩී.එම්.එස්. ෆර්නැන්ඩු මහත්මිය |
| **ලේඛකාධිකාරි** | ඩබ්ලිව්.එම්.ආර්.ඒ.බී. වැලිවිට මහතා (30.11.2020 සිට මේ දක්වා)<br>කේ.ජී.බ්‍රිටෝ මහතා (28.11.2020 දක්වා) |
| **පුස්තකාලාධිපති** | ඩබ්ලිව්.ඩී.ඒ.එන්.ඩි. විජයසුන්දර මහත්මිය |
| **මූල්‍යාධිකාරි** | කේ.ටී.සී.ප්‍රියංගනි මහත්මිය |
| **විනයාරක්ෂක** | ඒ.ආර්.පී.සී.උදයකුමාර මහතා |

**පීඨයන්හි නියෝජ්‍ය විනයාරක්ෂකවරු**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | පූජ්‍ය එලමල්දෙනියේ සාරානන්ද හිමි.<br>ආචාර්යය ආශා නිමාලි ෆර්නැන්ඩු මහත්මිය<br>ආචාර්යය බී.ඒ.එස්.සී.කුමාර<br>ආචාර්යය ඒ.එම්.එන්.ඩබ්ලිව්. මෙනඩිස් |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්යය එන්.එම්.එස්.සිරිමුතු<br>ආචාර්යය පී.ආර්.එස්. ද සිල්වා<br>ආචාර්යය පී.කේ.පී. පෙරේරා<br>අචාර්යය පී.කේ.ඩී.ඩී. පිටිගල<br>ආචාර්යය ආර්.ආර්.එම්.කේ.පී රණතුංගෙ |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | මහාචාර්ය ටී.එස්.එම්. අමරසේන<br>ආචාර්යය යූ.කේ. තල්ගස්පිටිය මහත්මිය<br>ආචාර්යය එම්.එම්.ජී. තරංගනි මහත්මිය<br>අචාර්යය පී.සී. කළුතන්ත්‍රි<br>සී.ආර්. පිරිස් මයා |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්යය පී.පී. ආර්. පෙරේරා<br>ආචාර්යය ඩී.එම්.බී.ටී දිසානායක |
| තාක්ෂණ පීඨය | ආචාර්යය එන්. ස්කන්දකුමාර්<br>ආචාර්යය ගයා ජයකොඩි මහත්මිය<br>අචාර්යය සුරංග රාජපක්ෂ |
| ඉන්ජිනේරු පීඨය | ආචාර්යය චමිත ද අල්විස්<br>අචාර්යය ජී.එන් සමරසේකර මහත්මිය |
| සම සෞඛ්‍ය පීඨය | ආචාර්යය ඒ.ඒ.ටී.ඩි .අමරසේකර<br>අචාර්යය ජී.යූ.එස්. විජේසේකර |

# පරිපාලන ව්‍යුහය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය




PIM - පශ්චාද් උපාධි අධ්‍යයන ආයතනය

මානව ශාස්ත්‍ර -මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

ව්‍යවහාරික - ව්‍යවහාරික විද්‍යා පීඨය

කළමනා -කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

වෛද්‍ය -වෛද්‍ය විද්‍යා පීඨය

පශ්චාද් - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

තාක්ෂණ -තාක්ෂණ පීඨය

ඉංජිනේරු - ඉංජිනේරු පීඨය

සම සෞඛ්‍ය - සම සෞඛ්‍ය විද්‍යා පීඨය

නි.ලේ - නියෝජ්‍ය ලේඛකාධිකාරී

ජ්‍යෙ.ස.ලේ. - ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

ස.ලේ - සහකාර ලේඛකාධිකාරී

නි.මු. - නියෝජ්‍ය මූල්‍යාධිකාරී

ජ්‍යෙ.ස.මු - ජ්‍යේෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

ස.මු - සහකාර මූල්‍යාධිකාරී

ජ්‍යෙ.ස.පු -ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී

ස.පු -සහකාර පුස්තකාලයාධිකාරී

පි/ගැ - පිරිමි/ගැහැණු

IQAU - අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය

# විශ්වවිද්‍යාලයේ පාලන බල මණ්ඩලය

**පාලක සභාව**

1985 අංක 7 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනත මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ VII වැනි වගන්තියේ 44 වැනි ඡේදය යටතේ විශ්වවිද්‍යාල සභාව 2020 වර්ෂයේදී පහත සඳහන් සමාජිකයිනගෙන් සමන්විත විය.

**නිල බලයන්**

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.එස්.එල්.ඩබ්ලිව්. ලියනගේ |
| ලේඛකාධිකාරි (ලේකම්) | ඩබ්ලිව්.එම්.ආර්.ඒ.බී. වැලිවිට මහතා (30.11.2020 සිට මේ දක්වා) |
| | කේ.ජී.බ්‍රිටෝ මහතා (28.11.2020 දක්වා) |

**පීඨාධිපතීන්**

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය | මහාචාර්යය එස්.සී.බී.හීන්කෙන්ද මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්යය එල්.කරුණානායක මහතා |
| කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය | මහාචාර්යය පී.ඩී.නිමල් මහතා (29.05.2020 දින සිට මේ දක්වා)<br>මහාචාර්යය යූ. අනුර කුමාර මහතා (28.05.2020 දක්වා) |
| වෛද්‍ය විද්‍යා පීඨය | මහාචාර්යය ඒ.ඒ. පතිරණ මහතා (17.11.2020 සිට මේ දක්වා)<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී.යසවර්ධන මහත්මිය (16.11.2020 දක්වා) |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.එම්.පද්මලාල් මහතා |
| තාක්ෂණ පීඨය | මහාචාර්යය ඒ.එච්.එල්.ආර්. නිල්මිණි මහත්මිය |
| ඉන්ජිනේරු පීඨය | ආචාර්යය කේ.එම්.සී. කොන්තසිංහ මහතා |
| සම සෞඛ්‍ය පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ඩී.එම්.එස්. ෆර්නැන්ඩු මහත්මිය |

**සනාථන සභා නියෝජිතයින්**

1. මහාචාර්යය මුදිත විදානපතිරණ
2. ආචාර්යය පී.ජේ.කුමාරසිංහ
3. මහාචාර්යය එච්.එච්.ඩී.එන් ඔපාත (2020 පෙබරවාරි මස සිට)

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද පාලක සභා සාමාජිකයින්**

1. පූජ්‍ය කිරින්දේ අස්සජි හිමි
2. ආචාර්යය පූජ්‍ය බොරලන්දේ සෝභිත හිමි
3. මහාචාර්යය සුනිල් ආරියරත්න මහතා
4. ආචාර්යය ඒ.එම් මුබාරක් මහතා
5. අශෝක හෙට්ටිගොඩ මහතා
6. එච්. ටී. කමල් පත්මසිරි මහතා
7. නීතිඥ උපාලි සේනාරත්න මහතා (2020.06.11 දක්වා)
8. ඩබ්.කේ.එච්.වෙගපිටිය මහතා
9. සුජීව රාජපක්ෂ මහතා
10. ඒ.ඒ. ආරියරත්න මහතා
11. රෝලන්ඩ් මුණසිංහ මහතා (2020.07.09 සිට)
12. ශ්‍රී රණසිංහ මහතා
13. මහින්ද රණසිංහ මහතා

**පාලක සභාවේ අනු කමිටු**

**I.** විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුව

**II.** නිවාඩු සහ ප්‍රදාන කමිටුව

**III.** විගණන හා කළමනාකරණ කමිටුව

**IV.** සැලසුම් සහ සංවර්ධන කමිටුව

**සනාතන සභාව**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 46 වැනි ඡේදය යටතේ පත්කළ සාමාජිකයන්ගෙන් සනාථන සභාව සමන්විත වේ

**සනාතන සභාවේ අනු කමිටු**

**(i)** බාහිර උපාධි කමිටුව

**(ii)** පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව

**(iii)** පරිගණක කමිටුව

## 2020 වර්ෂයේ පැවති රැස්වීම්

පාලක සභාව, සනාථන සභාව ඇතුළු නම් කරන ලද කමිටු ඇතුළු අනෙකුත් බලධාරීන් 2020 වර්ෂය තුළ පහත පරිදි රැස්වී ඇත.

| | රැස්වීම් ගණන |
|---|---|
| පාලක සභා | 10 |
| සනාතන සභා | 13 |
| මුදල් හා ප්‍රාග්ධන කිමිටු | 10 |
| නිවාඩු හා ප්‍රදාන කමිටු | 12 |
| පර්යේෂණ සභා කමිටුව | 10 |
| බාහිර විභාග කමිටුව | 07 |
| සැලසුම් සහ සංවර්ධන කමිටුව | 06 |
| විගණන සහ කළමනාකරණ කමිටුව | 04 |

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයන පීඨ

විශ්වවිද්‍යාලය පහත සඳහන් පීඨ අටෙන් යුතු වේ.

1. මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය
2. ව්‍යවහාරික විද්‍යා පීඨය
3. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය
4. වෛද්‍ය විද්‍යා පීඨය
5. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
6. තාක්ෂණ පීඨය
7. ඉන්ජිනේරු පීඨය
8. සම සෞඛ්‍ය පීඨය

## මානව ශාස්ත්‍ර හා සාමාජයීය විද්‍යා පීඨය



1959 ජනවාරි 1 වැනි දින මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනෙහි ආරම්භ වූ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය ආරම්භ විය. පසුව පීඨය වර්තමාන ගංගොඩවිල පරිශ්‍රයට ගෙන යන ලදී.

මේ වනවිට ශාස්ත්‍ර පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය නමින් ස්ථාපිත වී ඇත.

රටේ සංස්කෘතික උරුමය හා ප්‍රජා සංවර්ධන හා ජාතියේ පුනර්ජීවනය, දැනුම බෙදා හැරීම මගින් වැඩි දියුණු කිරීම ශාස්ත්‍ර පීඨයේ වගකීමයි.

වාර්ෂිකව සිසුන් 1000 ක් පමණ ඇතුළත් කර ගන්නා අතර විද්‍යාවේදී ගෞරව උපාධිය,ශාස්ත්‍රවේදී උපාධිය හා ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය සඳහා විෂයයන් 29 ක අධ්‍යයන කටයුතු සිදු කෙරේ. පීඨය අධ්‍යයන දෙපාර්තමේන්තු දහසයකින් සමන්විත වේ.

**පීඨාධිපති**

**මහාචාර්යය එස්.සී.බී. හීන්කෙන්ද මහතා**

**දෙපාර්තමේන්තුව**

**දෙපාර්තමේන්තු ප්‍රධාන**

1. සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය — අචාර්යය කුසුමලතා ලංකාමුල්ල මහත්මිය.
2. ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය කේ.එම්.ඇලෙක්සැන්ඩර් මහතා.
3. භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය — මහාචාර්යය ආර්.එම්.කේ. රත්නායක මහතා (05.09.2020 දක්වා)

ආචාර්යය එම්.ඒ.එස්. විජේසිංහ මහතා 06.09.2020 සිට

| | |
|---|---|
| 4. සමාජවිද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එම්.ටී. සමරකෝන් මහතා |
| 5. මානව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එච්.ඩී.වයි.ඩී.ජයතිලක මහත්මිය |
| 6. භාෂා , සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසංගික කලා අධ්‍යයනාංශය | ආචාර්යය ඩබ්ලිව්.බී.ඒ. විතාරණ |
| 7. ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්යය බී.ඩබ්ලිව්. ආර් දමයන්ති මහත්මිය |
| 8. සමාජ සංඛ්‍යාන අධ්‍යයනාංශය | ඩී.පී.කේ. මානෙල් මහත්මිය |
| 9. ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය | ආචාර්යය ආර්.එම්.සී. ජයතිලක මහත්මිය |
| 10. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය | මහාචාර්යය එම්.ඩී.ඩී.අයි. ගුණතිලක මහතා |
| 11. දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ඩබ්ලිව්.ඒ.සී. පෙරේරා ම මහතා |
| 12. දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය | පී.එල්.ටී. පුරසිංහ මහතා ( 23.11.2020 දක්වා)<br>වී.එස්. සූරියබණ්ඩාර මහත්මිය ( 24.11.2020 සිට) |
| 13. අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය | ආචාර්යය ආර්.එන් සුනිල් මහතා |
| 14. ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය | පී.බී.එස්.එල්. පුෂ්පකුමාර මහතා |
| 15. සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්යය ප්‍රදීප් රත්නායක මහතා |
| 16. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන අධ්‍යයනාංශය | අචාර්යය බී.ඩබ්ලිව්.ආර්. දමයන්ති මහත්මිය |

**2020 වර්ෂයේදී පිහිටුවන ලද නව අධ්‍යයනාංශ**

- සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණ අධ්‍යයනාංශය
- තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ අධ්‍යයනාංශය

## පීඨය විසින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා

**උපාධි**

01. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය
02. ශාස්ත්‍රවේදී පුරාවිද්‍යා ගෞරව උපාධිය
03. ශාස්ත්‍රවේදී ඉතිහාසය ගෞරව උපාධිය
04. ශාස්ත්‍රවේදී බෞද්ධ ශිෂ්ටාචාරය ගෞරව උපාධිය
05. ශාස්ත්‍රවේදී බෞද්ධ දර්ශනය ගෞරව උපාධිය
06. ශාස්ත්‍රවේදී දර්ශනය පිළිබඳ ගෞරව උපාධිය
07. ශාස්ත්‍රවේදී මනෝවිද්‍යාව ගෞරව උපාධිය
08. ශාස්ත්‍රවේදී පාලි ගෞරව උපාධිය
09. ශාස්ත්‍රවේදී හින්දි ගෞරව උපාධිය
10. ශාස්ත්‍රවේදී සංස්කෘත ගෞරව උපාධිය
11. ශාස්ත්‍රවේදී සංගීතය ගෞරව උපාධිය
12. ශාස්ත්‍රවේදී නර්ථනය ගෞරව උපාධිය

13. ශාස්ත්‍රවේදී ආර්ථික විද්‍යා ගෞරව උපාධිය
14. ශාස්ත්‍රවේදී සමාජවිද්‍යා ගෞරව උපාධිය
15. ශාස්ත්‍රවේදී අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය ගෞරව උපාධිය
16. ශාස්ත්‍රවේදී මානාවවිද්‍යා ගෞරව උපාධිය
17. ශාස්ත්‍රවේදී සිංහල ගෞරව උපාධිය
18. ශාස්ත්‍රවේදී ජන සන්නිවේදනය ගෞරව උපාධිය
19. ශාස්ත්‍රවේදී දේශපාලන විද්‍යා ගෞරව උපාධිය
20. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි ගෞරව උපාධිය
21. ශාස්ත්‍රවේදී සමාජ සංඛ්‍යානය ගෞරව උපාධිය
22. ශාස්ත්‍රවේදී ව්‍යාපාර සංඛ්‍යානය ගෞරව උපාධිය
23. ශාස්ත්‍රවේදී භූගෝලවිද්‍යා ගෞරව උපාධිය
24. ශාස්ත්‍රවේදී දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම ගෞරව උපාධිය
25. තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය
26. විද්‍යාවේදී තොරතුරු තාක්ෂණ ගෞරව උපාධිය
27. විද්‍යාවේදී භූ අවකාශ තාක්ෂණ ගෞරව උපාධිය
29. ශාස්ත්‍රවේදී සමාජ වැඩ ගෞරව උපාධිය

**පශ්චාද් ඩිප්ලෝමා පාඨමාලා**

01. සමාජ සංඛ්‍යානය/ව්‍යාපාර සංඛ්‍යානය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව
02. අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව

**ඩිප්ලෝමා පාඨමාලා**

01. ලේඛකත්ව හා ජනසන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
02. අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා
03. ග්‍රාමීය සංවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව
04. භූගෝලීය අන්තර්ජාතික සබඳතා පිළිබඳ ඩිප්ලෝමාව
05. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලාව
06. භූගෝලීය තොරතුරු පද්ධති හා දුරස්ථ සංවේදය පිළිබඳ ඩිප්ලෝමාව
07. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමාව
08. සමාජවිද්‍යා පිළිබඳ ඩිප්ලෝමාව
09. සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණ
10. ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාව
11. සමාජ වැඩ පිළිබඳ පාඨමාලාව

**සහතික පත්‍ර පාඨමාලා**

**01.** ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
**02.** අංගම්පොර පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
**03.** සංචාරක කර්මාන්තය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

## අධ්‍යාපනය හා සංවර්ධනය

- 2020 වර්ෂයේදී හඳුන්වාදෙන ලද උපාධි පාඨමාලා
  - ශාස්ත්‍රවේදී බෞද්ධ උරුමයන් හා සංචාරක කර්මාන්තය පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව
  - ශාස්ත්‍රවේදී මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධි පාඨමාලාව

- ශාස්ත්‍රවේදී භූ-අවකාශීය තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය
- ශාස්ත්‍රවේදී දර්ශනය ගෞරව උපාධිය
- ශාස්ත්‍රවේදී මනෝවිද්‍යාව ගෞරව උපාධිය
- ශාස්ත්‍රවේදී සමාජ වැඩ ගෞරව උපාධිය
- විද්‍යාවේදී තොරතුරු සහ නිර්මාණාත්මක තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය

- **උපාධි පාඨමාලා වල සියලුම විෂයයන් විෂයමාලා සංශෝධනය.**

  - වැඩ ලෝකයට අවශ්‍ය මෘදු කුසලතා සමඟ සමාජ-සංවේදී කුසලතා ඉගෙනීමේ අත්දැකීමට සමායෝජනය කිරීම සංශෝධනයේ ප්‍රධාන අරමුණයි.
  - වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (PLO), සමෝධානය ඉගෙනුම් ප්‍රතිඵල (ILO) ඒකාබද්ධ කිරීම සහ ඉගෙනුම්, ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම වැඩිදියුණු කිරීම.
  - ඉහත නිර්ණායක ඇතුළත් කරමින් 2020 වර්ෂයේදී උපාධි වැඩසටහන්වල සියලුම විෂයමාලා ඒ අනුව සංශෝධනය කරන ලදී.

- **සාමාන්‍ය පාඨමාලා සංශෝධනය: භාෂා සහ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම.**
  - ඉංග්‍රීසි භාෂාව: සම්මාන වටිනාකම් ලකුණු හයේ සිට ලකුණු නවය දක්වා වැඩි කිරීම.

- **නව සාමාන්‍ය පාඨමාලාව හඳුන්වා දීම:**

  - GENG 0098.1 ආයතනික අවබෝධය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය.

- **2020 දී හඳුන්වා දුන් පීඨාධිපති ලැයිස්තුගත සම්මාන**

  - සිසුන් විසින් දක්වන ලද ලද ඉහළම මට්ටමේ අධ්‍යයන විශිෂ්ටත්වය ඇගයීම සඳහා පීඨාධිපතිගේ ලැයිස්තු සම්මානය/විශිෂ්ඨතා සම්මානය පිරිනමනු ලැබේ.

- **2020 දී පිහිටුවන ලද තත්ත්ව සහතික ඒකකය**
  - ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (වි.ප්‍ර.කොා.ස) විසින් ස්ථාපිත කර ඇති තත්ත්ව සහතික ක්‍රමවේදයට අනුකූලව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ තත්ත්ව සහතික ඒකකය ස්ථාපිත කර ඇත.

- **ඊ බැංකු ශිෂ්‍ය හැඳුනුම්පත**

  - 2020 අගෝස්තු 31 වන දින මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨයේ සිසුන්ට ඩිජිටල් බැංකුකරණ නව පද්ධතියක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. මහජන බැංකුව සමඟ එක්ව ක්‍රියාත්මක කරන ලද මෙම නව ක්‍රමය අන්තර්ජාල බැංකුකරණයේ නව පියවරක් වන අතර එය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට ප්‍රථම වරට හඳුන්වා දෙන ලදී.

## උපාධි අපේක්ෂකයින්ගේ සේවා නියුක්ති නිපුණතා ශක්තිමත් කිරීම

- **ඩිජිටල් අධ්‍යාපන සහ වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**

මධ්‍යස්ථානය විසින් සාමාන්‍ය දැනුම සහ භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා 2020 වර්ෂයේ දී සංවිධානය කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්:

- බ්‍රිලියන්ට් මයින්ඩ් තරඟය: තරඟය කාණ්ඩ දෙකකින් සමන්විත වේ:
- අභ්‍යන්තර සිසුන් සඳහා භාෂා (ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ) ඩිප්ලෝමා පාඨමාලා
- ඩිජිටල් අධ්‍යාපනය දියුණු කිරීම සඳහාවූ වැඩමුළු
- අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා වැඩමුළු සහ වෘත්තීය ප්‍රදර්ශන
- සාර්ථකත්වය අරබයා වූ අතථ්‍ය අභිප්‍රේරණ වැඩසටහන
- ක්‍රියාකාරකම් පාදක ඉංග්‍රීසි භාෂා කෙටි පාඨමාලා
- පෞරුෂත්ව වර්ධනය පිළිබඳ වැඩමුළුව
- ඩිජිටල් ලේඛනාගාරය පිළිබඳ පුහුණු වැඩමුළුව
- වෘත්තීය ආචාර විධි සහ විනීතභාවය පිළිබඳ වැඩමුළුව

- **සීමාවාසික වැඩසටහන්**
    - 2020 දී සීමාවාසික වැඩසටහන් සඳහා ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව: 231
    - ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සමග සහයෝගීතා ආයතනික පුහුණු වැඩසටහන
    - නිර්දේශිත ආයතන සමඟ සහයෝගිතා සහ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම.
    - සිසුන් විසින් ස්වයං ස්ථානගත කිරීම්.
    - ප්‍රජා සංවර්ධන කටයුතු.
    - ව්‍යවසායකත්ව ක්‍රියාකාරකම්

## වසංගතය අතරතුර මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් සහ ප්‍රවේශයන්.

- **දිසි විදැසි:** කවි, කාටූන්, චිත්‍ර, සහ කෙටිකතා නිර්මාණවලට ඉඩ හසර සලසමින් දිසි විදැසි කලා කේන්ද්‍රය පීඨයේ සියලුම සිසුන් සඳහා විවෘත විය. පීඨයේ ෆේස්බුක් පිටුවට ඇතුළත් කිරීම සඳහා හොඳම රචනා හෝ චිත්‍ර නිර්මාණ තෝරා ගන්නා ලදී.

- රට වසා දැමීමෙම හේතුවෙන් ගැටළු වලට මුහුණ දීමට සිදුවූ සිසුන්ට උපකාර කිරීම පිණිස මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ කිහිපයක කථිකාචාර්යවරුන්ගෙන් සමන්විත **විශේෂ සහය සම්බන්ධීකරණ කමිටුවක්** පිහිටුවන ලදී. මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දී සිටින සිසුන් මෙන්ම වසංගතය හටගැනීමත් සමග පැමිණි අභියෝග නිසා කළකිරීමට පත් සිසුන් කරා ගොස් ඔවුන්ට

සහාය වීම කමිටුව විසින්ම සිදු කරන ලදී. මෙහි සම්බන්ධීකරණය ශිෂ්‍යයින් ජීවත් වන ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන හරහා සිදුවිය. රෝගය පැතිරීම සිදුවන කාලසීමාව තුළ කායිකව මෙන්ම මානසිකව ද සෞඛ්‍ය සම්පන්නව සිටීම අතිෂය වැදගත් වන බැවින් විවිධ ගැටලුවලට විසඳුම් සෙවීමට සිසුන්ට උපකාර කිරීම සඳහා දුරස්ථ උපදේශන වැඩසටහනක් ආරම්භ කරන ලදී.

- **පාඩම් කටයුතු සඳහා මාර්ගගත ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ මිශ්‍ර ඉගෙනීම් වැඩි දියුණු කිරීම:** වසංගත කාල පරිච්ඡේදය තුළ පාඩම් කටයුතු සඳහා මාර්ගගත ප්‍රවේශය ශක්තිමත් කිරීමේ කාලෝචිත අවශ්‍යතාවය හඳුනා ගනිමින්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පරිගණක මධ්‍යස්ථානය අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් සවිබල ගැන්වීම සඳහා තාක්ෂණික සහාය වැඩසටහන් මාලාවක් දියත් කළේය. මෙහිදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ දේශන ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීම සහ අවම පිරිවැය යටතේ බෙදා හැරීමේ ශිල්ප ක්‍රම විවිධාංගීකරණය කිරීම සහ හුරුපුරුදු කිරීම කෙරෙහිය.

- **මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිසුන් සඳහා යූ ටියුබ් ඉගෙනුම් වේදිකාව:** සාමාන්‍ය දැනුම සහ ඉංග්‍රීසි භාෂාව පදනම් කරගත් ‘‘විදු දිය දහර’’ නමින් යුත් වීඩියෝ මාලාව යූ ටියුබ් වෙත ඇතුළත් කරන ලදී. මෙම වැඩසටහන් මාලාවට ‘‘ඉංග්‍රීසි ඉගෙනීම; කෙටි භාෂා ආශ්‍රිත කතා’’, යන භාෂා ඉගෙනුම් වීඩියෝ වැඩසටහන් අන්තර්ගත වීම නිසා රට වසාදැමූ කාලය තුළ සිසුන්ට ඉංග්‍රීසි භාෂාව සමඟ සම්බන්ධව කටයුතු කිරීමට අවකාශ ලැබිණි. මේ වන විට අන්තර්ගත කර ඇති වීඩියෝ දොළසකට වඩා වැඩි ප්‍රමාණයක් තුළ ඉංග්‍රීසි භාෂාව පුහුණු වීමට ප්‍රයෝජනවත් පාඩම් ඇතුළත්ව ඇත. ඒ හැරුණු විට මෙම අධ්‍යාපනික වැඩසටහන් මාලාවේ කොටසක් කාලීන සමාජ ගැටලු පිළිබඳ තොරතුරු ද පළ කර ඇත.

- **මාර්ගගත ලියාපදිංචි කිරීමේ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන:** සියලුම අධ්‍යයනාංශවල කළමනාකරණ සහකාරවරුන් සඳහා මාර්ගගත ලියාපදිංචි කිරීමේ පද්ධතිය (ORS) පිළිබඳ පුහුණුවක් ලබා දීම සඳහා විශේෂ එක් දින වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන 2020 අගෝස්තු 20 වන දින රමාඩියා රන්මල් නිකේතනයේදී මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතාගේ මහපෙන්වීම යටතේ පැවැත්විණි.

## පර්යේෂණ සහ සමුළු

- දකුණු ආසියානු පුරාවිද්‍යා සංගමයේ 7 වැනි ජාත්‍යන්තර සමුළුව (SOSAA- 2020) සැප්තැම්බර් 18 සහ 21 යන දිනවල පවත්වන ලදී.
- විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය. (VURD)
- උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී පර්යේෂණ සහ සමුළුව (NARCHE).
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ මානව විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ 2 වැනි ජාත්‍යන්තර සමුළුව (ICICH)

## වැදගත් සහයෝගීතා සහ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

සිංහල සහ ජන සන්නිවේදන අධ්‍යයනාංශය සහ HELVETAS අන්තර් ක්‍රියාකාරිත්වය gGmbH අතර 2020 අගෝස්තු 17 වැනි දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.

- දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය විසින් පොලිස් නිලධාරීන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත් වීම.
- පර්යේෂකයන් සඳහා ජාතික විද්‍යා පදනමේ අරමුදල් සැපයීමේ අවස්ථා පිළිබඳ 2020 මාර්තු 11 වැනි දින පැවැති ආරාධිත දේශනය.
- 2020 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද ජර්මනියේ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ පිළිබඳ DAAD තොරතුරු සැසිය.
- 2020 **ජූලි 23 වැනි දින ටෝකියෝ විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා කාර්යාලය මගින්** පවත්වන ලද **ජාල සහ තොරතුරු හුවමාරු කරගැනීම** පිළිබඳ **සැසිය.**
- 2020 සැප්තැම්බර් 23 වැනි දින අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව පැවැත්විණි.

## 2020 දී කමිටු වසින් සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන්

- **සංස්කෘතික සංවර්ධන කමිටුව**

  - රන්රසු 2019/ 2020
    මෙය නර්තනය, ගායනය, නිවේදනය, වාදනය, රංගනය, චිත්‍ර, ගී පද රචනය, කෙටිකතා රචනය, කෙටි චිත්‍රපට නිර්මාණය, වාර්තා වැඩසටහන් රචනය සහ නිෂ්පාදනය ආදී විවිධ ක්ෂේත්‍ර තුළ උපාධි අපේක්ෂකයින්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් විවෘත කිරීමේ අරමුණින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මඟින් පවත්වනු ලබන විශාලතම කලා උළෙලයි.

- **විස්තීරණ පාඨමාලා සම්බන්ධීකාරක කමිටුව**

  - ඩිප්ලෝමා ප්‍රදානය කිරීමේ උත්සවය 2020 ඔක්තෝම්බර් 4 වන දින කොළඹ බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

  - පොදු මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීම.

- **පීඨ ප්‍රකාශන කමිටුව**

  **පීඨ ප්‍රකාශන දිනය** 2020

  - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ප්‍රකාශන කමිටුව විසින් 2020 සැප්තැම්බර් 30 වැනි බදාදා දින එහි ප්‍රථම ‘පීඨ ප්‍රකාශන දින’ උත්සවය පවත්වන ලදී.

  - පීඨ ප්‍රකාශන ලෙස ඉතා වැදගත් පොත් දෙකක් නිකුත් කරන ලදී.
    ඒවා නම් 'දිසි විදසි' - කොවිඩ් - 19 වසංගතය අතරතුර නිවසේ නිරෝධායනයට ලක්ව සිටින පීඨයේ උපාධි අපේක්ෂකයින් විසින් තම ආතතිය සමනය කර ගැනීම සඳහා රචනා කරන ලද කවි එකතුවක් සහ 'රන්රසු නිර්මාණ සංග්‍රහය' - 2019 වසරේ පැවති ‘රන්රසු ප්‍රතිභා’ කලා උළෙලේදී සම්මානලාභී කෙටිකතා සහ කවි එකතුවකි.

  - පීඨයේ ආචාර්යවරුන් විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් 25 කට අධික ප්‍රමාණයක් සඳහා මෙහිදී ත්‍යාග පිරිනමන ලදී.

- **විද්‍යෝදය සාහිත්‍ය සම්මාන** 2020

- විද්‍යෝදය සාහිත්‍ය සම්මාන උළෙල 2020 සැප්තැම්බර් මාසයේදී පැවැත්විණි.
- නවකතා, කෙටිකතා, කවි සහ විශේෂාංග ලිපි යන කාණ්ඩ යටතේ සම්මාන ප්‍රදානය

## යටිතල පහසුකම් සංවර්ධනය

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ නවීන පහසුකම් සැපයීම සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කිරීම 2020 ජූලි 11 වැනි දින සිදු විය.
- පීඨයේ දෙපාර්තමේන්තු ප්‍රතිසංස්කරණය කිරීම
- ස්මාර්ට් පන්ති කාමර පිහිටුවීම.
- පීඨයේ නානකාමර ප්‍රතිසංස්කරණය කිරීම.
- මාර්ගගත දේශන පැවැත්වීම සඳහා ස්මාර්ට් පන්තිකාමර පිහිටුවීම
- ආබාධ සහිත සිසුන් සඳහා නවීන උපකරණ වලින් සමන්විත මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී.
- සියලුම දෙපාර්තමේන්තු තුළ 5S ක්‍රමය හඳුන්වාදීම සහ සේවා ස්ථානය ප්‍රතිසංවිධානය කිරීම.

## 2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය

මානව හා සාමාජයීය විද්‍යා පීඨයේ උපාධි අනුාව නිකුත් කරන ලද ප්‍රතිඵල

| 2019 හා 2020 වසර | පළමු පෙළ | | දෙවන පෙළ ඉහල | | දෙවන පෙළ පහළ | | සමත් | | මුළු සමත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර |
| ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි | 58 | 49 | 405 | 384 | 151 | 180 | 53 | 62 | 667 | 675 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධී | 01 | 01 | 25 | 47 | 51 | 70 | 60 | 51 | 138 | 169 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධී -නැවත | - | - | - | - | 02 | - | 08 | 06 | 10 | 06 |
| ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධී නැවත | 01 | 01 | 02 | 02 | 01 | 03 | 06 | 05 | 10 | 11 |
| විද්‍යාවේදී (තොරතුරු තාක්ෂණ) විශේෂවේදී | - | 01 | 5 | 06 | 4 | 05 | 2 | 11 | 11 | 23 |
| **මුළු සංඛ්‍යාව** | 61 | 52 | 437 | 439 | 209 | 258 | 129 | 135 | 835 | 884 |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - **2020**

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|
| | පළමු වසර | සාමාන්‍ය උපාධි | විශේෂ උපාධි | | | ස්ථීර | තාවකාලික | |
| | | | II | III | IV | | | |
| සිංහල හා ජන සන්නිවේදනය | 1010 | 449 | 54 | 65 | 31 | 14 | 04 | 02 |
| ඉතිහාසය හා පුරා විද්‍යාව | | | 55 | 59 | 62 | 13 | 03 | 02 |
| භූගෝල විද්‍යාව | | | 71 | 77 | 65 | 12 | 02 | 05 |
| සමාජවිද්‍යාව | | | 54 | 57 | 36 | 03 | 01 | 02 |
| මානව විද්‍යාව | | | 44 | 37 | 12 | 08 | 03 | 03 |
| අපරාධ විද්‍යාව | | | 82 | 48 | 39 | 09 | 02 | 02 |
| භාෂා සංස්කෘතික හා ප්‍රසංගික කලා | | | 66 | 50 | 38 | 11 | 04 | 02 |
| සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණය | | | | | | 06 | | |
| ආර්ථික විද්‍යාව | | | 64 | 12 | 53 | 10 | 02 | 03 |
| සමාජ සංඛ්‍යානය | | | 50 | 51 | 42 | 10 | 04 | 02 |
| පාලි හා බෞද්ධ අධ්‍යයනය | | | 60 | 65 | 108 | 12 | 06 | 02 |
| දර්ශනය හා මනෝවිද්‍යාව | | | 70 | 73 | 61 | 05 | 04 | 02 |
| දේශපාලන විද්‍යාව | | | 33 | 55 | 65 | 08 | 02 | 02 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යාව | | | 15 | 13 | 28 | 08 | 01 | 02 |
| තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය | | | 26 | 08 | 20 | 03 | 02 | 02 |
| **එකතුව** | | | **744** | **670** | **660** | **126** | **40** | **33** |

## දේශීය සිසුන් පිළිබඳ විස්තරය - 2020

| පාඨමාලාව | | මාධ්‍යය | 2020 බඳවා ගැනීම | 2 වන | 3 වන | 4 වන | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| සාමාන්‍ය | | සිංහල/ඉංග්‍රීසි | 1010 | 242 | 182 | - | 175 |
| විශේෂ | මානව විද්‍යා | | | 44 | 12 | 24 | 54 |
| | පුරාවිද්‍යාව | | | 22 | 25 | 27 | 20 |
| | බෞද්ධ ශිෂ්ටාචාරය | | | 30 | 59 | 35 | 63 |
| | බෞද්ධ දර්ශනය | | | 19 | 34 | 14 | 16 |
| | ව්‍යාපාර සංඛ්‍යානය | | | 47 | 34 | 28 | 26 |
| | අපරාධ විද්‍යාව | | | 82 | 39 | 34 | 45 |
| | නර්ථනය | | | 17 | 09 | 14 | 13 |
| | ආර්ථික විද්‍යාව | | | 64 | 53 | 52 | 54 |
| | භූගෝල විද්‍යාව | | | 71 | 65 | 55 | 58 |
| | හින්දි | | | 12 | 08 | 08 | 08 |
| | ඉතිහාසය | | | 33 | 37 | 38 | 39 |
| | ජන සන්නිවේදනය | | | 20 | 13 | 17 | 22 |
| | සංගීතය | | | 25 | 16 | 17 | 15 |
| | පාලි | | | 11 | 15 | 05 | 05 |
| | දර්ශනය හා මනෝවිද්‍යාව | | | 70 | 61 | 78 | 83 |
| | දේශපාලන විද්‍යාව | | | 33 | 65 | 38 | 37 |
| | සංස්කෘත | | | 12 | 05 | 01 | 02 |
| | සිංහල | | | 34 | 18 | 34 | 36 |
| | සමාජවිද්‍යාව | | | 54 | 36 | 52 | 52 |
| | ඉංග්‍රීසි | | | 05 | 08 | 16 | 05 |
| | සමාජ සංඛ්‍යානය | | | 03 | 08 | 16 | 15 |
| | තොරතුරු තාක්ෂණය | | | 26 | 20 | 23 | 23 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | | | 10 | 20 | 16 | 18 |
| | **එකතුව** | | 1010 | 744 | 660 | 696 | **884** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| **විෂය** | **මධ්‍යයය** | **ජ්‍යෙෂ්ඨ මහාචාර්යය** | **මහාචාර්යය** | **සහාය මහාචාර්යය** | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය I** | **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය. II** | **කථිකාචාර්යය** | **කථිකාචාර්යය (පරිවාස)** | **තාවකාලික සහය කථිකාචාර්යය** | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සිංහල හා ජන සන්නිවේදනය | සිංහල/ඉංග්‍රීසි | 1 | 1 | 1 | 8 | 2 | 0 | 1 | 4 | 18 |
| ඉතිහාසය හා පුරාවිද්‍යාව | | 0 | 5 | 1 | 3 | 0 | 2 | 2 | 3 | 16 |
| භූගෝල විද්‍යාව | | 0 | 2 | 4 | 0 | 2 | 1 | 3 | 2 | 14 |
| සමාජවිද්‍යාව | | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 4 |
| මානව විද්‍යාව | | 0 | 3 | 0 | 3 | 0 | 2 | 0 | 3 | 11 |
| =\අපරාධවිද්‍යාව | | 0 | 1 | 1 | 4 | 2 | 0 | 1 | 2 | 11 |
| භාෂා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා | | 1 | 0 | 0 | 6 | 1 | 1 | 2 | 4 | 15 |
| ආර්ථික විද්‍යාව | | 1 | 4 | 0 | 1 | 2 | 1 | 1 | 2 | 12 |
| සමාජ සංඛ්‍යානය | | 0 | 0 | 0 | 4 | 2 | 1 | 3 | 4 | 14 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යාව | | 0 | 0 | 0 | 8 | 0 | 0 | 0 | 1 | 9 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම | | 0 | 0 | 0 | 2 | 2 | 1 | 2 | 7 | 14 |
| පාලි හා බෞද්ධ | | 1 | 6 | 0 | 3 | 2 | 0 | 0 | 6 | 18 |
| දර්ශනය හා මනෝවිද්‍යාව | | 1 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 4 | 9 |
| දේශපාලන විද්‍යාව | | 0 | 0 | 1 | 2 | 5 | 0 | 0 | 2 | 10 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සංගීතය හා නිර්මානාත්මක අධ්‍යයනය | | 0 | 1 | 0 | 0 | 3 | 1 | 1 | 1 | 7 |
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනය | | 0 | 0 | 0 | 0 | 1 | | 2 | 0 | 0 |
| **එකතුව** | | 6 | 25 | 8 | 48 | 25 | 10 | 19 | 46 | 182 |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020

| **දෙපාර්තමේන්තුව** | **ජ්‍යෙෂ්ඨතම** | **ජ්‍යෙෂ්ඨ** | **ආධුනික** | **කනිෂ්ඨ සේවක** | **එකතුව** |
|---|---|---|---|---|---|
| පීඨ කාර්යයයාලය | 1 | 1 | 10 | 5 | 17 |
| සිංහල හා සිංහල හා ජන සන්නිවේදනය ජන සන්නිවේදනය | 0 | 0 | 1 | 1 | 2 |
| ඉතිහාසය හා පුරාවිද්‍යාව | 0 | 1 | 0 | 1 | 2 |
| භූගෝල විද්‍යාව | 0 | 0 | 2 | 3 | 5 |
| සමාජවිද්‍යාව | 0 | 0 | 1 | 1 | 2 |
| මානව විද්‍යාව | 0 | 0 | 1 | 2 | 3 |
| භාෂා සංස්කෘතික අධ්‍යයන හා ප්‍රසාංගික කලා | 0 | 0 | 1 | 1 | 2 |
| ආර්ථික විද්‍යාව | 1 | 0 | 0 | 2 | 3 |
| සමාජ සංඛ්‍යානය | 0 | 0 | 1 | 1 | 2 |
| ඉංග්‍රීසි හා වාග් විද්‍යාව | 0 | 0 | 1 | 1 | 2 |
| පාලි හා බෞද්ධ | 0 | 0 | 1 | 1 | 2 |
| දර්ශනය හා මනෝවිද්‍යාව | 0 | 0 | 1 | 1 | 2 |
| අපරාධ විද්‍යාව | 0 | 0 | 1 | 1 | 2 |
| ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම | 0 | 0 | 1 | 1 | 2 |
| දේශපාලන විද්‍යාව | 0 | 0 | 1 | 1 | 2 |
| පරිගණක විද්‍යාගාර | 0 | 0 | 1 | 3 | 4 |
| **එකතුව** | **2** | **2** | **24** | **25** | **54** |

## සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020

| විෂය | ප්‍රසිද්ධ කරන ලද | වාණිජ්‍ය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පර්යේෂණ ගණන | 12 | 4 | 13 |

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය ප්‍රකාශිත | විදේශීය ප්‍රකාශිත |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **0** | **18** |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **6** | **4** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | **37** | **2** |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | **5** | **0** |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | **4** | **1** |

## ව්‍යවහාරික විද්‍යා පීඨය



වර්ෂ 1962 දී පිහිටුවන ලද මෙම විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික විද්‍යා පීඨයන් අතර පැරණිතම ව්‍යහහාරික විද්‍යා පීඨය වේ. ආරම්භයේ සිටම ප්‍රඥාවෙන් ඉගැන්වීමේ සහ පර්යේෂණ කටයුතු වලින් පිරිපුන් මෙම පීඨය ශිෂ්‍ය සංඛාවෙන්ද ප්‍රමුඛස්ථානය ගනී. වර්තමානයේ

අධ්‍යයනාංශ 11 සහ 150 ට ආසන්න අධ්‍යයන කාර්යය මණ්ඩලයකින් ද 2500 කට වැඩි ප්‍රථම උපාධී හා 200 කට ආසන්න පශ්චාද් උපාධි අපේක්ෂකයින් පිරිසකින් මෙම පීඨය සමන්විත වේ.

මෙම පීඨය විද්‍යා අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රමුඛ ස්ථානයක් ලබා විද්‍යාව සිංහලෙන් ඉගැන්වීමේ පුරෝගාමියෙක් විය. එමෙන්ම මත්ස්‍ය ජීව විද්‍යාව , බහු අවයවික විද්‍යාව , ආහාර විද්‍යාව , වන හා පාරිසරික විද්‍යාව. සංඛ්‍යාන විද්‍යාව , පරිගණක විද්‍යාව හා කළමනාකරණ විද්‍යාව වැනි ව්‍යවහාරික විෂයයන් මෙම පීඨයේ විද්‍යාවේදී උපාධි විෂය මාලාවට අයත් වේ.

ව්‍යවහාරික විද්‍යා පීඨයට අයත් අධ්‍යයනාංශ 11 පහතින් දැක්වේ.

| | |
|---|---|
| **පීඨාධිපති** | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ලලීන් කරුණානායක |
| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
| 1. උද්භිද විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය පී.කේ.එන්. දසනායක |
| 2. රසායන විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එම්.එන්.එස්. කෝට්ටෙගොඩ |
| 3. පරිගණක විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය පී.එම්.ජයවීර |
| 4. ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය | අචාර්යය ජේ.එම්.ජේ.කේ. ජයසිංහ |
| 5. වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එස්.එම්.සී.යූ.පී. සුභසිංහ |
| 6. ගණිතවිද්‍යා අධ්‍යයනාංශය | කේ.කේ.ඩබ්ලිව්.එස්. කුමාර මහතා |
| 7. භෞතික විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය ඒ.ආර්.කුමාරසිංහ |
| 8. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය ඩබ්ලිව්.එන්.එන්.කේ. පෙරේරා |
| 9. සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය ඩබ්ලිඩි.ඒ.ඩී. මහඋල්පත මහතා |
| 10. ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය එන්.එම්.එස්. සිරිමුතු |
| 11. බහු අවයවික විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය කේ.එම්.ටී.ඩී ගුණසේකර |

## පීඨය මඟින් පිරිනමනු ලබන උපාධි හා ඩිප්ලෝමා

**උපාධි පාඨමාලා**

01. විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය
02. විද්‍යාවිදී සාමාන්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධිය
03. විද්‍යාවේදී (ගෞරව) අහාර විද්‍යා හා තාක්ෂණ උපාධිය
04. විද්‍යාවේදී (ගෞරව ) රසායන විද්‍යා උපාධිය
05. විද්‍යාවේදී (ගෞරව ) බහු අවයවික රසායන විද්‍යා උපාධිය
06. විද්‍යාවේදී (ගෞරව ) කර්මාන්ත රසායනවිද්‍යා උපාධිය
07. විද්‍යාවේදී (ගෞරව) ජීවවිද්‍යා උපාධිය
08. විද්‍යාවේදී (ගෞරව) ශාක ජෛව තාක්ෂණ උපාධිය

09. විද්‍යාවේදී (ගෞරව) ශාක ජීව විද්‍යා උපාධිය
10. විද්‍යාවේදී (ගෞරව) ක්ෂුද්‍ර ජීව විද්‍යා
11. විද්‍යාවේදී (ගෞරව) ජලජ සම්පත් කළමනාකරණ
12. විද්‍යාවේදී (ගෞරව) සත්ත්ව විද්‍යා
13. විද්‍යාවේදී (ගෞරව) පාරිසරික කළමනාකරණ හා වන විද්‍යා උපාධිය
14. විද්‍යාවේදී (ගෞරව) ගණිතවිද්‍යා උපාධිය
15. විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික ගණිතය උපාධිය
16. විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය
17. විද්‍යාවේදී (ගෞරව) භෞතිකවිද්‍යා උපාධිය
18. විද්‍යාවේදී (ගෞරව) සංඛ්‍යාන උපාධිය
19. විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ උපාධිය
20. විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධිය

**පශ්චාද් උපාධි පාඨමාලා**

1. බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
2. කාර්මික ගණිතය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
3. කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
4. ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
5. භෞතික විද්‍යා අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
6. ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
7. පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව
8. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
9. කාර්මික විශ්ලේෂණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව / විද්‍යාපති උපාධි පාඨමාලාව
10. සාගර සම්පත් කළමනාකරනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව/ විද්‍යාපති උපාධි පාඨමාලාව
11. අහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව
12. වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව/ විද්‍යාපති උපාධි පාඨමාලාව
13. ඖෂධ නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව

## 2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය

| 2019 හා 2020 යන වසරවල් | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සමත් | | සමත් මුළු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | Year 2020 | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර |
| විද්‍යාවේදී (ගෞරව) ජලජ සම්පත් කළමනාකරණය | 01 | - | 05 | 05 | - | - | - | - | 06 | 05 |
| විද්‍යාවේදී (ගෞරව) ජීවවිද්‍යා උපාධිය | - | - | - | - | - | - | - | - | - | - |
| විද්‍යාවේදී (ගෞරව ) රසායන විද්‍යා උපාධිය | 09 | 05 | 19 | 19 | 02 | 02 | - | 01 | 30 | 27 |
| විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා උපාධිය | 03 | 01 | 04 | 07 | 03 | - | 01 | - | 08 | 11 |
| විද්‍යාවේදී (ගෞරව) අහාර විද්‍යා හා තාක්ෂණ උපාධිය | 14 | 18 | 24 | 14 | 07 | 06 | 07 | 05 | 50 | 44 |
| විද්‍යාවේදී (ගෞරව) පාරිසරික කළමනාකරණ හා වන විද්‍යා උපාධිය | 01 | 01 | 10 | 15 | 01 | - | - | - | 12 | 16 |
| විද්‍යාවේදී (ගෞරව) ගණිතවිද්‍යා උපාධිය | 05 | 02 | 06 | 08 | - | 01 | - | - | 11 | 11 |
| විද්‍යාවේදී (ගෞරව) භෞතිකවිද්‍යා උපාධිය | 01 | 02 | 08 | 11 | 02 | 01 | 01 | - | 12 | 14 |
| විද්‍යාවේදී (ගෞරව) ශාක ජීව විද්‍යා උපාධිය | 01 | 02 | 05 | 02 | - | - | - | | 06 | 04 |
| විද්‍යාවේදී (ගෞරව) සංඛ්‍යාන උපාධිය | 04 | 03 | 06 | 07 | 01 | 01 | 01 | - | 12 | 11 |
| විද්‍යාවේදී (ගෞරව) සත්ත්ව විද්‍යා | 02 | 01 | 10 | 06 | - | - | - | - | 12 | 07 |
| විද්‍යාවේදී (ගෞරව) ක්ෂුද්‍ර ජීව විද්‍යා | 05 | 02 | 01 | 05 | - | - | - | - | 06 | 07 |
| විද්‍යාවේදී (ගෞරව) ශාක ජීව විද්‍යා උපාධිය | - | | - | | - | | - | | - | - |
| විද්‍යාවේදී (ගෞරව) ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ උපාධිය | 03 | 03 | 06 | 18 | 09 | 11 | 19 | 11 | 37 | 43 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාවේදී (ගෞරව) බහු අවයවික විද්‍යා උපාධිය | - | - | - | 07 | - | 01 | - | - | - | 08 |
| විද්‍යාවේදී (ගෞරව ) කර්මාන්ත රසායනවිද්‍යා උපාධිය | - | 01 | - | 04 | - | - | - | - | - | 05 |
| විද්‍යාවේදී (ගෞරව) ව්‍යවහාරික විද්‍යා උපාධිය | 01 | 03 | 57 | 50 | 46 | 42 | 05 | 02 | 109 | 97 |
| විද්‍යාවේදී (ගෞරව) එකතුව | 50 | 44 | 161 | 178 | 67 | 69 | 33 | 19 | 311 | 310 |
| විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය | - | - | 08 | 05 | 37 | 40 | 234 | 189 | 279 | 234 |
| **මුළු එකතුව** | **50** | **44** | **169** | **183** | **104** | **109** | **267** | **208** | **590** | **544** |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020

| **පාඨමාලාව** | **මුළු සිසුන් සංඛ්‍යාව** | **මුළු අධ්‍යයන කාර්යය මණ්ඩලය** | | **මුළු අනධ්‍යන කාර්යය මණ්ඩලය** |
|---|---|---|---|---|
| ජීව විද්‍යාව | 744 | ස්ථිර | තාවකාලික | 114 |
| භෞතික විද්‍යාව | 758 | 144 | 124 | |
| ආහාර විද්‍යා හා තාක්ෂණය | 205 | | | |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | 196 | | | |
| භෞතික විද්‍යා (තොරතුරු තාක්ෂණ) | 175 | | | |
| වෙනත් විශේෂ පාඨමාලා | 293 | | | |
| විද්‍යාවේදී ගෞරව උපාධි | 93 | | | |
| **එකතුව** | **2464** | **144** | **124** | **114** |

## දේශීය සිසුන් පිළිබඳ විස්තර- 2020

| පාඨමාලාව | මාධ්‍යය | 2020 කණ්ඩායම | වසරට අයත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | 1 වන | 2 වන | 3 වන | 4 වන |
| ජීව විද්‍යාව (සාමාන්‍ය) | සිංහල | 296 | 296 | 273 | 175 | - |
| භෞතික විද්‍යා (සාමාන්‍ය) | | 294 | 294 | 266 | 198 | - |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 62 | 62 | 52 | 47 | 44 |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | | 60 | 60 | 52 | 42 | 42 |
| අනෙකුත් ගෞරව පාඨමාලා | | - | - | - | 150 | 143 |
| භෞතික විද්‍යා (තොරතුරු තාක්ෂණ) | | 70 | 70 | 65 | 40 | - |
| විද්‍යාවේදී ගෞරව | | - | - | - | - | 93 |
| **එකතුව** | | **785** | **783** | **738** | **676** | **327** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020

| විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | කථිකාචාර්ය | අතුරුකාලීන කථිකාචාර්ය | තාවකාලික කථිකාචාර්ය | උපදේශක | තාවකාලික උපදේශක /නිදර්ශක | විද්‍යාත්මක සහායක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පීඨ කාර්යයයාලය | English | - | 01 | - | - | 05 | 02 | 01 | - | 02 | 06 | - | **17** |
| රසායන විද්‍යා | | 02 | 06 | - | 02 | 10 | 01 | - | 04 | - | 18 | 01 | **45** |
| රසායන විද්‍යා | | - | 01 | - | 04 | 04 | 02 | 01 | - | - | 04 | - | **16** |
| පරිගණක විද්‍යා | | - | 02 | - | 04 | 03 | - | 03 | - | 02 | 04 | - | **18** |
| උද්භිද විද්‍යා | | 03 | 01 | - | 01 | 06 | - | 01 | 02 | - | 11 | - | **24** |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භෞතික විද්‍යා | | - | 03 | - | 05 | 04 | 03 | - | 01 | - | 13 | - | **30** |
| සත්ත්ව විද්‍යා | | 02 | 02 | - | 02 | 04 | - | 02 | 02 | - | - | - | **14** |
| ගණිතය | | - | 01 | - | 07 | 04 | 01 | 02 | 03 | 02 | 12 | - | **32** |
| වන හා පාරිසරික විද්‍යා | | 03 | 04 | - | 02 | 03 | 01 | 01 | - | - | - | - | **13** |
| ආහාර විද්‍යාව හා තාක්ෂණය | | 01 | 04 | - | 01 | 03 | 01 | 01 | 01 | - | 05 | 01 | **19** |
| ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය | | - | - | - | - | 01 | 02 | 04 | 03 | 03 | 02 | - | **15** |
| බහු අවයවික විද්‍යා | | 01 | - | - | 01 | 02 | - | - | 01 | - | 02 | - | **07** |
| එකතුව | | **12** | **26** | **-** | **27** | **57** | **12** | **11** | **17** | **09** | **77** | **02** | **250** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර - 2020

| පීඨය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ | ආධුනික සේවක | කනිෂ්ඨ සේවක මණ්ඩලය | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 10 | 18 | 41 | 45 | **114** |

## සිදු කරන ලදපර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන - 2020

| **විෂය** | ප්‍රසිද්ධියට පත් කරන ලද | වාණිජ්‍යකරණය කරන ලද | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| පර්යේෂණ ගණන | 94 | 01 | 51 |
| නවෝත්පාදන ගණන | 09 | - | - |

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීයව ප්‍රකාශයට පත් කරන ලද | විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | 23 | 96 |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | 10 | 23 |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | 97 | 46 |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | 2 | 36 |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 1 | 4 |

## ලැබූ ප්‍රදාන පිළිබඳ තොරතුරු- 2020

| විෂය | ප්‍රදාන සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 11 | 6 | 5 |
| අන්තර්ජාතික ප්‍රදාන | 3 | 2 | 1 |
| වෙනත් විශේෂ ප්‍රදාන හා රන් පදක්කම් | 9 | 4 | 5 |
| එකතුව | **23** | **12** | **11** |

## කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය



කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියෙහි ප්‍රමුඛතම කළමනාකරණ පීඨය වන අතර එය කළමනාකරණ අධ්‍යාපනයෙහි විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය ලෙස සැලකේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි, කළමනාකරණ අධ්‍යාපනයට වසර 60 කට වඩා දිගු ඉතිහාසයක් ඇත.

වර්ෂ 1959/60 දී ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා, ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශයන් යටතේ උපාධි වැඩ සටහන් දෙකක් හඳුන්වා දීමත් සමගම පීඨයෙහි පළමු අධ්‍යයන වැඩසටහන් ආරම්භ විය. 1968 දී මෙම අධ්‍යයනාංශය කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව ලෙස ප්‍රතිනිර්මාණය කරන ලදී. එය වර්ෂ 1972 දී විශ්වවිද්‍යාල පද්ධතිය ප්‍රතිසංවිධානය අනුව කළමනාකරණ අධ්‍යයන දෙපාර්තමේන්තුව සහ වාණිජ විද්‍යා දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙකකින් යුත් කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨයක් පිහිටවනු ලැබීය.

අධ්‍යයනාංශ 12 කින් සමන්විත වත්මන් පීඨය කළමනාකරණ හා වාණිජ යන පුළුල් ක්ෂේත්‍රයන්හි ලෝකයේ අතිශයින් තරගකාරී උපාධි වැඩ සටහන් දියත් කරනු ලබයි. මෙම පීඨය පසුගිය දශක හතරක් තුළ උසස් පෙළ වාණිජ විෂය ධාරාවේ විශිෂ්ටතම ප්‍රතිඵල ලබා ගන්නා සිසුන් අතර ප්‍රයතම පීඨය බවට පත්විය**.** නමුදු ශ්‍රී ලාංකීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල පීඨයෙහි කාර්යභාරය උපාධි අධ්‍යාපනයට සීමා නොවේ. කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය නිරන්තර වෘත්තීය සංවර්ධනය හා වෘත්තිමය නායකයන් බිහිකිරීමේ ලා ඇප කැප වී සිටියි. ඒ සඳහා අප පීඨය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සමග එකතුව කළමනාකරණ විෂයෙහි අතිශයින් පිළිගත් ආචාර්ය උපාධි හා පශ්චාද් උපාධි වැඩසටහන් **(**Ph.D, MBA,MPM in M.Sc**)** ක්‍රියාත්මක කරනු ලබයි. තවද, ශ්‍රී ලාංකීය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි වැඩි සමාජ සහභාගීත්වයක අවශ්‍යතාව අවබෝධ කොට ගනිමින් අප පීඨය කළමනාකරණ හා වාණිජවිද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි බාහිර/අර්ධ කාලීන උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර වැඩසටහන් පවත්වනු ලබයි.

**පීඨාධිපති** **මහාචාර්යය පී.ඩී. නිමල්**
*(29/05/2020 සිට 31/12/2020 දක්වා )*
අචාර්යය යූ. අනුර කුමාර
*( 01/01/2020 සිට 28/05/2020 දක්වා)*

2020 වර්ෂය තුළ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ අධ්‍යයන දෙපාර්තමේන්තු සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පහත පරිදි වේ

**අධ්‍යයනාංශ**

| | |
|---|---|
| 1. ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය | අචාර්යය එම්. බඩිලිඩ්. කල්‍යාණී |
| 2.රාජ්‍ය පරිපාලන අධ්‍යයනාංශය | අචාර්යය එල්. ඒ. පී. මදුවන්ති මිය |
| 3. වාණිජ විද්‍යා අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ඊ දයාරත්න මයා |
| 4. දේපල කළමනාකරණ හා | අචාර්යය ටී.ජී.යූ.පී. පෙරේරා මයා |

| | |
|---|---|
| තක්සේරු විද්‍යා අධ්‍යයනාංශය | *(11/06/2020 සිට 31/12/2020 දක්වා)*<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ආර්. ජී ආරියවංශ<br>*( 11/03/2020 සිට 10/06/2020 දක්වා )*<br>ආචාර්යය එන්. සී. වික්‍රමාරච්චි මිය<br>*(from 01/01/2020 to 10/03/2020)* |
| 5. ගණකාධිකරණ අධ්‍යයනාංශය | මහාචාර්යය ඒ.එච්.එන්. කාරියවසම් |
| 6. අලෙවි කළමණාකරණ අධ්‍යයනාංශය | මහාචාර්යය පී.එස්.ජී.ඒ. ජයරත්න |
| 7. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය | අචාර්යය ජී.ඩී.එන්. පෙරේරා මිය |
| 8.මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය | ආචාර්යය පී.ඒ.එන්.එස් අනුරාධා මිය<br>*( 29/05/2020 සිට 31/12/2020 දක්වා)*<br>මහාචාර්යය පී.ඩී.නිමල්<br>*(01/03/2020 සිට 28/05/2020දක්වා)*<br>ආචාර්යය පී.ඒ.එන්.එස් අනුරාධා මිය<br>*( 01/01/2020 සිට 29/02/2020 දක්වා)* |
| 9. ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය ඩී.ආර්.ජේ. සිරිවර්ධන |
| 10. තොරතුරු තාක්ෂණ අධ්‍යයනාං | අචාර්යය ඩබ්.එම්.එන් ෆර්නැන්ඩු<br>*( 02/06/2020 සිට 31/12/2020 දක්වා)*<br>අචාර්යය පී.ඩී.කේ. අමිත කුමාර |
| 11. තීරණ විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්යය ටී.එස්.එම් අමරසේන |
| 12. ව්‍යවසායකත්ව අධ්‍යයනාංශය | අචාර්යය එම්.වී.එස්.එස්. උදයංග |

## පියය මඟින් පිරිනමනු ලබන උපාධි,ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා

**අභ්‍යන්තර උපාධි පාඨමාලා**

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ)

විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) (විශේෂ)

වාණිජවේදී (විශේෂ)

විද්‍යාවේදී දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂ)

විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂ)

විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී මූල්‍ය (විශේෂ)

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) (විශේෂ)

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (තොරතුරු පද්ධති) (විශේෂ)

විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂ)

විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂ)

**බාහිර උපාධි පාඨමාලා**

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (සාමාන්‍ය)

වාණිජවේදී (සාමාන්‍ය)

විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (සාමාන්‍ය)

**උසස් ඩිප්ලෝමා පාඨමාලා**

පරිගණක පදනම් ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

අලෙවි කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා

**ඩිප්ලෝමා පාඨමාලා**

රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

පරිගණක පදනම් ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා

අලෙවි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

ව්‍යවසායකත්ව ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා

**සහතික පත්‍ර පාඨමාලා**

පරිගණක පාදක දත්ත විශ්ලේෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

ව්‍යවසායකත්ව හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

ශාස්ත්‍රීය ලිවීම් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

වෘත්තීය සන්නිවේදනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

සපුරාලීම සඳහා නායකත්වය දෙන කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

## 2019 හා 2020 නිකුත් කරන ලද ප්‍රතිඵල අතර සංසන්දනය

| 2019 හා 2020 වසර | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සාමාන්‍ය සමත් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර |
| විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂවේදී) | 76 | 44 | 62 | 76 | 35 | 29 | 26 | 49 | 199 | 198 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදී | 8 | 19 | 21 | 22 | 18 | 19 | 28 | 17 | 75 | 77 |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂවේදී) | 11 | 24 | 73 | 56 | 64 | 67 | 100 | 88 | 248 | 235 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාණිජවේදී (විශේෂවේදී) | 6 | 3 | 22 | 30 | 17 | 23 | 69 | 68 | 114 | 124 |
| විද්‍යාවේදී මෙහෙයුම් තාක්ෂණ කළමනාකරණය (විශේෂවේදී) | 5 | 5 | 22 | 18 | 14 | 6 | 11 | 13 | 52 | 42 |
| විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදී) | 5 | 1 | 8 | 20 | 16 | 12 | 36 | 27 | 65 | 60 |
| විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂවේදී) | 2 | 2 | 2 | 2 | 4 | 0 | 3 | 5 | 11 | 9 |
| විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ (විශේෂවේදී) | 39 | 26 | 48 | 50 | 31 | 42 | 38 | 50 | 156 | 168 |
| විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂවේදී)) | 8 | 9 | 17 | 39 | 20 | 13 | 17 | 10 | 62 | 71 |
| විද්‍යාවේදී ව්‍යාපාර පද්ධති කළමනාකරණය (විශේෂවේදී) | 2 | 2 | 11 | 9 | 7 | 9 | 34 | 34 | 54 | 54 |
| විද්‍යාවේදී අලෙවි කළමනාකරණය (විශේෂවේදී) | 5 | 11 | 26 | 22 | 22 | 16 | 40 | 43 | 93 | 92 |
| විද්‍යාවේදී රාජ්‍ය කළමනාකරණ (විශේෂවේදී) | 6 | 2 | 17 | 10 | 17 | 18 | 36 | 40 | 76 | 70 |
| **එකතුව** | **173** | **148** | **329** | **354** | **265** | **254** | **438** | **444** | **1205** | **1200** |

## දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2020

| උපාධි පාඨමාලා (ඉංග්‍රීසි මාධ්‍යය) | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | හතර වන වසර | |
| කළමනාකරණ පොදු වැඩසටහන | 900 | - | - | - | - |
| විද්‍යාවේදී ගණකාධිකරණ (විශේෂවේදී) | - | 206 | 205 | 202 | **818** |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (ව්‍යාපාර ආර්ථික විද්‍යා) විශේෂවේදී | - | 82 | 82 | 67 | **302** |
| විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂවේදී) | - | 227 | 221 | 229 | **914** |

| | | | | | |
|---|---|---|---|---|---|
| වාණිජවේදී (විශේෂවේදී) | 125 | 126 | 123 | 128 | **502** |
| විද්‍යාවේදී මෙහෙයුම් හා තාක්ෂණ කළමනාකරණ (විශේෂවේදී) | - | 56 | 52 | 56 | **214** |
| විද්‍යාවේදී දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා (විශේෂවේදී) | 60 | 58 | 61 | 58 | **237** |
| විද්‍යාවේදී ව්‍යවසායකත්ව (විශේෂවේදී) | - | 16 | 19 | 16 | **79** |
| විද්‍යාවේදී මූල්‍ය කළමනාකරණ (විශේෂවේදී) | - | 157 | 159 | 159 | **628** |
| විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණ (විශේෂවේදී) | - | 57 | 67 | 75 | **258** |
| විද්‍යාවේදී ව්‍යාපාර තොරතුරු පද්ධති කළමනාකරණය (විශේෂවේදී) | 48 | 47 | 49 | 48 | **192** |
| විද්‍යාවේදී අලෙවි කළමනාකරණ (විශේෂවේදී) | - | 95 | 92 | 100 | **378** |
| විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂවේදී | 83 | 84 | 74 | 74 | **315** |
| **මුළු එකතුව** | **1216** | **1211** | **1204** | **1212** | **4843** |

## කාර්යය මණ්ඩල විස්තරය – 2020

| අධ්‍යයන කාර්යය මණ්ඩලය | | පරිපාලන කාර්යය මණ්ඩලය | අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|
| ස්ථිර | තාවකාලික | | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික |
| 187 | 32 | 4 | 11 | 12 | 74 | 16 |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය -2020

| අධ්‍යයනාංශය/ ඒකකය | මධ්‍යයය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | සහාය මහාචාර් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය 11 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය (කාවකාලික) | කථිකාචාර්යය | කථිකාචාර්යය (ආධුනික) | කාවකාලික සහාය කථිකාචාර්යය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපාර පරිපාලන | ශ්‍රී ජ | - | - | - | 8 | 6 | - | 4 | 5 | 2 |
| රාජ්‍ය පරිපාලන | ශ්‍රී ජ | 1 | - | - | 4 | 2 | - | 3 | 2 | 4 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වාණිජ්‍ය | | 1 | - | - | 1 | 2 | - | - | 5 | 1 |
| දි දේපල කළමනාකරණ හා තක්සේරු විද්‍යා | | 1 | 1 | - | 3 | 1 | - | - | 4 | 2 |
| ගණකාධිකරණ අධ්‍යයන | | 2 | 2 | - | 10 | 5 | - | - | 3 | 1 |
| අලෙවි කළමනාකරණ | | 1 | 2 | 1 | 3 | 4 | - | - | 1 | 2 |
| මානව සම්පත් කළමනාකරණ | | 2 | 2 | - | 8 | - | - | 1 | - | 2 |
| මූල්‍ය කළමනාකරණ | | 1 | 5 | - | 2 | 3 | - | 1 | 4 | 1 |
| ව්‍යාපාර ආර්ථික විද්‍යා | | 1 | 2 | - | 7 | 5 | - | 4 | - | 3 |
| තොරතුරු තාක්ෂණ | | - | 1 | - | 7 | 4 | - | - | 4 | 6 |
| තීරණ විද්‍යා | | 1 | 2 | - | 7 | 3 | - | - | 3 | 4 |
| ව්‍යවසායකත්ව | | - | - | - | 2 | 4 | - | 3 | - | 3 |
| නීති අධ්‍යයන අංශය | | - | - | - | - | 2 | - | 2 | - | - |
| ව්‍යාපාර සන්නිවේදන අංශය | | - | - | - | 2 | 4 | - | - | - | - |
| **එකතුව** | | **11** | **17** | **1** | **64** | **45** | **0** | **18** | **31** | **31** |

## පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීයව ප්‍රකාශයට පත් කරන ලද | විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **9** | **64** |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **20** | **11** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | **74** | **27** |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | **2** | **16** |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | **1** | **9** |

## වෛද්‍ය විද්‍යා පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිව්වැනි පීඨය වශයෙන් 1993 වර්ෂයේ වෛද්‍ය විද්‍යා පීඨය ස්ථාපිත විය. 2007 වර්ෂය වන විට මෙම පීඨය අධ්‍යයනාංශ 17 කින් යුක්ත සියලු සුදුසුකම් ඇති පීඨයක් බවට පත් විය. ලංකාවේ ප්‍රථම වරට මෙම පීඨය විද්‍යාවේදී හෙද, විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා සහ ඖෂධවේදී යන පාඨමාලා සඳහා උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලදී.

ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු, විභාග කටයුතු හා මූල්‍ය කටයුතු යන කටයුතු සියල්ල පීඨයෙන්ම සිදු කරන විශ්වවිද්‍යාලයේ එකම පීඨයයි. 2013 වසරේදී සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය ආරම්භ කරන ලදී.

2020 වර්ෂයේදී වෛද්‍ය විද්‍යා පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ හා අධ්‍යයනාංශ ප්‍රධානීන්ගෙන් සමන්විත විය.

**පීඨාධිපති** ජ්‍යෙෂ්ඨ මහාචාර්යය එස්.ජී. යසවර්ධන
( 16.11.2020 දක්වා)
මහාචාර්යය ඒ.ඒ. පතිරණ (17.11.2020 සිට)

| අධ්‍යයනාංශය | අධ්‍යයනාංශ ප්‍රධානීන් |
|---|---|
| 1 ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය පී. එච්. දිසානායක මයා |
| 2 කායික විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ඩී. සී. හේවගේ මයා |

| | | |
|---|---|---|
| 3 | ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය පී. පී. ආර්. පෙරේරා මයා |
| 4 | පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය පී. එච්. කේ. අයි. එස්. රණසිංහ මිය |
| 5 | ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්. එම්. වීරසේකර මිය |
| 6 | ව්‍යාධි විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එච්. ඩබ්. සී. කේ කුලතිලක මිය |
| 7 | භිෂග්වේද අධ්‍යයනාංශය | මහාචාර්ය පී.ඒ.පී.ජී. ජයවර්ධන මිය (29.02.2020 දක්වා)<br>මහාචාර්ය සී.ඒ.වනිගතුංග (01.03.2020 සිට) |
| 8 | ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය | වෛද්‍ය බී.සී.වී. සේනාරත්න මයා |
| 9 | අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ධම්මිකා ආරියරත්න මිය |
| 10 | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | මහාචාර්ය ජේ.ඉන්ද්‍රකුමාර් මයා |
| 11 | ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය | වෛද්‍ය කේ. සී. ඩී. පී. සිල්වා මයා |
| 12 | ළමා රෝග විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය රුවන්ති පෙරේරා |
| 13 | ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය බී.ඩී.ගමගේ (30.05.2020 දක්වා)<br>මහාචාර්යය ආලෝක පතිරණ (01.06.2020 – 16.11.2020)<br>මහාචාර්යය දීපිකා වීරසේකර (17.11.2020 සිට) |
| 14 | මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ජයමාල් ද සිල්වා මයා |
| 15 | පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ටී. එස්. පී. සමරනායක මිය |
| 16 | වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය | වෛද්‍ය ආර්. බී. මාරසිංහ මයා |
| 17 | ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය අධ්‍යයනාංශය | මහාචාර්යය නීලිකා මලවිගේ මහත්මිය |

## පීඨය මඟින් පිරිනමන උපාධි හා පශ්චාද් උපාධි ඩිප්ලෝමා

**පිරිනමනු ලබන උපාධි**

වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය

විද්‍යාවේදී මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය

**ඩිප්ලෝමා**

උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා

අධිකරණ වෛද්‍ය විද්‍යාව හා විෂ වේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

## 2019 හා 2020 වසර වල ප්‍රතිඵල සැසඳීම

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | | දෙවන පෙළ ඉහළ | | දෙවන පෙළ පහළ | | සාමාන්‍ය සාමාර්ථ | | සමත් සම්පූර්ණ සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර | 2019 වසර | 2020 වසර |
| වෛද්‍යවේදි ශල්‍යවේදි උපාධිය | 09 | 07 | 43 | 31 | 62 | 45 | 56 | 61 | 170 | 144 |
| ඖෂධවේදී ගෞරව උපාධිය | - | 02 | 03 | 06 | 04 | 06 | 15 | 09 | 22 | 23 |
| විද්‍යාවේදි හෙද ගෞරව උපාධිය | 01 | - | 04 | 03 | 05 | 04 | 13 | 13 | 23 | 20 |
| විද්‍යාවේදි වෛද්‍ය රසායනාගාර විද්‍යා ගෞරව උපාධිය | 04 | 02 | 10 | 06 | 07 | 07 | 04 | 13 | 25 | 28 |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | අනධ්‍යයන කාර්යය |
|---|---|---|---|
| වෛද්‍යවේදි හි ශල්‍යවේදි | 938 | 119 | 139 |
| විද්‍යාවේදි මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය | 9 | | |
| මුළු සංඛ්‍යාව | **1267** | **119** | **139** |

## දේශිය ශිෂ්‍ය විස්තරය - 2020

| පාඨමාලාව | මාධ්‍යයය | සිසුන් සංඛ්‍යාව | | | | | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | | 1වන | 2 වන | 3 වන | 4 වන | 5 වන | |
| වෛද්‍යවේදි හි ශල්‍යවේදි | ශ්‍රේණිය | 161 | 162 | 161 | 148 + 155 | 152 | 144 |
| විද්‍යාවේදි මානව ජීව විද්‍යා (විශේෂ) උපාධිය | | 5 | - | | 5 +4 | - | - |
| මුළු සංඛ්‍යාව | | **253** | **249** | **235** | **385** | **152** | **96** |

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2 | කථිකාචාර්ය | ආධුනික කථිකාචාර්ය | කාවකාලික කථිකාචාර්ය | උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යූහ විද්‍යා | 01 | | 01 | 02 | 02 | | 03 | - | - | |
| කායික විද්‍යා | - | 02 | 01 | - | 04 | 01 | 03 | - | - | 12 |
| ජෛව රසායන විද්‍යා | 03 | 04 | - | 01 | - | - | 02 | - | - | 10 |
| පරපෝෂ විද්‍යා | - | 01 | - | 2 | - | - | 03 | - | - | 06 |
| ක්ෂුද්‍ර ජීව විද්‍යා | 02 | - | - | 05 | - | - | 01 | 01 | - | 08 |
| ව්‍යාධි විද්‍යා | - | - | 01 | 07 | - | - | 02 | - | - | 09 |
| භිෂග්වේද | - | 04 | | - | 02 | - | 02 | | | 08 |
| ප්‍රජා වෛද්‍ය | - | 02 | - | 01 | 01 | - | 03 | - | 01 | 08 |
| අධිකරණ වෛද්‍ය විද්‍යා | - | 01 | | 04 | - | - | - | - | - | 05 |
| වෛද්‍ය විද්‍යා | 01 | 01 | - | 03 | 03 | - | - | - | - | 07 |
| ප්‍රසව හා නාරීවේද | - | 01 | - | - | 04 | - | - | - | - | 05 |
| ළමා රෝග විද්‍යා | - | 02 | - | 03 | - | 01 | - | - | - | 06 |
| ශල්‍ය වෛද්‍ය විද්‍යා | - | 05 | - | - | 01 | 01 | - | - | - | 07 |
| මනෝ වෛද්‍ය විද්‍යා | 01 | - | - | 01 | 06 | - | 01 | - | - | 07 |
| පවුල් වෛද්‍ය විද්‍යා | - | 01 | - | - | 01 | 01 | 02 | - | | 06 |
| වෛද්‍ය අධ්‍යාපන | - | 01 | - | - | | - | 1 | - | - | 02 |
| ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය විද්‍යා | - | 01 | - | - | 01 | - | - | - | - | 02 |
| සම්පත් මධ්‍යස්ථානය | - | - | - | - | - | 01 | 01 | 01 | - | 03 |
| **මුළු සංඛ්‍යාව** | **08** | **26** | **3** | **28** | **25** | **05** | **24** | **2** | **01** | **119** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය – 2020

| අධි ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුලු සේවක කාර්ය මණ්ඩලය | එකතුව |
|---|---|---|---|---|
| 09 | 26 | 45 | 59 | 139 |

## පර්යේෂණ නවොත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020

| විෂය | ප්‍රකාශන | වාණිජකරණයකල | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| පර්යේෂණ ප්‍රමාණය | 62 | - | 48 |
| නවෝත්පාදන ප්‍රමාණය | 3 | 6 | 3 |

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීයව ප්‍රකාශයට පත් කරන ලද | විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | 5 | 48 |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | 27 | 5 |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | 81 | 18 |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | - | - |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | 1 | - |

## ප්‍රදාන පිළිබඳ විස්තර – 2020

| විෂය | ප්‍රදාන ගණන |
|---|---|
| දේශීය ප්‍රදාන | 4 |
| ජාතික ප්‍රදාන | 8 |
| අන්තර්ජාතික ප්‍රදාන | - |
| වෙනත් ප්‍රදාන | 2 |
| **එකතුව** | **14** |

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය




1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48අ වගන්තිය යටතේ 1996 ජනවාරි මාසයේ විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ උපාධි අධ්‍යයන පීඨය ආරම්භ කරන ලදි. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුව, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ උසස් උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ගැනීමට මඟ පෙන්වන අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය බවට මෙම පීඨය පත්ව තිබෙන අතර ‘‘දිවයින තුළත්, ඉන් පිටත දීත් උසස් ඉගනුම්, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථීර වශයෙන් ම ස්ථාපනය වීම’’ මෙම පීඨයේ දැක්ම වේ.

උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන පීඨාධිපතිවරයෙකු උපාධි අධ්‍යයන පීඨයේ ප්‍රධානත්වය දරයි. මෙහෙයුම් අංශයේ ප්‍රධානියා වශයෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයකු කටයුතු කරන අතර සහකාර මූල්‍යාධිකාරිවරයා මූල්‍ය අංශයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

පශ්චාද් උපාධි පීඨයේ අධ්‍යයන කටයුතු අධ්‍යයන මණ්ඩල 9 ක් හරහා පවත්වනු ලබන අතර ඒවා විශ්ව විද්‍යාලයේ අනෙකුත් පීඨ හා අධ්‍යයනාංශ සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරනු ලබයි. මෙම අධ්‍යයන මණ්ඩල වන්නේ මානව ශාස්ත්‍ර, සමාජ විද්‍යා, ජීවී විද්‍යා, භෞතික විද්‍යා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ, වෛද්‍ය විද්‍යා, බහුවිධ අධ්‍යයන, ඉංජිනේරු සහ තාක්ෂණය ය. පීඨය ය විසින් සපයනු ලබන වැඩසටහන් අතර සහතික පත්‍ර පාඨමාලා, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, වසර 1ක ශාස්ත්‍රපති උපාධි, පාඨමාලා වැඩ සහ පර්යේෂණ අනුව ශාස්ත්‍රපති උපාධි සහ පර්යේෂණ මගින් පමණක් උසස් උපාධි පාඨමාලා ඇතුළත් වේ. රටේ උසස් අධ්‍යාපනයේ මිණුම් ලකුණක් වන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) ඔස්සේ සියලුම වැඩසටහන් පෙළගස්වා ඇත.

උපාධි අධ්‍යයන පීඨය මගින් පිරිනමනු ලබන පාඨමාලා සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමු (SLQF) මට්ටම් සහ එම පාඨමාලා සඳහා ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් පහත දැක්වේ.

| **ශ්‍රී ලංකා සුදුසුකම් රාමු මට්ටම් (SLQF** | **පිරිනමනු ලබන සුදුසුකම්** | **අධ්‍යයන සම්භාර ගණන / අධ්‍යයන කාල සීමාව** | **යෝග්‍යත්ව** |
|---|---|---|---|
| 7 | පශ්චාද් උපාධි සහතික පත්‍ර | 20 | SLQF 5 හෝ 6 |
| 8 | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | 25 | SLQF 5 හෝ 6 |
| 9 | පාඨමාලා කටයුතු අනුව ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය | 30 | SLQF 5 හෝ 6 |
| 10 | පාඨමාලා කටයුතු සහ පර්යේෂණ මගින් ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය | 60 | SLQF 5 හෝ 6 |
| 11 | පර්යේෂණ මගින් ලබා දෙන ශාස්ත්‍රපති උපාධිය (MAR) | දෙවසරක පූර්ණ කාලීන | SLQF 5 හෝ 6 |
| 11 | දර්ශනපති උපාධිය (M Phil) | දෙවසරක පූර්ණ කාලීන | SLQF 6 හා ඉහල |
| 12 | දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධිය (PhD) තෙවසරක පූර්ණ කාලීන | තෙවසරක පූර්ණ කාලීන | SLQF 6 හා ඉහල |

උපාධි අධ්‍යයන පීඨය මගින් පිරිනමනු ලබන සියලුම පාඨමාලා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව - 2015 ට (SLQF - 2015) ගැළපෙන පරිදි සම්පාදනය කර ඇත. ඉගෙනීමේ ප්‍රධාන විෂය හතර වන දැනුම, කුසලතා, ආකල්ප සහ මනෝ විභිතිය සහ ආදර්ශය K-SAM ආකෘතිය මගින් විදහා දැක්වේ. මෙම ඉගනුම් ඵල සාක්ෂාත් කර ගත හැකි වන පරිදි සියලුම පාඨමාලා සකස් කර ඇත. ඉගෙනුම් ඵලවල ප්‍රධාන ක්ෂේත්‍ර සහ කාණ්ඩ පහත දැක්වේ

| ප්‍රධාන ක්ෂේත්‍රය | **ඉගෙනුම් ඵල කාණ්ඩ** |
|---|---|
| දැනුම | දැනුම |
| | ප්‍රායෝගික දැනුම සහ භාවිතය |

| | |
|---|---|
| කුසලතා | සන්නිවේදනය |
| | සාමූහික ප්‍රයත්නය සහ නායකත්වය |
| | නිර්මාණශීලීතාව සහ ගැටළු විසඳීම |
| | කළමනාකරණ සහ ව්‍යවසායකත්වය |
| | තොරතුරු භාවිතය සහ කළමනාකරණය |
| | ජාල කරණය සහ සමාජීය කුසලතා |
| | අනුවර්ත්‍යතාව සහ නම්‍යතාව |
| ආකල්ප, සාරධර්ම, වෘත්තීය දක්ෂතා, ජීවන දර්ශනය | ආකල්ප, සාරධර්ම, වෘත්තීය දක්ෂතා, |
| | ජීවන දර්ශනය |
| මනෝ විහිතිය සහ ආදර්ශය | ස්වයං යාවත්කාලීන කිරීම / ජීවිත කාලය පුරා ඉගෙනීම |

## ශිෂ්‍ය තොරතුරු - 2020

විවිධ උපාධි/ඩිප්ලෝමා/සහතික වැඩසටහන් වල ලියාපදිංචි වූ මුළු සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| අධ්‍යයන වැඩසටහන | |
|---|---|
| **සහතිකපත්‍ර පාඨමාලාව** | |
| සංස්ථාපිත පාරිසරික තිරසාර භාවය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍ර පාඨමාලාව | 4 |
| සමෝධානිත අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි සහතික පත්‍රය | 46 |
| **උප එකතුව** | **50** |
| **පශ්චාද් උපාධි ඩිප්ලෝමා (PG. Dip....)** | |
| ලේඛකත්ව සහ ජන සන්නිවේදනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 10 |
| අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 98 |
| අලෙවිකරණ කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 58 |
| අධීක්ෂණ හා ඇගයීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 9 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 62 |
| සමාජ විද්‍යා පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 5 |
| **උප එකතුව** | **242** |
| **විද්‍යාපති/ශ්‍රාස්ත්‍ර උපාධිය (MSc, MA, MBA,.විද්‍යාපති, ශාස්ත්‍රපති, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය)** | |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 56 |
| ව්‍යවසායකත්ව **විද්‍යාපති** උපාධිය | 174 |
| වෘත්තීය ගිණුම්කරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (MPAcc) | 96 |
| රාජ්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 21 |
| කළමනාකරණය පිළිබඳ විද්‍යාපති/ව්‍යාපාර කළමනාකරණ උපාධිය | 643 |
| ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධි | 26 |
| පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 100 |
| ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 6 |

| | |
|---|---|
| ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 26 |
| වන විද්‍යා හා පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 67 |
| භූගෝලීය විද්‍යා තොරතුරු පද්ධතිය සහ දූරස්ථ සංවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 214 |
| කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 140 |
| කාර්මික ගණිතය පිළිබඳ විද්‍යාපති උපාධිය | 17 |
| අධ්‍යාපනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 |
| බහු අවයවික විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 135 |
| රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 20 |
| දේපළ වෙළඳාම් කළමනාකරණය සහ තක්සේරු කරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 47 |
| දෙවන බස ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 59 |
| ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය | 146 |
| සිංහල පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 1 |
| සංස්කෘතික අධ්‍යයන පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති | 1 |
| මනෝවිද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 4 |
| බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| බුද්ධ දර්ශනය පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 1 |
| දර්ශනය පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 3 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| සමාජ විද්‍යාව පිළබඳ ශාස්ත්‍රපති උපාධිය | 2 |
| අපරාධ විද්‍යාව පිළිබඳ උපදිෂ්ට ශාස්ත්‍රපති උපාධිය | 38 |
| **උප එකතුව** | **2047** |
| **දර්ශනපති උපාධිය** | |
| පුරාවිද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| ජන සන්නිවේදනය පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| කායික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 5 |
| මානව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 11 |
| උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 6 |
| බෞද්ධ ශිෂ්ටාචාරය පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 9 |
| රසායන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 20 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| සංස්කෘතික අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය | 6 |
| ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| ඉංග්‍රීසි පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| ආහාර විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 6 |
| වන විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| භූගෝල විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 6 |
| ගණිතය පිළිබඳ දර්ශනපති උපාධිය | 7 |
| වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 7 |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 10 |
| බහුවිධ දර්ශනපති උපාධිය | 11 |
| සංගීතය පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |

| | |
|---|---|
| පාලි භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| පරපෝෂිත විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 2 |
| දර්ශනය පිළිබඳ දර්ශනපති උපාධිය | 12 |
| භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 9 |
| කායික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 4 |
| සංස්කෘත භාෂාව පිළිබඳ දර්ශනපති උපාධිය | 3 |
| සිංහල පිළිබඳ දර්ශනපති උපාධිය | 6 |
| සමාජ විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 1 |
| සංඛ්‍යාලේඛන දර්ශනපති උපාධිය | 1 |
| සත්ව විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | 8 |
| **උප එකතුව** | **182** |
| **ආචාර්ය උපාධි (දර්ශනශූරී, DSc, MD, MS,...)** | |
| කායික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය | 1 |
| උද්භිද විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 5 |
| අපරාධ විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| ඉංග්‍රීසි පිළිබඳ දර්ශනශූරි උපාධිය | 2 |
| ආහාර විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 14 |
| වන විද්‍යා හා පාරිසරික කළමනාකරණය පිළිබඳ දර්ශනශූරි | 5 |
| භූගෝල විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| කළමනාකරණය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 114 |
| ජන සන්නිවේදනය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍ය විද්‍යා පිළිබඳ දර්ශනශූරි | 5 |
| ජෛව රසායන විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 2 |
| බහුවිෂයික දර්ශනශූරි උපාධිය | 9 |
| දර්ශනය පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| භෞතික විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 1 |
| කායික විද්‍යාව පිළිබඳ දර්ශනශූරි | 2 |
| සංඛ්‍යාලේඛන දර්ශනශූරි උපාධිය | 1 |
| සත්ව විද්‍යාව පිළිබඳ දර්ශනශූරි උපාධිය | 3 |
| **උප එකතුව** | **175** |
| **මුළු එකතුව** | **2696** |

## උපාධි අධ්‍යයන පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව

පීඨ උපාධි අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත, 2019 ජනවාරි 31 වන දින පැවති 368 වැනි සෙනෙට් සභාවේදී, අදාළ සෙනෙට් සභිකයින් විසින් උපාධි අධ්‍යයන පීඨයේ වෛද්‍ය නොවන පර්යේෂණ සඳහා ආචාර ධර්ම සමාලෝචන කමිටුවක් (ERC) අනුමත කිරීම සඳහා වූ යෝජනාවක් පිළිගෙන නිර්දේශ කර ඇත. උපාධි අධ්‍යයන පීඨය තුළ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා සහ සත්ව අධ්‍යයනය සඳහා ආචාර ධර්ම සමාලෝචන කමිටු දෙකක් පිහිටුවන ලදී. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සකස්කර කර ඇති අතර එය 2021 ජනවාරි මාසයේදී උපාධි අධ්‍යයන පීඨයේ පීඨ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක රචනය පිළිබඳ සහතික පත් පාඨමාලාව

පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක රචනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2020 ජූලි 20 සිට ඔක්තෝබර් 05 දක්වා සාර්ථකව පවත්වන ලදී. සිසුන් 262 ක් මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ඇති අතර සිසුන් 180 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

## බහුවිෂයීක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය

බහුවිෂයීක ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, 2020 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී 2020 දෙසැම්බර් 08 සහ 09 යන දිනවල පැවැත්විණි. මෙම සමුළුවේ තේමාව වූයේ "කොවිඩ්-19 විසින් ජාතික සහ ගෝලීය සංවර්ධනය ක්‍රියාවලියට එල්ල කරන ලද අභියෝග ජය ගැනීම සඳහා බහුවිෂයීක ප්‍රවේශය " යන්නයි. කොවිඩ්-19 මාර්ගෝපදේශයන්ට අනුකූලව සීමිත සහභාගීත්වයකින් යුතුව මෙහි සමාරම්භක උත්සවය අලුතින් විවෘත කරන ලද මණ්ඩල ශාලාවේ දී පවත්වන ලදී. තාක්ෂණික සැසි සූම් තාක්ෂණය හරහා මාර්ගගතව පවත්වන ලදී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා විය. මෙම සමුළුවේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නේවාසික නියෝජිත රොබට් ජුන්කම් මහතා සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයිනේ යුරෝපා සංගමයේ නියෝජිත පිරිසේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී ත්‍රොස්ටන් බැග්ප්‍රිඩේ මහතා විසින් ආරාධිත දේශන දෙකක් පවත්වන ලදී. උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම්. එම්. පත්මලාල් මහතා මෙම බහුවිෂයීක ප්‍රවේශයන් පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර සමුළුවේ මුලසුන දැරීය.

බහුවිෂයීක ප්‍රවේශයන් පිළිබඳ 7 වැනි ජාත්‍යන්තර සමුළුව, 2020 සඳහා පර්යේෂණ උපුටන 162 ක් ලැබුණු අතර සම්මන්ත්‍රණ අධ්‍යයන කමිටුව විසින් ඒවා පිරික්සීම සිදු කරන ලදී. මෙම උපුටන විශේෂඥයින් විසින් සමාලෝචනය කරන ලද අතර ප්‍රකාශනය සඳහා පර්යේෂණ පත්‍රිකා 120 ක් තෝරා ගන්නා ලදී. පිළිගන්නා ලද ප්‍රකාශන පහත තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍ර හයට අනුකූල විය.

1. ඉංජිනේරු, තාක්ෂණ සහ භෞතික විද්‍යා
2. සෞඛ්‍ය විද්‍යා සහ පෝෂණය
3. පරිසර දූෂණය සහ ස්වභාවික සම්පත් කළමනාකරණය
4. ස්වභාවික හා ජීව විද්‍යාව
5. කළමනාකරණය, වාණිජ සහ කර්මාන්ත සංවර්ධනය
6. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා

සම්මන්ත්‍රණයේ සමාරම්භක උත්සවයෙන් අනතුරුව පහත සඳහන් සම්පත් දායකයින් විසින් තේමා සාකච්ඡා දෙකක් පවත්වන ලදී.

තේමා කථිකාව, මහාචාර්ය කේ.කේ.ඩී.එස්. රණවීර
ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මාතෘකාව: "වෛරස් ආසාදන වලට එරෙහිව ක්‍රියාකාරී ආහාර"

තේමා කථිකාව, මහාචාර්ය නීලිකා මලවිගේ
අධ්‍යක්ෂ, ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානය
මාතෘකාව: "කොවිඩ්-19 ට එරෙහිව සටන් කරමු: අපට සාර්ථක විය හැකිද?"

## බහු විෂයීක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව

බහු විෂයීක අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර සඟරාව වනාහි පර්යේෂකයන්ට සිය බහුවිධ පර්යේෂණ කටයුතු ඉදිරිපත් කිරීමට තැනුන වේදිකාවකි. මෙය ද්විවාර්ෂික සඟරාවක් වන අතර එහි 7 වන වෙළුමේ කලාප දෙකක් 2020 ජූලි සහ දෙසැම්බර් මාසවලදී ප්‍රකාශයට පත් කරන ලදී.

## නව පශ්චාත් උපාධි පාඨමාලා

2020 වර්ෂයේ දී පහත සඳහන් පාඨමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

- ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
- ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධි පාඨමාලාව
- රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
- රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ව්‍යවහාරික සංඛ්‍යාලේඛන පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ව්‍යවහාරික සංඛ්‍යාලේඛන පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත් පාඨමාලාව
- දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

## තාක්ෂණ පීඨය



ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතර 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙන ලද අ.පොෂ. උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව සඳහා තාක්ෂණික පීඨයක් ස්ථාපනය කිරීමේ වගකීමට උරදීම සඳහා ප්‍රථමයෙන් ම ඉදිරිපත් වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයයි. මේ සඳහා සකස් කරන ලද තාක්ෂණික අධ්‍යයන පටිපාටිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් 2015 සැප්තැම්බර් 23 වන දින විශ්ව විද්‍යාල පාලක සභාවට නිර්දේශ කරන ලද අතර එයට 2015 ඔක්තෝබර් මස 08 වන දින කරන ලද නිර්දේශය පරිදි 2015 නොවැම්බර් මස 19 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාව විසින් අනුමත කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ඇතුළු කණ්ඩායමේ ඉමහත් කැපවීම මත ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 27(01) වගන්ති ප්‍රකාරව ප්‍රකාශයට පත් කරන ලද 2016 ජනවාරි 08 වන දින අංක 1948/59 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තාක්ෂණික පීඨය පිහිටුවන ලදී.

මූලික අදියරේදී තාක්ෂණ පීඨය නුගේගොඩ තාවකාලික පරිශ්‍රයක ස්ථාපිත කර පසුව පිටිපන ටෙක්නෝ පාර්ක් හි ස්ථිර ස්ථානයකට ගෙන යන ලදී. අංගසම්පූර්ණ නව පීඨ පරිශ්‍රය 2020 ජුනි 8 වන දින අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් විවෘත කරන ලදී.

2020 දී, නව ප්‍රධාන අධ්‍යයනාංශ තුනක් පිහිටුවීමට පීඨයට අවසර ලැබී ඇති අතර තාක්ෂණ පීඨය ප්‍රධාන අධ්‍යයනාංශ පහකින් සමන්විත වන අතර 2020 වර්ෂය තුළ අදාළ අධ්‍යයනාංශ ප්‍රධානීන් පහත පරිදි වේ.

| | |
|---|---|
| **පීඨාධිපති** | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය සුදන්ත ලියනගේ මහතා<br>( සැප්තැම්බර් මස 09 දක්වා)<br>ආචාර්යය ඒ.එච්.එල්.ආර්.නිල්මිණි මහත්මිය<br>(2020 සැප්තැම්බර් 09 සිට) |

| | **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධාන** |
|---|---|---|
| (i) | ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය | අචාර්යය රන්දිකා ජයසිංහ මහත්මිය |
| (ii) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | අචාර්ය බී.එන්.එස්.ලංකාසේන මහතා |
| (iii) | සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | අචාර්යය එන්.ඒ.වීරසේකර මහතා |
| (iv) | ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | අචාර්යය රංජිත් ගුණරත්න මහතාD |
| (v) | තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය | අචාර්යය කේ.පී.සී. නිලාෂා මහත්මිය |

මෙම අධ්‍යයනාංශ විසින් ශ්‍රී ලංකාවේ ඉහළ ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රවලට අදාළ තාක්ෂණවේදී ගෞරව උපාධි පිරිනමනු ලබයි. මෙම උපාධි වැඩසටහන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) 6 වන මට්ටමින් පිරිනමනු ලබන පූර්ණ කාලීන සිවි අවුරුදු වෘත්තීය උපාධි වැඩසටහන් වේ.

**පීඨය විසින් පිරිනමනු ලබන උපාධි**

01. ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය
02. ජෛව පද්ධති තාක්ෂණවේදී උපාධිය
03. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය

**ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයනාංශය** විසින් ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි (BBST) වැඩසටහන් පවත්වනු ලබයි. ශ්‍රී ලංකා ජාතික ජෛව තාක්ෂණ කර්මාන්ත සංගමය (NBIA) විසින් ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධි වැඩසටහන් ප්‍රතීතනය කරනු ලැබේ. ජෛව පද්ධති තාක්ෂණ වැඩසටහන මඟින් ආහාර සැකසුම් තාක්ෂණය, කෘෂිකර්මාන්ත සහ පරිසර තාක්ෂණය සහ කාර්මික ජෛව පද්ධති තාක්ෂණය යන කේන්ද්‍රගත අංශ තුනකින් නිපුණ උපාධිධාරීන් බිහි කරනු ඇත.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයනාංශය** විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධි වැඩසටහන පවත්වයි. ශ්‍රී ලංකා පරිගණක සංගමය (CSSL) විසින් මෙම උපාධි වැඩසටහන ප්‍රතීතනය කරනු ලැබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වැඩසටහන මඟින් මෘදුකාංග තාක්ෂණය, බහුමාධ්‍ය තාක්ෂණය සහ ජාල තාක්ෂණය යන කේන්ද්‍රීය අංශ තුනෙහි නිපුණ උපාධිධාරීන් බිහි කරනු ඇත.

සිසුන් විශ්වීය මට්ටමේ සිවිල් සහ පාරිසරික තාක්ෂණ පරිචයන් සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවන්ගෙන් සන්නද්ධ කිරීමේ අදහස පෙරදැරිව සිවිල් හා **පාරිසරික තාක්ෂණ අධ්‍යයනාංශය** 2020 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. මෙම අධ්‍යයනාංශය විසින් ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ ගෞරව උපාධි වැඩසටහන පිරිනමනු ලබයි. ඉංජිනේරු තාක්ෂණ වැඩසටහන මඟින් ඉදිකිරීම් සහ ගොඩනැගිලි සේවා තාක්ෂණය, බලශක්ති සහ පාරිසරික තාක්ෂණය සහ භූ තාක්ෂණය යන කේන්ද්‍රීය අංශ තුනෙහි නිපුණ උපාධිධාරීන් බිහි කරනු ඇත.
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන් පිළිගැනීමේ අත්පොත මඟින් මෙම විෂයමාලා මෙහෙයවනු ලැබේ.

**ද්‍රව්‍ය සහ යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය** 2020 වර්ෂයේ දී පිහිටුවන ලදී. මෙම අධ්‍යයනාංශය විසින් ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධි වැඩසටහන පිරිනමනු ලබයි. ඉංජිනේරු තාක්ෂණ වැඩසටහන මඟින් මෙකැට්‍රොනික් තාක්ෂණය, ඔටෝ මොබයිල් තාක්ෂණය සහ පොලිමර් සැකසුම් තාක්ෂණය යන ක්ෂේත්‍ර තුනෙහි දක්ෂ උපාධිධාරීන් බිහි කරනු ලැබේ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ඉංජිනේරු තාක්ෂණ උපාධි වැඩසටහන් පිළිගැනීමේ අත්පොත මඟින් මෙම විෂයමාලා මෙහෙයවනු ලැබේ.

උපාධි පාඨමාලා තුනේ පළමු සහ දෙවන සමාසික අධ්‍යයන වාවරවලට අදාළ සියලුම වැඩසටහන් පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කරමින් **තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය** 2020 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. අධ්‍යයන වැඩසටහනේ පළමු වසර දෙක ප්‍රධාන වශයෙන් රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ගණිතය සහ මූලික පරිගණක කුසලතා, ඉංග්‍රීසි සහ කළමනාකරණ විෂයයන්ගෙන් සමන්විත වේ. ප්‍රතීතන අත්පොත් වල මාර්ගෝපදේශ වලට අනුව, සිසුන්ට සිය පළමු වසර අධ්‍යයන කාලය තුළ කුඩා ව්‍යාපෘතියක නිරත විය යුතුය. දේශන පැවැත්වීමට අමතරව පළමු වසර සිසුන් සඳහා කුඩා ව්‍යාපෘති පැවැත්වීමේ වගකීම තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශයට පැවරී ඇත.

## 2020 වසර සඳහා පීඨයෙන් නිකුත් කරන ලද ප්‍රතිඵල විස්තරය

| උපාධි පාඨමාලාව | පළමු පෙළ | දෙවන පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | සාමාන්‍ය සාමාර්ථ | සමත් සම්පූර්ණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ උපාධිය | මේ වනතුරු සිසුන් උපාධි ආවසන් කර නොමැත) | | | | |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ උපාධිය | | | | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපාධිය | | | | | |

## ශිෂ්‍ය සම්පත් විස්තරය - 2020

| උපාධි පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අනධ්‍යයන කාර්යය | අනධ්‍යයන කාර්යය |
|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය | 238 | 19 | 8 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | 224 | 11 | 6 |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | 245 | 15 | 6 |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | 240 | 19 | 6 |
| තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය | 323 | 7 | 1 |
| පීඨ කාර්යයාලය | අදාල නොවේ | | 17 |

## දේශීය සිසුන් පිළිබඳ තොරතුරු 2020

| පාඨමාලා | මාධ්‍යයය | **2020** බඳවා ගැනීම් | සිසුන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | **1** වන වසර | **2** වන වසර | **3** වන වසර | **4** වන වසර |
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය | ඉංග්‍රීසි | - | - | 82 | 86 | 83 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | ඉංග්‍රීසි | - | - | 75 | 72 | 71 |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | ඉංග්‍රීසි | - | - | 153 | 156 | 145 |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | ඉංග්‍රීසි | | | | | |
| තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය | ඉංග්‍රීසි | 323 | 323 | - | - | - |

*සටහන: ප්‍රථම කණ්ඩායම 2021 වසරේදී උපාධිය සම්පූර්ණ කිරීමට නියමිතය*

## අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020

| අධ්‍යයනාංශය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2 | තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | තාවකාලික කථිකාචාර්ය | අංශුනික කථිකාචාර්ය | තාවකාලික කථිකාචාර්ය /සහාය | තාවකාලික උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය | - | - | 16 | - | 3 | - | - | - | - | **19** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය | - | 1 | 7 | - | 2 | 2 | - | - | - | **12** |
| සිවිල් හා ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයනාංශය | - | 3 | 7 | - | - | 3 | 1 | -- | 1 | **15** |
| ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනාංශය | 1 | 1 | 7 | | - | 4 | 4 | | 1 | **18** |
| තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය | - | - | 2 | 1 | -- | 2 | - | 2 | - | **7** |
| **එකතුව** | **1** | **5** | **40** | **1** | **5** | **11** | **5** | **2** | **2** | **71** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020

| පීඨය | ජ්‍යෙෂ්ඨතම කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුලු සේවක කාර්ය මණ්ඩලය | එකතුව |
|---|---|---|---|---|---|
| තාක්ෂණ පීඨය | 1 | 4 | 21 | 18 | **44** |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ විස්තර – 2020

| විෂය | ප්‍රකාශන | වාණිජකරණයකල | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| පර්යේෂණ ප්‍රමාණය | 9 | - | 2 |
| නවෝත්පාදන ප්‍රමාණය | - | 1 | - |

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීයව ප්‍රකාශයට පත් කරන ලද | විදේශීයව ප්‍රකාශයට පත් කරන ලද |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **-** | **24** |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **-** | **5** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | **11** | **7** |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | **-** | **6** |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | **-** | **2** |

## ප්‍රදාන පිළිබඳ විස්තර – 2020

| විෂය | ප්‍රදාන ගණන |
|---|---|
| දේශීය ප්‍රදාන | 2 |
| ජාතික ප්‍රදාන | - |
| වෙනත් ප්‍රදාන | 1 |
| ත්‍යාග හා රන් පදක්කම් | |
| **එකතුව** | **3** |

## ඉන්ජිනේරු පීඨය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු විද්‍යා පීඨය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පාලනය වන රාජ්‍ය විශ්වවිද්‍යාල සතු නවතම ඉංජිනේරු පීඨය වේ. 2016 ජනවාරි මසදී පිහිටුවන ලද මෙම ඉංජිනේරු පීඨය "විද්‍යාවේදී ඉංජිනේරු" පිළිබඳ උපාධිය ප්‍රදානය කිරීමට හා ප්‍රධාන පෙළේ ඉංජිනේරු අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කිරීමට වරමක් ලත් අධ්‍යයනාංශ පහකින් සමන්විත වේ.

මෙම ඉංජිනේරු පීඨය පහත සඳහන් පරිදි අධ්‍යයන දෙපාර්තමේන්තු පහකින් සමන්විත වේ

**පීඨාධිපති** **ආචාර්යය කේ.එම්.සී. කොන්තසිංහ මයා**

| **අධ්‍යයනාංශය** | **අධ්‍යයනාංශ ප්‍රධානීන්** |
|---|---|
| 1. සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය ජී. එන්. සමරසේකර මහතා |
| 2. පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය ඩී. එම්. ආර්. දිනලංකාර මහතා |
| 3. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය සී. ද අල්විස් මහතා |
| 4. විෂයාන්තර අධ්‍යයනාංශය | අචාර්යය එච්.එම්.වී.ඩී.වයි මුදුන්කොටුව මහතා |
| 5. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | ආචාර්ය පී.එම්.ටී. බණ්ඩාර මහතා |

## පීඨය මඟින් පිරිනමන උපාධි හා ඩිප්ලෝමා පඨමාලා

උපාධි විද්‍යාවේදී ඉන්ජිනේරු උපාධිය

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| විද්‍යාවේදී ඉන්ජිනේරු උපාධිය | 472 | ස්ථීර | තාවකාලික | 46 |
| | | 16 | 54 | |

## දේශීය සිසුන් පිළිබඳ විස්තර - 2020

| පාඨමාලාව | මාධ්‍යය | වසර | | | |
|---|---|---|---|---|---|
| | | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර |
| විද්‍යාවේදී ඉන්ජිනේරු උපාධිය | ඉංග්‍රීසි | 120 | 117 | 117 | 118 |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය - 2020

| විෂය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය (තාවකාලික) | තාවකාලික කථිකාචාර්ය/ උපදේශක/ | එකතුව |
|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | 5 | 5 | 7 | 17 |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | 3 | 3 | 5 | 11 |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | 5 | 5 | 5 | 15 |
| විෂයාන්තර අධ්‍යයනාංශය | - | 4 | 5 | 9 |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | 3 | 7 | 7 | 17 |
| **එකතුව** | **16** | **24** | **29** | **69** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ | **කනිෂ්ඨ සේවක** | **එකතුව** |
|---|---|---|---|---|
| පීඨ කාර්යයාලය | 2 | 9 | 8 | 19 |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය | - | 3 | 3 | 6 |
| පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය | - | 3 | 3 | 6 |
| විෂයාන්තර අධ්‍යයනාංශය | - | 1 | 1 | 2 |
| විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය | - | 4 | 3 | 7 |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය | - | 3 | 3 | 6 |
| **එකතුව** | **2** | **23** | **21** | **46** |

## සිදු කරන ලද පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය ප්‍රකාශිත | විදේශීය ප්‍රකාශිත |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **2** | **12** |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **-** | **-** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | **6** | **6** |

## සම සෞඛ්‍ය විද්‍යා පීඨය- 2020



සෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ 8 වන පීඨය ලෙස 2019 දී ආරම්භ කරන ලදී. වෛද්‍ය විද්‍යා පීඨයේ සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයනාංශය යටතේ වසර 15 කට ආසන්න කාලයක් තිස්සේ පවත්වන ලද උපාධි පාඨමාලා මේ වන විට අලුතින් පිහිටුව ලද මෙම පීඨය යටතේ පවත්වා ගෙන යනු ලබයි. හෙද හා වින්නඹු මාතා, ඖෂධවේද හා වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශ මේ යටතේ පිහිටුවා ඇත. අනාගතයේ දී සම සෞඛ්‍ය විද්‍යා පීඨයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව ඉහල නැන්වීමටත් නව පාඨමාලා හදුන්වා දීමටත්

බලාපොරොත්තුවේ. දෘෂ්ටි වේදය එවැනි නව උපාධි පාඨමාලාවකි විද්‍යා වේදී දෘෂ්ටිවේදය පළමු වරට රාජ්‍ය විශ්ව විද්‍යාලයක් විසින් ලබා දෙන දෘෂ්ටි විද්‍යාව පිළිබඳ උපාධියයි.

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වර්තමාන අධ්‍යයනාංශ හා අධ්‍යයනාංශ ප්‍රධානීන් පහත පරිදි වේ.

**පීඨාධිපති** ජ්‍යෙෂ්ඨ මහාචාර්යය ඩී.එම් .එස් ෆර්නැන්ඩු මහත්මිය

| **අධ්‍යයනාංශය** | **අධ්‍යයන ප්‍රධානීන්** |
|---|---|
| හෙද හා වින්නඹු මාතා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.කේ.ඩී.එල් මීගොඩ මහත්මිය |
| ඖෂධ වේදය හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය එම්.ඩී.ජේ.විජේබන්ඩාර මහතා |
| වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ජී.යූ.එස්.විජේසේකර මහතා |
| මූලික විද්‍යා අධ්‍යයනාංශය | වෛද්‍ය ඩී.අයි.උළුවඩුගේ මහත්මිය |

## පීඨය මඟින් පිරිනමනු ලබන උපා - 2020

1. විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා (ගෞරව) උපාධිය
2. ඖෂධවේදී (ගෞරව) උපාධිය
3. විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය
4. විද්‍යාවේදී අක්ෂිමිති විද්‍යා (ගෞරව) උපාධිය

## 2019 හා 2020 යන වසර වල ප්‍රතිඵල සන්සන්දනය

| **2019 හා 2020 වසර** | **පළමු පෙළ** | | **දෙවන පෙළ ඉහළ** | | **දෙවන පෙළ පහළ** | | **සාමාන්‍ය සාමාර්ථ** | | **මුළු සමත් සංඛ්‍යාව** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **2019** | **2020** | **2019** | **2020** | **2019** | **2020** | **2019** | **2020** | **2019** | **2020** |
| විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා (ගෞරව) උපාධිය | 01 | - | 04 | 03 | 08 | 04 | 13 | 13 | 23 | 20 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | - | 02 | 03 | 06 | 04 | 06 | 15 | 09 | 22 | 23 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | 04 | 02 | 10 | 06 | 07 | 07 | 04 | 13 | 25 | 28 |
| **එකතුව** | **05** | **04** | **17** | **15** | **19** | **17** | **32** | **35** | **70** | **71** |

## ශිෂ්‍ය හා සම්පත් විස්තරය - 2020

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය) | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|
| විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා (ගෞරව) උපාධිය | 102 | 11 | 04 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | 107 | 10 | 08 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | 111 | 06 | 10 |
| **එකතුව** | **319** | **27** | **22** |

## දේශීය සිසුන් පිළිබඳ විස්තරය - 2020

| පාඨමාලාව | මාධ්‍යය | වසර | | | | |
|---|---|---|---|---|---|---|
| | | **1** වන වසර | **2** වන වසර | **3** වන වසර | **4** වන වසර | උපාධිධාරීන් සංඛ්‍යාව |
| විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා (ගෞරව) උපාධිය | ඉංග්‍රීසි | 28 | 29 | 23 | 21 | 06 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | | 30 | 27 | 23 | 26 | 20 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | | 30 | 26 | 29 | 27 | 25 |
| **එකතුව** | | **88** | **82** | **75** | **74** | **51** |

## අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| අධ්‍යයනාංශය | ජ්‍යෙෂ්ඨ මහාචාර්යය | මහාචාර්යය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය | කථිකාචාර්යය | කථිකාචාර්යය (පරිවාස) | කාවකාලික සහය | උපදේශක | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යාවේදී හෙද හා වින්නඹු මාතා (ගෞරව) උපාධිය | - | - | - | 06 | - | 05 | - | - | 11 |
| ඖෂධවේදී (ගෞරව) උපාධිය | - | - | - | 08 | - | 02 | - | - | 10 |
| විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය | - | - | - | 03 | - | 03 | - | - | 06 |
| මූලික විද්‍යා අධ්‍යයනාංශය | - | 01 | - | 03 | - | - | 01 | - | 05 |
| **එකතුව** | **-** | **01** | **-** | **20** | **-** | **10** | **01** | **-** | **32** |

## අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර - 2020

| ජ්‍යෙෂ්ඨතම | තාක්ෂණික නිලධාරීන් | කළමනාකරණ සහකාර | කනිෂ්ඨ සේවක | එකතුව |
|---|---|---|---|---|
| 01 | 07 | 05 | 11 | 24 |

## පර්යේෂණ නවෝත්පාදන හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු. - 2020

| විෂය | ප්‍රසිද්ධ කරන ලද | වාණිජ්‍ය කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පර්යේෂණ ගණන | 16 | - | 10 |

| | ප්‍රකාශන කාණ්ඩය | සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය ප්‍රකාශිත | විදේශීය ප්‍රකාශිත |
| 1 | තීරක සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | | **12** |
| 2 | තීරක නොවන සුවිගත ජර්නල ප්‍රකාශන ගණන | **3** | **4** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු (සම්පූර්ණ පත්‍රිකා/ සාරාංශ) | **24** | **12** |
| 4 | ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන | | |
| 5 | ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන | **1** | **3** |

## ලැබූ ප්‍රදාන පිළිබඳ විස්තර- 2020

| විෂය | අධ්‍යයන සේවක සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව | ප්‍රදාන ප්‍රමාණය |
|---|---|---|---|
| දේශීය ප්‍රදාන | 2 | 4 | 6 |
| ජාතික ප්‍රදාන | 1 | - | - |
| එකතුව | **3** | **4** | **6** |

## ශාරීරික අධ්‍යාපන අංශය

විශ්වවිද්‍යාල සිසුන් සඳහා ක්‍රීඩා ක්‍රියාකාරකම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම, ක්‍රීඩා ඉසව් 39ක් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම සහ ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම ශාරීරික අධ්‍යාපන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල, ජාතික ක්‍රීඩා සංගමය හෝ ජාත්‍යන්තරව විසින් සංවිධානය කරනු ලබන තරගාවලි සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම, විවිධ ක්‍රීඩා සඳහා ක්‍රීඩාංගණ පරිපාලනය හා නඩත්තු කිරීම ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් වේ.

වත්මන් ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරිය එන්.නිශාන්ති විදානගේ මහත්මියයි. රමණී කුලතිලක මහත්මිය, එම්.ජී.එස්.එස්.කීර්තිරත්න මහතා, එච්.එල්.ලහිරු දිලංකාර මහතා,බී.එන්.එම්.පෙරේරා මහතා සහ එල්.ඒ.ඩී.ප්‍රියදර්ශන මහතා ස්ථිර ක්‍රීඩා උපදේශකවරුන් ලෙස කටයුතු කරයි. බී.එම්.සී.එන්.නිරෝෂණ, ඊ.ඩී.ප්‍රියදර්ශනී සහ එන්.එල්. වික්‍රමදාර තාවකාලික ක්‍රීඩා උපදේශකවරුන් ලෙස කටයුතු කරයි.

## ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයේ අරමුණු

1. ශාරීරික අධ්‍යාපනයේ වටිනාකම් පිළිබඳ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර සිසුන්ට අවබෝධයක් ලබා දීම සහ මානසික සංවර්ධනය තුළින් ඔවුන්ගේ භෞතික සංවර්ධනය ඇති තිරීම.
2. ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවස්ථාවක් ලබා දීම.
3. අභ්‍යන්තර හා බාහිර ක්‍රීඩා ආයතන සමඟ තරඟාවලි ක්‍රීඩා කිරීමෙන් ක්‍රීඩා සහභාගීත්වය දිරිමත් කිරීම
4. සිසුන් අතර ක්‍රීඩා ක්‍රියාකාරකම් දිරිගන්වමින් විනය වර්ධනය කිරීම.

ක්‍රීඩා උපදේශක මණ්ඩලයක් අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

ක්‍රීඩා සභාව සියලුම ක්‍රීඩා වල ක්‍රීඩා නායකයින් සහ උප නායකයින්ගෙන් සමන්විත වේ. සෑම වසරකම සම සභාපතිවරුන් සහ විධායක කමිටු සාමාජිකයින් 02 දෙනෙකු තෝරා ගනු ලැබේ.

## ක්‍රීඩා උපදේශක මණ්ඩලය

ක්‍රීඩා උපදේශක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

1. උපකුලපතිවරයා විසින් පත් කරන ලද ක්‍රීඩා සඳහා උනන්දුවක් දක්වන ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 16 දෙනෙකු
2. ශාරීරික අධියාපන අධියක්ෂ
3. ස්ථිර ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන්ගෙන් සාමාජිකයින් පස් දෙනෙකු (එක් අයෙකු උපදේශිකාවක් විය යුතුය)
4. ක්‍රීඩා සභාවේ සම සභාපතිවරුන් දෙදෙනෙකු, ලේකම් සහ උප සභාපති සහ තවත් නියෝජිතයෙකු (එක් අයෙකු ක්‍රීඩිකාවක් විය යුතුය)
5. විශ්වවිද්‍යාල ප්‍රධාන වෛද්‍ය නිලධාරී හෝ ඔහුගේ නියෝජිතයා (විශ්ව විද්‍යාලයේ වෛද්‍ය නිලධාරියෙකු විය යුතුය)
6. අධ්‍යක්ෂ, ශිෂ්‍ය කටයුතු
7. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධන) හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිත
8. මූල්‍යාධිකාරී හෝ ඔහුගේ හෝ ඇයගේ නියෝජිත
9. වැඩ ඉංජිනේරු හෝ ඔහුගේ නියෝජිතය
10. සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන වැඩ අංශය)

11. ව්‍යාපෘති ඉංජිනේරු (ප්‍රාග්ධන වැඩ අංශය)

## ක්‍රීඩා සභාව

විශ්වවිද්‍යාල ක්‍රීඩා සභාව විවිධ ක්‍රීඩා කණ්ඩායම්වල නායකයින් සහ උප නායකයින්ගෙන් සමන්විත වේ. එය සම සභාපතිවරුන් දෙදෙනෙකු, සෑම පීඨයකම උප සභාපතිවරුන්, ලේකම්, සහකාර ලේකම්, කනිෂ්ඨ භාණ්ඩාගාරික, කර්තෘවරුන් දෙදෙනෙකු සහ කමිටු සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.
ඔවුන් තෝරා ගැනීම අධ්‍යයන වර්ෂයේ පළමු රැස්වීමේදී සිදුකෙරේ.

## ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ තරඟාවලි

විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශයේ පහත සඳහන් ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන් විසින් ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පහත ක්‍රීඩා සඳහා පහසුකම් සැපයීම සහ පුහුණුව ලබා දීම සිදුකර ඇත.

| | | |
|---|---|---|
| එන්.නිශාන්ති විදානගේ මිය<br>(ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ) | ජේ.එම් රමණි කුලතිලක මිය<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>අත් පන්දු (කාන්තා/පිරිමි)<br>වෙස් (ගැහැණු/පිරිමි)<br>දැල් පන්දු (කාන්තා)<br>යෝග | එම්.ජී.එස්.එස්. කීර්තිරත්න මහතා<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>පාපන්දු (පිරිමි)<br>පිහිනීම (ගැහැණු/පිරිමි)<br>රග්බි (පිරිමි) |
| එච්.එල්.ලහිරු දිලංකර මහතා<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>මළල ක්‍රීඩා (කාන්තා/පිරිමි)<br>මාර්ග ධාවන තරඟය (කාන්තා/පිරිමි)<br>කැරම් (ගැහැණු/පිරිමි)<br>පැසිපන්දු (කාන්තා/පිරිමි) | බී.එන්.එම් පෙරේරා මහතා<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>මල්ලවපොර (පිරිමි)<br>එල්ලේ (ගැහැණු/පිරිමි)<br>බර ඉසිලීම (කාන්තා/පිරිමි) | එල්.ඒ.ඩී.ප්‍රියදර්ශන මහතා<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>බැඩ්මින්ටන් (කාන්තා/පිරිමි)<br>මේස පන්දු (කාන්තා/පිරිමි)<br>ටෙනිස් (කාන්තා/පිරිමි)<br>බේස්බෝල් (පිරිමි) |
| බී.එම්.සී.එන්.නිරෝෂණ මහතා<br>(ශාරීරික අධ්‍යාපන උපදේශක)<br><br>ටයිකොන්ඩෝ (ගැහැණු/පිරිමි)<br>හොකී (කාන්තා/පිරිමි)<br>ක්‍රිකට් (පිරිමි) | **එස්.ඊ.ඩී. ප්‍රියදර්ශනී**<br>**එන්.එල්. වික්‍රමදර මහතා**<br>**(ශාරීරික අධ්‍යාපන උපදේශක)**<br>**(GYM උපදේශක)**<br><br>**කරාටේ (ගැහැණු/පිරිමි)** | එරොබික්<br>සම්බා |

ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් පහත තරඟාවලි සංවිධානය කරනු ලබයි.

1. අන්තර් පීඨ නවක තරඟාවලි

2. අන්තර් පීඨ තරඟ

3. ආරාධිත සහ මිත්‍රශීලී තරඟාවලි

4. අන්තර් විශ්වවිද්‍යාල තරඟාවලි

ඊට අමතරව, අප විසින් බාහිර කණ්ඩායම් සමඟ අන්තර් විශ්ව විද්‍යාල ශූරතා සහ ඒකාබද්ධ විශ්ව විද්‍යාල ක්‍රීඩා කණ්ඩායම් සමඟ සුහද තරඟ ද සංවිධානය කරනු ලැබේ.

එසේම සියලුම විශ්වවිද්‍යාලවලින් තෝරාගත් ඒකාබද්ධ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම්, ජාතික ශූරතා, ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා සහ ශූරතා සඳහා අපගේ සිසුහු සහභාගී වෙති.

විශ්වවිද්‍යාල කිහිපයක් විසින් සංවිධානය කරන අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල සෑම වසරකම පවත්වනු ලබන අතර කුඩා ඔලිම්පික් උළෙල වසර තුනකට වරක් එක් විශ්වවිද්‍යාලයක් විසින් සංවිධානය කරනු ලැබේ.

2020 වර්ෂයේ දී අප විසින් සංවිධානය කළ වැඩසටහන පහත පරිදි වේ.

- 2020 ජනවාරි මාසයේදී "අධ්‍යයන හා අනධ්‍යයන ක්‍රීඩා උළෙල" විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණි. මෙය ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී.
- අන්තර් පීඨ කැරම් ශූරතාවලිය
- මෙම ආරාධිත තරඟ සහ අනෙකුත් තරඟාවලි සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ද සහභාගී විය.
- අන්තර් සමාජ ද්විත්ව ටෙනිස් තරඟාවලිය
- මාර්ගගත ලෝක විශ්වවිද්‍යාල චෙස් ශූරතාවය
- දිස්ත්‍රික් කරාටේ තරඟාවලිය
- 73 වැනි ජාතික මේසපන්දු තරගාවලිය
- කළමිබු ලීග් හොකී තරඟාවලිය
- මලින්ද අරුමාදුර අනුස්මරණ බෙස්බෝල් තරගාවලිය
- ජාතික පැසිපන්දු ශූරතාවලිය
- 52 වැනි කැරම් ශූරතාවලිය
- ආරාධිත විශ්වවිද්‍යාල බැඩ්මින්ටන් තරඟාවලිය

**වර්ණ ප්‍රදානය**

ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය සහ ක්‍රීඩා සභාව එක්ව සෑම වසරකම අවසානයේ වර්ණ ප්‍රදානෝත්සවයක් සංවිධානය කරයි. අනුමත නිර්ණායක යටතේ නියමිත ප්‍රමිතියට ළඟා වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට උපදේශක මණ්ඩලයේ අනුමැතිය මත වර්ණ ප්‍රදානය කෙරේ. මෙම සම්මාන සඳහා වන නිර්ණායක සහ වැඩිදුර විස්තර ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයෙන් ලබා ගත හැක. මීට අමතරව අන්තර් විශ්වවිද්‍යාල තරගාවලිවල දී දස්කම් දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ කුසලතා සම්මානය පිරිනැමේ.

**ක්‍රීඩා පහසුකම්**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පාලන ආයතනය වන ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය සතුව සුවිශේෂී ක්‍රීඩා පහසුකම් ඇත.

**එළිමහන් වොලිබෝල් පිටි**

විශ්ව විද්‍යාල එළිමහන් වොලිබෝල් ක්‍රීඩා පිටි පිහිනුම් තටාකය අසල පිහිටා ඇති අතර මැටි ආශ්‍රිතව සකසන ලද ක්‍රීඩාංගන දෙකක් ඇත. මෙම ක්‍රීඩාපිටි විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ලබා ගත හැකිය.

**ටෙනිස් පිටි**

ටෙනිස් පිට්ටනි මැටි මතුපිටක් සහිතව තනා ඇති අතර මනාව නඩත්තු කර ඇත. මේවා විශ්ව විද්‍යාල සිසුන්ට, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මෙන්ම භාහිර පාර්ෂවවලට ද ලබා ගත හැකිය.

**ක්‍රිකට් ක්‍රීඩාංගණය**

විශ්ව විද්‍යාල ක්‍රිකට් ක්‍රීඩාංගනය ප්‍රධාන වශයෙන් මීටර් 65ක සම්පූර්ණ දිගින් යුත් තණකොළ මතුපිටක් සහිතවූවකි. හොඳින් නඩත්තු කරන ලද මෙම පිටියේ එක් මැටි තණතීරුවක් සහ මැටි ආශ්‍රිත තණතීරු දෙකක් ඇත. ක්‍රීඩාංගනයට යාබද තනි මහල් ක්‍රීඩා මණ්ඩපයක් සහ ක්‍රීඩකයින් සහ විනිසුරුවන් සඳහා යාබද නාන කාමර සහිත ඇඳුම් මාරු කිරීමේ කාමර ඇත. මෙම භූමිය ඉතා සුන්දර පරිසරයක පිහිටා ඇත. මෙම තණතීරුව අන්තර් විශ්වවිද්‍යාල තරග, විශ්වවිද්‍යාල අභ්‍යන්තර අන්‍යෝන්‍ය තරග සහ අනෙකුත් ප්‍රජා සමාජ තරඟාවලි සඳහා පහසුකම් සපයයි.

**පැසිපන්දු පිටිය**

එළිමහන් පැසිපන්දු පිටිය වොලිබෝල් පිටියට යාබදව පිහිටා ඇති අතර එය ප්‍රධාන වශයෙන් තාර වලින් සාදන ලද දෘඪ මතුපිටක් සහිත පිටියකි. මෙම පිටිය විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ලබා ගත හැකිය.

**පිහිනුම් තටාක සංකීර්ණය සහ නව කාර්යාල පරිශ්‍රය**

පිහිනුම් තටාකය මීටර් 50 සම්මත ප්‍රමාණයකින් යුක්ත වන අතර එය මංතීරු 10 කින් සමන්විත වේ. එහි නොගැඹුරු කෙළවර මීටර් 1.5 ක් වන අතර ගැඹුරු කෙළවර මීටර් 5.5 කි. පිහිනුම් තටාකයට යාබද දෙමහල් ගොඩනැගිල්ලක් ඇති අතර එය පිහිනුම්කරුවන් සඳහා ඇඳුම් මාරු කිරීමේ කාමර සහ නානකාමර වලින් සමන්විත වේ. විශ්ව විද්‍යාල සිසුන්, කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මෙන්ම භාහිර පාර්ෂව සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි ලබා ගත හැකිය.

**2020 වසරේ ඉදිකිරීම්**

- පිහිනුම් තටාක පරිශ්‍රයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සහ ස්නාන කාමරය ප්‍රතිසංස්කරණය කිරීම.
- පහත බිමෙහි දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවසන් කරන ලදී.

**විශ්වවිද්‍යාල සංවර්ධනයට අපගේ දායකත්වය.**

- බාහිර පාර්ශ්වයන්ට පිහිනුම් තටාකය කුලියට දීමෙන් විශ්වවිද්‍යාලයට ආදායමක් උපයා ගැනීම.
- ලියාපදිංචිය මගින් සහ ක්‍රීඩා පිටි භාවිතා කිරීමට බාහිර පාර්ශ්වයන්ට කුලියට ගැනීමේ පහසුකම් සැලසීම මගින් විශ්වවිද්‍යාලයට ආදායමක් උපයා ගැනීම.

## වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් 2020 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව තුළ ඉටුකරන ලද ක්‍රියාකාරකම්

| මාසය | වැඩසටහන | සම්පත් පුද්ගලයා | ඉලක්ක කණ්ඩායම් සහ සහභාගිවූ සංඛ්‍යාව | ප්‍රතිලාභ සහ ප්‍රතිඵල |
|---|---|---|---|---|
| ජනවාරි | නිසි පරිදි ලේඛන සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | පේෂලා වෙලගෙදර මෙනවිය වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | සියලුම පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | මයික්‍රොසොෆ්ට් වර්ඩ් භාවිතයෙන් විධිමත් ලිපි කෙටුම්පත් කිරීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම. |
| පෙබරවාරි | වෘත්තීය දිශානති වැඩසටහන | වත්මන් සහ අතීත සිසුන් 50 ක් | සම සෞඛ්‍ය විද්‍යා පීඨය - 2018/2019 කණ්ඩායමේ සිසුන් 60ක් | අනාගත වෘත්තීය සැලසුම් කිරීම සහ සේවානියුක්ත නිපුණතා වර්ධනය කිරීම පිළිබඳව නවකයින් දැනුවත් කිරීම. |
| | "Vobitor 2020" මූලික වටය | කොළඹ සහ ගම්පහ ටෝස්ට්මාස්ටර්ස් සමාජ සහ Gavel සමාජ වල ගරු ටෝස්ට්මාස්ටර්ස්වරුන් | සියලුම පීඨ නියෝජනය කරමින් උපාධි අපේක්ෂකයින් 150ක් | සිසුන්ගේ ප්‍රසිද්ධ කථන සහ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම. |
| | ගූගල් ආකෘති නිර්මාණය කිරීම සහ පළ කිරීම පිළිබඳ වැඩමුළුව | අදීෂ ආශිංසන මහතා, වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | සියලුම පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | ගූගල් ආකෘති නිර්මාණය කිරීම සහ පළ කිරීම පිළිබඳ ශිෂ්‍යයින් දැනුවත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | විදේශ ශිෂ්‍යත්ව ලබා ගැනීම පිළිබඳ සැසිය | කලිඳු මහීෂ සෝමතිලක මහතා, වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | සියලුම පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | විදේශ ශිෂ්‍යත්ව ලබා ගැනීම පිළිබඳ ශිෂ්‍යයින් දැනුවත් කිරීම. |
| | පෞරුෂයට රිද්මය – කථාංග 01 “පන්හිඳක සේයා” | අත්තනායක එම් හේරත් මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | සියලුම පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | සිසුන්ගේ සෞන්දර්යාත්මක කුසලතා ප්‍රදර්ශනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ ශිෂ්‍යයින් දැනුවත් කිරීම. |
| | “ග්ලෝරි නයිට්” | ආදි ශිෂ්‍ය සාමාජිකයින්ගේ විධායක කමිටුව, අලුතින් පත් කරන ලද විධායක මණ්ඩල සාමාජිකයින් සහ වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයින්. | උපාධි අපේක්ෂකයින් 126ක්. | සමිතියේ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම සහ අලුතින් පත් කරන ලද විධායක මණ්ඩලය වෙත වගකීම් පැවරීම. |
| මාර්තු | The Shape of USJ Icons | උවින් ආරියරත්න මහතා වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | කුසලතා සංවර්ධන අධ්‍යයන මධ්‍යස්ථානයේ සාමාජිකයින් සහ සියලුම පීඨ නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | විභාග නිසා ඇතිවන ආතතිය කළමනාකරණය කිරීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | "සාර්ථකත්වයේ සෙවනැල්ල" (අදියර 06) | ආශ්චර්යා පීරිස් මෙනවිය, විලාසිතා නිර්මාණ ශිල්පිනී, අභිප්‍රේරණ කථික | උපාධි අපේක්ෂකයින් 220ක් | අධ්‍යයන කටයුතු සඳහා සිසුන්ගේ අභිප්‍රේරණය වැඩි දියුණු කිරීම. |
| | "ටච් ද පීක්" - වැඩමුළු මාලාව (අවසාන කථාංගය) රැකියා පොළ දිනය | සියයකට වැඩි මානව සම්පත් කළමනාකරුවන් සහ විධායක නිලධාරීන් ඇතුළුව පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සමාගම් 20ක්. | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨය - උපාධි අපේක්ෂකයින් 1000කට වඩා. | සුදුසු රැකියා අවස්ථාවක් සොයාගැනීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම. |
| අප්‍රේල් | රට වසා දැමීම නිසා ක්‍රියාකාරකම් සිදුකර නොමැත | | | |
| මැයි | Scratallision of Minds | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෘත්තීය කුසලතා සංවර්ධන සමිතිය. | වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතියේ සාමාජිකයින් | නිරෝධායන කාලය ඵලදායී ලෙස භාවිතා කිරීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීම. සිසුන්ගේ බුද්ධි ප්‍රමාණය සහ චිත්තවේගීය ප්‍රමාණය වර්ධනය කිරීම. |
| | ලුඩෝ ශූරතාවලිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෘත්තීය කුසලතා සංවර්ධන සමිතිය. | අසූවකට වැඩි උපාධි අපේක්ෂකයින් ප්‍රමාණයක් | විනෝදය පදනම් කරගත් ක්‍රියාකාරකම් හරහා සාමාජිකයින්ගේ කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම. |
| ජුනි | ‘‘ඉලුමිනේට් ": මාර්ගගත කථික | කොළඹ ටෝස්ට්මාස්ටර් සමාජයේ | සමස්ත ලෝකයම නියෝජනය | විනෝදජනක මාර්ගගත කථන සන්දර්භ සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | තරඟය. (මූලික වටය) | ටෝස්ට් මාස්ටර් අර්ෆත් සලීම් | කරන උපාධි අපේක්ෂකයින් | සහභාගිවන්නන් සූදානම් කිරීම. |
| | “ඉලුමිනේට් ": මාර්ගගත කථික තරඟය, (අර්ධ අවසන් පූර්ව වටය) | දපන්ජය හෙට්ටිආරච්චි මහතා, සම්මානලාභී ප්‍රධාන කථික සහ විධායක පුහුණුකරු | සමස්ත ලෝකයම නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | ප්‍රසිද්ධ කථන කලාවේ නව දැනුම පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම |
| | “ග්ලැඩියස්’20” | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සහ වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | උපාධි අපේක්ෂකයින් 152 කට වඩා වැඩි ප්‍රමාණයක්. | සාමාජිකයින්ගේ දක්ෂතා සහ කුසලතා පිළිබඳව සිසුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම. |
| ජූලි | “ඉලුමිනේට් ": මාර්ගගත කථික තරඟය, (අර්ධ අවසන් පූර්ව වටය) (අවසන් මහා තරඟය ) | දපන්ජය හෙට්ටිආරච්චි මහතා, ගෞරවනීය ආරාධිත අමුත්තා' | සමස්ත ලෝකයම නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් | ප්‍රසිද්ධ කතා පැවැත්වීම පිළිබඳ දක්ෂතා වැඩි දියුණු කිරීම. |
| | ග්‍රීන් හෝප්ස් ප්‍රොජෙක්ට් - මේ වන විට කථාංග හයක් පවත්වා ඇත | | සමස්ත ලෝකයම නියෝජනය කරන උපාධි අපේක්ෂකයින් සහ සහභාගීවන්නන් | සොබාදහම් මාතාවගේ හරිතවත්බව ආරක්ෂා කිරීමේ තිරසාර සංවර්ධනය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම |
| අගෝස්තු | කුසලතා සංවර්ධන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ | සියලුම පීඨ නියෝජනය | සමාජයේ ක්‍රියාකාරකම් |

| | | | | |
|---|---|---|---|---|
| | අධ්‍යයන මධ්‍යස්ථානයේ කණ්ඩායම් නායකයින්ගේ වැඩසටහන | වෘත්තීය නිපුණතා සංවර්ධන සමිතිය | කරන උපාධි අපේක්ෂකයින්. | සඳහා සිසුන්ගේ සහභාගීත්වය වැඩි දියුණු කිරීම. |
| සැප්තැම්බර් | තාක්ෂණ පීඨයේ වෘත්තීය දිශානති වැඩසටහන | මහාචාර්ය සුදත් එම් අමරසේන, අධ්‍යක්ෂ, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය; වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෘත්තීය උපදේශක සමීර ජයවර්ධන මහතා, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෘත්තීය උපදේශක චතුරංගනී තෙන්නකෝන් මහත්මිය | තාක්ෂණ පීඨයේ පළමු වසරේ උපාධි අපේක්ෂකයින් | අනාගත වෘත්තීය සැලසුම් කිරීම සහ රැකියා නිපුණතා වර්ධනය කිරීම පිළිබඳව නවකයින්ගේ දැනුවත්බව වැඩි දියුණු කිරීම. |
| | මාර්ගගත රැස්වීම් | කොළඹ විශ්වවිද්‍යාලයේ Gavel සමාජයේ ග්‍රැවලියර්. | සියලුම පීඨවල සිසුන් 75 කට වැඩි පිරිසක්. | සමාජයට සම්බන්ධ වීමට නවකයන් දිරිමත් කිරීම. |
| | වාර්ෂික බාහිර පුහුණුව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Gavel සමාජය | Gavel සමාජයේ පළමු වසරේ සාමාජිකයින් | සමාජයේ නව සාමාජිකයින් අතර කණ්ඩායම් බැඳීම වැඩි දියුණු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | අරමුදල් රැස්කිරීමේ වැඩසටහන | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Gavel සමාජය | Gavel සමාජයේ පළමු වසරේ සාමාජිකයින් | සිසුන්ගේ කණ්ඩායම් වශයෙන් වැඩ කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම. |
| | වාර්ෂික බෝධි පූජාව | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Gavel සමාජය | සියළුම ආදි ග්‍රැවලියර්ස් | ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති පැවැත්වීම සඳහා සිසුන් වැඩිදියුණු කිරීම. |
| | "ටච් ද පීක්" වෘත්තීය ප්‍රදර්ශනය | සියයකට වැඩි මානව සම්පත් කළමනාකරුවන් සහ විධායක නිලධාරීන් ඇතුළුව පුද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ සමාගම් 20ක්. | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ අවසන් වසරේ සිසුන්. | මාර්ගගත සම්මුඛ පරීක්ෂණ අවස්ථා පිළිබඳව උපාධි අපේක්ෂකයින් දැනුවත් කිරීම. |
| ඔක්තෝම්බර් | හැලොවීන් තේමා රැස්වීම | දේවින් ධර්මරත්න මහතා, රාගවි රාජරත්න මහතා | Gavel සමාජයේ සාමාජිකයින් | ප්‍රසිද්ධ කථන කුසලතා වැඩි දියුණු කිරීම. |
| නොවැම්බර් | ජීව දත්ත ලිවීම සහ සම්මුඛ පරීක්ෂණ වලට මුහුණ දීමේ කුසලතා වැඩමුළුව | ශානිකා සෝමසුන්දර මහතා | තාක්ෂණ පීඨයේ අවසන් වසර සිසුන් | උපාධි අපේක්ෂකයින්ගේ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේ කුසලතා වර්ධනය කිරීම. |
| දෙසැම්බර් | ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා විශේෂ වැඩමුළුව (අභියෝග ජය | වෛද්‍ය වෙනුර පලිහවඩන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය විද්‍යා පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයින් | නිරෝධායන කාලසීමාව තුළ පවතින දුෂ්කරතාවලට |

| | | | | |
|---|---|---|---|---|
| | ගන්නේ කෙසේද?) | | | ඵලදායී ලෙස මුහුණ දීමට සිසුන් දෛර්යමත් කිරීම. |
| | පෞරුෂයට රිද්මයක් වැඩමුළුව | වෛද්‍ය ප්‍රදීප් රංගන වෛද්‍ය නිලධාරී ප්‍රසිද්ධ ගායක | සියලුම පීඨවල උපාධි අපේක්ෂකයින් | සංගීතය තුළින් උපාධි අපේක්ෂකයින්ගේ ජීවිත ලිහිල් කිරීම සහ ඔවුන්ගේ සහජ කුසලතා වැඩිදියුණු කිරීම. |

## තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය (තො.තා.සේ.ම.) විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ පිළිබඳ තාක්ෂණික සහාය සහ විසඳුම් සපයන අතරම විශ්වවිද්‍යාලය පුරා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්, අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් පහසුකම්, සර්වර් පරිපාලනය සහ විද්‍යුත් සේවා සහ යෙදුම් පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලයේ මූලික ආයතනයවේ. මෙයට අමතරව, තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාල වෙබ් අඩවි සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන අතර එය අංගසම්පූර්ණ මාධ්‍ය කණ්ඩායමකින් ද සවිමත් වේ.

හර්ෂ මුණසිංහ මහතා තොරතුරු පද්ධති කළමනාකරු ලෙස මෙම මධ්‍යස්ථානයට නායකත්වය දුන් අතර පරිගණක උපදේශකවරුන් ලෙස වජිර ප්‍රේමදාස මහතා සහ නෙත්සිරි ජයවීර මහතා කටයුතු කළේය. සුරේෂ් නානායක්කාර මහතා මෙම මධ්‍යස්ථානයේ සහකාර ජාල කළමනාකරු විය. අෂේලා නිල්මිණි මෙනවිය සහ රනුක එදිරිසූරිය මහතා පරිගණක වැඩසටහන්කරුවන් ලෙස කටයුතු කළ අතර උපුල් වීරතුංග මහතා, දිනිති වීරසිංහ මහත්මිය සහ එස්.කේ. ගුරුගේ මහතා තාක්ෂණික නිලධාරීන් ලෙස කටයුතු කළේය. එච්.එම්.එම්.එස්. නිසංසලා මෙනවිය කළමනාකරණ සහකාර ලෙස කටයුතු කළ අතර බණ්ඩාර යාපා මහතා රසායනාගාර සහායක ලෙස සිය දායකත්වය සැපයීය. කාර්ය සහායක ශාන්ත කුමාර මහතා සහ තාවකාලික සේවකයින් පිරිසක් තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය, මාධ්‍ය මධ්‍යස්ථානය සහ වෙබ් කණ්ඩායමේ වසර පුරාවටම එම කාර්යයන් ඉටුකර ගැනීම වෙනුවෙන් කටයුතු කළහ.

තොරතුරු තාක්ෂණ සේවා මධ්‍යස්ථානය විසින් සපයනු ලබන මූලික සේවාවන් පහත සඳහන් පරිදි වේ

- විශ්වවිද්‍යාල විද්‍යුත් තැපැල් සේවාව කළමනාකරණය කිරීම
- අන්තර්ජාල පහසුකම් කළමනාකරණය සහ සැපයීම
- සර්වර් පරිපාලනය සහ ඊ-සේවා සහ යෙදුම් නඩත්තු කිරීම

- කළමනාකරණ තොරතුරු පද්ධති සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම
- මෘදුකාංග සංවර්ධනය සහ විද්‍යුත්-විසඳුම්
- පුද්ගලික ක්ලවිඩ් පද්ධතිය නඩත්තු කරීම
- ෆයිබර් ඔප්ටික් ජාලය සංවර්ධනය හා නඩත්තු කිරීම
- ප්‍රාදේශීය ජාල සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- වයි ෆයි ජාලය සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම
- විශ්වවිද්‍යාල වෙබ් අඩවි සංවර්ධනය හා නඩත්තුව
- ඩිජිටල් මාධ්‍ය ආවරණය සහ මාධ්‍ය නිෂ්පාදන සැපයීම
- අභ්‍යන්තර සන්නිවේදන පද්ධතිය ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිලිබඳ අධීක්ෂණය කිරීම
- VoIP පද්ධතිය ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පරිපාලනය කිරීම
- තො.හා ස.තා.උපකරණවල දෝශ නිරාකරණය සහ නඩත්තු කිරීම
- මෘදුකාංග ස්ථාපනය කිරීම සහ ආරක්ෂක මෘදුකාංග සැපයීම
- පිරිවිතර සහ තාක්ෂණික ඇගයීම් සකස් කිරීම
- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා සඳහා සහය වීම
- සිසුන් සඳහා උපදේශන සේවා සහ තාක්ෂණික සහාය ලබා දීම
-

## පුස්තකාලය

020 වර්ෂයේ දී පුස්තකාලයාධිපතිනී ආචාර්ය නයනා විජයසුන්දර මියගේ මහපෙන්වීම යටතේ එක් නියෝජ්‍ය පුස්තකාලයාධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් 04 දෙනෙක්, සහකාර පුස්තකාලයාධිපතිවරුන් 08දෙනෙක්, එක් සහකාර රෙජිස්ට්‍රාර්/ පුස්තකාල සේවා නිලධාරියෙක්, සහකාර ජාල කළමනාකරුවෙක් සහ අනධ්‍යන කාර්ය මණ්ඩලය 50ක් පුස්තකාලයේ රාජකාරීවල නිරත වූහ.

වාර්ෂික ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 2.37 ක් වැයකර වර්ෂය තුළ පොත් 587 ක් මිලදී ගන්නා ලදී. එමෙන්ම විද්‍යුත් සහ මුද්‍රිත ආකෘතියෙන්පළකරන ලද විදේශීය සහ දේශීය වාර සඟරා තිස් එකක් රුපියල් මිලියන 4.6ක් වැයකර මිලදී ගන්නා ලදී. තවද පූර්ණ පෙළ ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායන් දෙකක්; JSTOR (රුපියල් මිලියන 1.26 ක වියදමින්) සහ Research4life (රුපියල් මිලියන 0.27 ක වියදමින්) සහ Scopus උපුටන දත්ත ගබඩාවක් (රුපියල් මිලියන 3.38 ක වියදමින්) මිලදී ගන්නා ලදී. මීට අමතරව, Crossref DOI ලියාපදිංචි කිරීමේ පහසුකම ලබාගැනීම සඳහා රුපියල් 71,940.45 ක් වැයකරන ලදී. රුපියල් මිලියන 1.2ක් වැයකර පුස්කොළ අත්පිටපත් එකසිය විසිතුනක් මිලදී ගෙන ඇත. වටිනාකම රු. 413,252.85ක් වූ පොත් දෙසිය හැට අටක්, වටිනාකම රුපියල් 56,937.00 ක්වූ විදේශීය හා දේශීය වාර සඟරා 112 ක් සහ පුස්කොළ අත්පිටපත් 20 ක් පරිත්‍යාග ලෙස ලැබී ඇත. මීට අමතරව, වෙනත් ඉලෙක්ට්‍රොනික දත්ත සමුදායන් 04කට එනම්; එමරල්ඩ්, ටේලර් ඇන්ඩ් ෆ්‍රැන්සිස්, ඔක්සිෆර්ඩ් ජර්නල්ස්, ඔක්සිෆර්ඩ් මෙඩිසින් ඔන්ලයින් ඇතුළුව

වෛද්‍ය අත්පොත් සඳහා ප්‍රවේශ වීමට වි.වි.ප්‍ර.කො. හා ශ්‍රී ලංකා ශාස්ත්‍රීය පුස්තකාල එකමුතුව හරහා අනුග්‍රාහකයින් වෙත ලබා දෙන ලදී. එසේම, බ්‍රිතාන්‍ය පුස්තකාලය හරහා ලේඛන බෙදා හැරීමේ සේවාව ශ්‍රී ලංකා ශාස්ත්‍රීය පුස්තකාල එකමුතුව මගින් පාඨකයන් වෙත සපයන ලදී. තවද, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය මගින් EBSCO දත්ත ගබඩාව සහ විද්‍යුත් පොත් 589 සඳහා ප්‍රවේශය ලබා දෙන ලදී.

2020 වර්ෂය තුළ සැකසුම් අංශය සහ පීඨ පුස්තකාලය මගින් පොත් 713ක් සහ පිටපත් 1647ක් සකස් කරන ලදී. එම ප්‍රමාණය සිලෝන් රූම් සඳහා වූ පිටපත් 72 කින් ද, ස්ථිර පරිශීලනය සඳහා වූ පිටපත් 130 කින් ද, උපලේඛනගත පර්ශීලනය සඳහා වූ පිටපත් 241 කින් ද, බැහැර දීමේ පොත් සඳහා වූ පිටපත් 1204 කින් ද සමන්විත විය. 2020 අවසානය වන විට සංරක්ෂණයෙන් පසු පුස්කොළ අත්පිටපත් 152 ක් පරිග්‍රහණගත කරන ලදී.
2020 වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 33 දෙනෙක්, අනධ්‍යයන කාර්ය මණ්ඩයේ 27ක්, උපාධි අපේක්ෂකයින් 3291ක් සහ ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි සිසුන් 59 ඇතුළු පාඨකයන් 3410 ක් පමණ ලියාපදිංචි වී ඇත. එම පිරිසත් සමඟ ලියාපදිංචි වූ මුළු පරිශීලකයින් සංඛ්‍යාව 18,457 ක් විය.
අන්තර් පුස්තකාල හුවමාරු ඉල්ලීම් ඉටුකිරීමේ අනුපාතය 93% කි. 2020 දී ලැප්ටොප් බැහැර දීමේ සේවාව පරිශීලකයින් 395 දෙනෙකු විසින් භාවිතා කරන ලදී. මෙම සේවාව සඳහා පුස්තකාලයේ ලැප්ටොප් පරිගණක 30ක් වෙන් කර තිබුණි. වියත් බැංකුවේ (ඩිජිටල් දත්ත ගබඩාව) සමස්ත ඇතුළත් කිරීම් සංඛ්‍යාව 7783 ක් වූ අතර, 2020 අවසන් වන විට පුවත්පත් ලිපි දත්ත ගබඩාව තෝරාගත් පුවත්පත් ලිපි 2980 කින් සමන්විත විය. තොරතුරු සම්පත් පිළිබඳ දැනුවත්භාවය සහ තොරතුරු සාක්ෂරතා කුසලතා වර්ධනය කිරීම සඳහා පුස්තකාලයේ කාර්ය මණ්ඩලය විසින් විද්වතුන් සහ සිසුන් සඳහා වැඩමුළු 17 ක් පවත්වන ලදී.

2020 වර්ෂය තුළ සහකාර පුස්තකාලයාධිපතිවරු 02 දෙනෙක් පුස්තකාලය සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළහ. ආචාර්ය උපාධි දෙකක්, ශාස්ත්‍රපති උපාධි හතරක්, ශාස්ත්‍රවේදී උපාධි තුනක් සහ ඩිප්ලෝමා අටක් පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලදී.

## බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බාහිර විභාග අංශය 1979 දී වාණිජ්‍ය ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන ආරම්භ කිරීමත් සමඟ ආරම්භ කරන ලදී. අනතුරුව සාමාන්‍ය ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන ආරම්භ කරන ලදී. 1997 දී ව්‍යාපාර පරිපාලනය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ බීඑස්සී සාමාන්‍ය බාහිර උපාධි වැඩසටහන් ද හඳුන්වා දෙන ලදී. සාමාන්‍ය ශාස්ත්‍රවේදී බාහිර උපාධිය සහ ව්‍යාපාර පරිපාලනවේදී සාමාන්‍ය බීඑස්සී බාහිර උපාධි වැඩසටහන් සිසුන් අතර ඉතා ජනප්‍රිය වී ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 932 හා 2010 ඔක්තෝම්බර් 15 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව, බාහිර විභාග ඒකකය බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය ලෙස ව්‍යුහාත්මකව වෙනස් කර ඇත.

බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

I. උපකුලපති (සභාපති)
II. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරන ලද සාමාජික.

III. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කළ සාමාජිකයින් අතරින් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු

IV. පීඨාධිපතිවරුන් (මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨයේ පීඨාධිපතිවරුන්)

V. අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්

VI. ලේඛකාධිකාරී

VII. මූල්‍යාධිකාරී

VIII. බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ අධ්‍යක්ෂ

IX. බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

X. බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකය 2014 වර්ෂයේ සිට නව විෂය නිර්දේශය යටතේ පහත සඳහන් උපාධි වැඩසටහන් හඳුන්වා දෙන ලදී.

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය**

- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) බාහිර උපාධිය
- ඉංග්‍රීසි ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- පාරිසරික සහ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

**කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය**

- ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- කළමනාකරණ විද්‍යාවේදී (පොදු) සාමාන්‍ය (බාහිර) උපාධිය
- වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය
- ව්‍යාපාර අධ්‍යයනය විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය

**2020 වසර සඳහා සිසුන් බඳවා ගැනීම පහත පරිදි වේ:**

| | |
|---|---|
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 248 |
| පාරිසරික සහ සංවර්ධන අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | -181 |
| කළමනාකරණ විද්‍යාවේදී (පොදු) සාමාන්‍ය (බාහිර) උපාධිය | - 572 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 661 |

ව්‍යාපාර අධ්‍යයන විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය ලියාපදිංචි කිරීම 2020 වසර අවසානයේ අවසන් කරන ලදී.

2020 වර්ෂය තුළ එක් එක් උපාධි වැඩසටහන් වෙනුවෙන් පවත්වන ලද ශිෂ්‍ය ප්‍රතිපෝෂණ, සම්මන්ත්‍රණ සහ විභාග සංඛ්‍යාව පහත පරිදි වේ.

| උපාධි වැඩසටහන | සම්මන්ත්‍රණ සංඛ්‍යාව | විභාග සංඛ්‍යාව |
|---|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | **0**3<br>(2018 කණ්ඩායම - I කොටස,<br>2017 කණ්ඩායම - II කොටස<br>2015 කණ්ඩායම – III කොටස) | - |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය (පැරණි විෂය නිර්දේශය) | **01**<br>(2019 කණ්ඩායම - I කොටස) | - |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | **03**<br>(2017 කණ්ඩායම –II කොටස, 2019 කණ්ඩායම –I කොටස, 2020 කණ්ඩායම –I කොටස) | **02**<br>(2018 කණ්ඩායම – I කොටස, 2015 කණ්ඩායම – III කොටස) |
| කළමනාකරණ විද්‍යාවේදී (පොදු) සාමාන්‍ය (බාහිර) උපාධිය | **03**<br>(2020 කණ්ඩායම –I කොටස<br>2018 කණ්ඩායම –II කොටස<br>2017 කණ්ඩායම –III කොටස) | **02**<br>(2017 කණ්ඩායම –II කොටස, 2014/2015 කණ්ඩායම –III කොටස) |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | **03**<br>(2020 කණ්ඩායම –I කොටස<br>2018 කණ්ඩායම –II කොටස<br>2017 කණ්ඩායම –III කොටස) | **02**<br>(2017 කණ්ඩායම –II කොටස<br>2019 කණ්ඩායම – කොටස) |
| ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | **02**<br>(2016 කණ්ඩායම –t III කොටස) | **02**<br>[201 කණ්ඩායම –II කොටස, 2011/2014 කණ්ඩායම (රිපීට්) – III කොටස] |

රට තුළ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මාර්ගගත සම්මන්ත්‍රණ 2020 මාර්තු මස සිට ආරම්භ කරන ලදී.

වර්තමානයේ බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයෙහි ලියාපදිංචි වී ඇති සිසුන් සංඛ්‍යාව 108188 කි.

පහත දැක්වෙන විෂයධාරා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයේ කළමනාකරණ කමිටුව විසින් තත්ත්ව සහතික මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී.

i. පාලනය සහ කළමනාකරණය
ii. වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම, පාඨමාලා සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම.
iii. යටිතල පහසුකම් සහ ඉගෙනුම් සම්පත්, ඉගෙනුම් සහාය සහ ප්‍රගතිය.
iv. ඇගයීම, ඉගෙනුම් ඇගයීම සහ සම්මාන

2020 වර්ෂයේදී බාහිර උපාධි සහ ව්‍යාප්ති පාඨමාලා ඒකකයෙහි කමිටු රැස්වීම් පහත පරිදි පවත්වන ලදී.

14 වන බාහිර උපාධි උපාධි ප්‍රදානෝත්සවය 2020 මාර්තු 03 වන දින පවත්වන ලද අතර එහිදී උපාධිය ලද උපාධිධාරීන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 265 |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 589 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 15 |
| ව්‍යාපාර පරිපාලන විද්‍යාවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 1343 |
| කළමනාකරණ විද්‍යාවේදී (පොදු) සාමාන්‍ය (බාහිර) උපාධිය | - 300 |
| වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධිය | - 204 |

## විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය විසින් ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා පහසුකම් රැසක් සපයනු ලබයි. වෛද්‍ය සහ දන්ත ප්‍රතිකාර, පරීක්ෂණ, එන්නත් සහ උපදේශන ඊට ඇතුළත් වේ. ඩෙංගු මර්දන ව්‍යාපාර, පළිබෝධ මර්දනය සඳහා පළිබෝධනාශක ඉසීම, විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල සහ ආපනශාලාවල ආහාර පරීක්ෂා කිරීමේ වැඩසටහන්, ජල සාම්පල පරීක්ෂා කිරීම, සෞඛ්‍ය හා සමාජීය ගැටලු පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම යන කටයුතු සඳහා ද මෙම මධ්‍යස්ථානය සම්බන්ධ වේ. තවද කොවිඩ් -19 වසංගතයට මුහුණ දෙන අවස්ථාවේ දී අපගේ මධ්‍යස්ථානය එහි සේවාවන් ඊට සාර්ථකව අනුවර්තනය කරගන්නා ලදී. කාර්ය මණ්ඩලය සහ කොවිඩ්-19 යැයි සැක කරන සිසුන් සඳහා පී.සී.ආර් පරීක්ෂණය සඳහා අවශ්‍ය ස්වබ්ස් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

2020 වර්ෂය තුළ වෛද්‍ය ද සිල්වා මිය වෛද්‍ය මධ්‍යස්ථානය භාර වෛද්‍ය නිලධාරී වශයෙන් කටයුතු කළාය. වෛද්‍ය ඩී.එම්.එල්.ආර්.එච්.පෙරේරා මිය වෛද්‍ය නිලධාරිනියක ලෙසත්, වෛද්‍ය ඩී.පී.ඩී.ඇසලගේ දන්ත ශල්‍ය වෛද්‍යවරයකු ලෙසත් සේවය කළහ.
වෛද්‍ය කේ.ජී.එන්.සෙනෙවිරත්න, වෛද්‍ය කේ.ඒ.එම්.හඳකුඹුර සහ වෛද්‍ය එස්.එම්.ඩී.ජී.එස්.පෙරේරා වැඩ ආවරණ වෛද්‍ය නිලධාරීන් ලෙස සේවය කළහ.

## 2020 දී වෛද්‍ය මධ්‍යස්ථානය විසින් සපයන ලද සේවා පිළිබඳ සංඛ්‍යාලේඛන

| | |
|---|---|
| 1. කායික රෝග සඳහා වෛද්‍යවරුන් විසින් පරීක්ෂා කරන ලද රෝගීන් සංඛ්‍යාව; | 10,011 |
| 2. ඔසුසැලෙන් ඖෂධ ලබා ගත් රෝගීන් සංඛ්‍යාව; | 8,616 |
| 3. හෙද ඒකකය මගින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව | 1,861 |
| 4. දන්ත සායනයට සම්බන්ධවූ සංඛ්‍යාව; | 597 |
| 5. ගන්නා ලද PCR ස්වබ්ස් ගණන | 61 |

## පර්යේෂණ සභාව

**හැඳින්වීම**

උසස් තත්ත්වයේ පර්යේෂණ පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් උත්පාදනය කරනු ලබන දැනුම ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ජාතික සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීම යන පුළුල් දැක්ම පෙරදැරිව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව 2016 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රඥයින්, විධායක නිලධාරීන් සහ සිසුන් උසස් තත්ත්වයේ පර්යේෂණවල නිරත වීමට දිරිමත් කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවේ ක්‍රියාකාරකම්වල අරමුණ වේ. යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම, පර්යේෂණ සඳහා අරමුදල් ලබා දීම, දැනුම බෙදා හැරීමට පහසුකම් සැලසීම සහ විශ්ව විද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීමට ඉවහල් වන ජාතික හා ජාත්‍යන්තර සහයෝගිතාවය දිරිමත් කිරීම තුළින් මෙය සාක්ෂාත් කර ගැනීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව අරමුණු කරයි. පර්යේෂණ සම්මාන පිරිනැමීමේ ක්‍රමය මගින් පර්යේෂකයින් සහ ඔවුන්ගේ කාර්යයන් හඳුනාගෙන ඔවුන්ට පරිත්‍යාග පිරිනැමීම තුළින් ඔවුන් දිරිමත් කිරීම ද පර්යේෂණ සභාව අරමුණු කරයි.

**මෙහෙවර**

වර්තමාන සහ අනාගත පරම්පරාවේ යහපැවැත්ම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රජාව විසින් දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන්ගේ ආයතන සමග තිරසාර හවුල්කාරිත්වයක් ගොඩනගා ගනිමින් පාරිසරික, සමාජීය, ආර්ථික පදනම්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විශිෂ්ටත්වය සහ සාර්ථක පර්යේෂණ සහ සංවර්ධනය මත පදනම් වූ දියුණුවක් අත්කර ගැනීමට හැකිවන වාතාවරණයක් නිර්මාණය කිරීම මගින් අරමුදල් සහ යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම තුළින් පර්යේෂණ හා සංවර්ධනය පෝෂණය කිරීම.

**අරමුණු**

1. ජාතික සහ ගෝලීය අවශ්‍යතා සපුරාලන ජාතික හා ජාත්‍යන්තර වැදගත්කමක් ඇති පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
2. විශ්වවිද්‍යාලය තුළ හිතකර පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීම
3. පර්යේෂණවල විශිෂ්ටත්වයේ ස්වයං තිරසාර මධ්‍යස්ථාන පිහිටුවීම

4. පර්යේෂකයන්ට සහයෝගයෙන් කටයුතු කිරීමට සහ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීමට පහසුකම් සැලසීම
5. පර්යේෂකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම
6. පර්යේෂණ ක්‍රියාවලිය පහසු කිරීම
7. පර්යේෂකයන්ට සිය දැනුම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් බෙදා හැරීමට පහසුකම් සැලසීම
8. කර්මාන්ත සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ උපදේශන සඳහා පහසුකම් සැලසීම
9. උසස් තත්ත්වයේ ශිෂ්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම
10. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාවේ සාමාජික ආයතනවල පර්යේෂණ මෙහෙයුම් වල සඵලතාවය වැඩි දියුණු කිරීම
11. පර්යේෂණ සහ එහි පරිපාලනය හා සම්බන්ධ අනෙකුත් සංවිධාන සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම

## නිලධාරීන්

විධායක සභාපති : උප කුලපති

- සම සභාපතිවරු : ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පත්මලාල් මානගේ
  මහාචාර්ය ප්‍රදීපා ජයවර්ධන
- ප්‍රධාන ලේකම් (පර්යේෂණ මධ්‍යස්ථාන මණ්ඩලය කළමනාකරණය) : ආචාර්ය ඒ ආර් අජ්වර්ඩ්
- උපදේශක මණ්ඩලය (පීඨාධිපතිවරුන්)

| | |
|---|---|
| මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද | පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලලින් කරුණානායක | පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| මහාචාර්ය පී ඩී නිමල් | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය |
| මහාචාර්ය ආලෝක පතිරණ | පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම් එම් පත්මලාල් | පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය |
| ආචාර්ය නිල්මිණි ලියනගේ | පීඨාධිපති (වැඩ බලන), තාක්ෂණ පීඨය |
| ආචාර්ය කේ එම් සී කොන්තසිංහ | පීඨාධිපති, ඉංජිනේරු පීඨය |
| මහාචාර්ය ඩී එම් එස් ප්‍රනාන්දු | පීඨාධිපති (වැඩබලන), සම සෞඛ්‍ය විද්‍යා පීඨය |

- **පීඨ නියෝජිතයන්**

| | |
|---|---|
| මහාචාර්ය ශාමිණී ප්‍රතාපන් | නියෝජිත, වෛද්‍ය විද්‍යා පීඨය |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර් එල් එස් ප්‍රනාන්දු | නියෝජිත, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය |
| මහාචාර්ය වයි කේ වීරකෝන් බණ්ඩා | නියෝජිත, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය |

| | |
|---|---|
| මහාචාර්ය ටී එස් එම් අමරසේන | නියෝජිත, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය |
| මහාචාර්ය චාමලී නහල්ලගේ | නියෝජිත, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය |
| ආචාර්ය සුජීව හෙට්ටිආරච්චි | නියෝජිත, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය |
| මහාචාර්ය එස් එම් සී යූ පී සුබසිංහ | නියෝජිත, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය ඒ ආර් අජ්වර්ඩ් | ප්‍රධාන ලේකම්, විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව |
| ආචාර්ය යූ කේ විජේනායක | නියෝජිත, ඉංජිනේරු පීඨය |
| ආචාර්ය එස් ඩී උදයංග | නියෝජිත, තාක්ෂණ පීඨය |
| ආචාර්ය අසංක වීරසේකර | නියෝජිත, තාක්ෂණ පීඨය |
| ආචාර්ය ලසන්ති ජයතුංග | නියෝජිත, තාක්ෂණ පීඨය |
| ආචාර්ය එන් ආර් සමරනායක | නියෝජිත, සම සෞඛ්‍ය විද්‍යා පීඨය |
| මහාචාර්ය එස් ටී ඩබ්ලිව් එස් යාපා | අධ්‍යක්ෂ, මාණ්ඩලික සංවර්ධන |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී පී එම් ජයවීර | ආරාධනය මත |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් එච් ඩී එන් පී ඕපාත | ආරාධනය මත |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ ඩී ගුණවර්ධන | ආරාධනය මත |
| මහාචාර්ය මෙත්තිකා විතානගේ | ආරාධනය මත |
| ආචාර්ය විකුම් ප්‍රේමලාල් | ආරාධනය මත |
| • රෙජිස්ට්‍රාර් - ඒ බී වැලිවිට මහතා | |
| • පුස්තකාලයාධිපති - ආචාර්ය ඩබ්ලිව් ඒ එන් ඩී විජේසුන්දර | |
| • මූල්‍යාධිකාරී - කේ ටී සී ප්‍රියංගනී මහත්මිය | |

**විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන**

2020 වර්ෂය තුළ ප්‍රදාන ලබාදී නොමැත.

**විවෘත ප්‍රවේශ සහ ප්‍රකාශන ගාස්තු සඳහා ගෙවීම (2016-2020) - * (ඇ.ඩො.) 182.46**

| පීඨය | 2016 | | 2017 | | 2018 | | 2019 | | 2020 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදාන සංඛ්‍යාව | මුළු මුදල (රු) | ප්‍රදාන සංඛ්‍යාව | මුළු මුදල (රු) | ප්‍රදාන සංඛ්‍යාව | මුළු මුදල (රු) | ප්‍රදාන සංඛ්‍යාව | මුළු මුදල (රු) | ප්‍රදාන සංඛ්‍යාව | මුළු මුදල (රු) |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | - | - | - | - | 2 | 500.00 | - | - | 2 | 605.49 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 3 | 940.00 | 3 | 970.00 | 17 | 5,274.34 | 9 | 3,265.23 | 13 | 5,425.99 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය | 3 | 850.00 | 1 | 300.00 | 4 | 927.70 | - | - | 2 | 774.77 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 3 | 1,350.00 | 1 | 499.00 | 5 | 1,862.99 | 4 | 2,466.00 | 2 | 1,015.00 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | - | - | - | - | - | - | - | 1 | 500.00 |
| තාක්ෂණ පීඨය | - | - | - | - | - | - | 12 | 677.47 | 5 | 300.00 |
| එකතුව | **9** | **3,140.00** | **5** | **1,769.00** | **28** | **8,565.03** | **25** | **6,408.70** | **25** | **8,621.25** |

**පර්යේෂණ සම්මාන සඳහා ඉල්ලුම් කර ඇති විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශන - (2015-2019)**

| ප්‍රකාශන | | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| 1 | දේශීය/විදේශීය සමුළු කෘත්‍ය හෝ සම්මන්ත්‍රණවල ප්‍රකාශිත සාරාංශයක් | 400 | 706 | 791 | 942 | 801 |
| 2 | දේශීය/විදේශීය සමුළු කෘත්‍ය හෝ සම්මන්ත්‍රණවල ප්‍රකාශිත පූර්ණ පත්‍රිකාවක් | - | 50 | 76 | 118 | 96 |
| 3 | විශ්වවිද්‍යාල ජර්නලයේ පළ වූ පූර්ණ පත්‍රිකාවක් | - | - | 8 | 41 | - |
| 4 | කතෘ මණ්ඩලයකින් සමාලෝචනය නොවූ සඟරාවල පළ වූ සම්පූර්ණ ලිපි | 123 | - | - | - | - |
| 4 | කතෘ මණ්ඩලයකින් සමාලෝචනය වූ සඟරාවල පළ වූ සම්පූර්ණ ලිපි | 18 | 124 | 99 | 149 | 289 |
| 5 | ඕනෑම සුවිගත සඟරාවක ප්‍රකාශිත ලිපි | - | 173 | 174 | 226 | |
| 6 | සුවිගත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකාවක් (SCI expanded, සමාජ විද්‍යා උපුටා දැක්වීම් දර්ශකය, කලා සහ මානව ශාස්ත්‍ර උපුටා දැක්වීම් දර්ශකය, සිල්වර් ස්කෝපස්, එමරල්ඩ් ඉන්සයිට්, කේබල්ස් ඉන්ටර්නැෂනල්) | 141 | 91 | 122 | 174 | 173 |
| **එකතුව** | | **682** | **1144** | **1270** | **1650** | **1359** |

(මූලාශ්‍රය: පර්යේෂණ සම්මාන - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

## පර්යේෂණ මධ්‍යස්ථාන

පර්යේෂණ සභාව යටතේ දැනට පර්යේෂණ මධ්‍යස්ථාන විසිතුනක් ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථාන ශක්තිමත් පර්යේෂණ පසුබිමක් සහිත කැපවීමෙන් ක්‍රියාකරන උද්යෝගිමත් විද්වතුන් විසින් අදාළ පීඨ තුළ ආරම්භ කර ඇත.. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීමත් සමඟ, එවැනි මධ්‍යස්ථාන සියල්ල එහි විෂය පථය යටතට ගෙන ඇති අතර එමගින් එකමුතුබව සහ සහයෝගිතාවය සඳහා පොදු පර්යේෂණ සහ සංවර්ධන නවෝත්පාදන වේදිකාවක් නිර්මාණය කර ඇත.

**පර්යේෂණ මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ.**

| | පර්යේෂණ මධ්‍යස්ථානය | අධ්‍යක්ෂ |
|---|---|---|
| 1 | ජල තත්ත්ව සහ ඇල්ගී පර්යේෂණ මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එම් එම් පත්මලාල් |
| 2 | වකුගඩු පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය ජේ.කේ.පී. වනිගසූරිය |
| 3 | ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය ජී එන් මලවිගේ |
| 4 | ජෛව තාක්ෂණය සහ ස්නායු විද්‍යාව පිළිබඳ නවෝත්පාදන සඳහා අන්තර් විෂයීක මධ්‍යස්ථානය | මහාචාර්ය රනිල් ද සිල්වා |
| 5 | බහුවිෂයීක පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එච් ඒ සුජීව |
| 6 | කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ මධ්‍යස්ථානය | මහාචාර්ය පී ජේ කුමාරසිංහ |
| 7 | පිළිකා පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එම් බී එස් සෙනෙවිරත්න |
| 8 | උසස් ද්‍රව්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (නැනෝ තාක්ෂණය) | ආචාර්ය ටී එන් බී ඇටම්පාවල |
| 9 | ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ. මහාචාර්ය බී ජී ඩී එන් කේ ද සිල්වා |
| 10 | වන විද්‍යාව සහ පරිසරය පිළිබඳ මධ්‍යස්ථානය | මහාචාර්ය එස් එම් සී යූ පී සුබසිංහ |
| 11 | රොබෝ තාක්ෂණය සහ බුද්ධිමය පද්ධතිය පිළිබඳ නවෝත්පාදන මධ්‍යස්ථානය | ආචාර්ය පී ආර් එස් ද සිල්වා |
| 12 | ඇපල් පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය | මහාචාර්ය ආර් ජී එන් මීගම |
| 13 | ප්‍රාථමික සත්කාර සහ අසාත්මිකතා පර්යේෂණ ජාතික මධ්‍යස්ථානය | ආචාර්ය ජේ එම් කේ සී ජීවන්දර |
| 14 | නිශ්චල දේපල අධ්‍යයන මධ්‍යස්ථානය | ආචාර්ය එන් සී වික්‍රමාරච්චි |
| 15 | පාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආර් එල් එස් ප්‍රනාන්දු |
| 16 | ශාක ද්‍රව්‍ය සහ ශාකසාර නිෂ්පාදන පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය ඩී එච් එච් මුණසිංහ |
| 17 | පරිසරගෝල ප්‍රත්‍යාස්ථතා පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය එම් එස් විතානගේ |
| 18 | බෝ නොවන රෝග පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය බී සී වී සේනාරත්න |
| 19 | සතිය පදනම් කරගත් පර්යේෂණ සහ භාවිතයන් පිළිබඳ මධ්‍යස්ථානය | ආචාර්ය සනත් මහවිතානගේ |

| | | |
|---|---|---|
| 20 | උසස් අධිකරණ වෛද්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය | මහාචාර්ය මුදිත විදානපතිරණ |
| 21 | සමුද්‍ර විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය | ආචාර්ය ආර් ආර් එම් කේ පී රණතුංග |
| 22 | භූ භෞතික විද්‍යාව සහ භූ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය | ආචාර්ය එම් එම් පී එම් ප්‍රනාන්දු |
| 23 | විද්‍යාත්මක ගණනය සහ උසස් ඖෂධ සොයාගැනීමේ මධ්‍යස්ථානය | ආචාර්ය ආර් එස් ජයකොඩි |

## පර්යේෂණ සම්මාන - 2019

**සම්මාන ලැයිස්තුව**

| ඛාණ්ඩ | සම්මාන |
|---|---|
| **1** | දේශීය/විදේශීය සමූළු කෘත්‍ය හෝ සම්මන්ත්‍රණවල ප්‍රකාශිත සාරාංශයක් |
| **2** | දේශීය/විදේශීය සමූළු කෘත්‍ය හෝ සම්මන්ත්‍රණවල ප්‍රකාශිත පූර්ණ පත්‍රිකාවක් |
| **3** | කතෘ මණ්ඩලයකින් සමාලෝචනය වූ සඟරාවක/ ඕනෑම සුවිගත සඟරාවක පළ වූ සම්පූර්ණ ලිපියක් (පහත 4 කාණ්ඩයේ ලැයිස්තුගත කර ඇති සඟරාවක හැර වෙනත් සුවිගත කිරීමේ සේවාවක්) |
| **4** | සුවිගත සඟරාවක පළ වූ සම්පූර්ණ පත්‍රිකාවක්. * පිළිගත් සුවිගත සඟරා http://www.isinet.com/journals හි ලැයිස්තුගත කර ඇත:<br><br>අ. විද්‍යා උපුටන සුවිගත සඟරාව (™) ( වෙබ් ඔෆ් සයන්ස්)<br>ආ. විද්‍යා උපුටන සුවිගත සඟරාව ® (වෙබ් ඔෆ් සයන්ස්)<br>ඇ. කලා සහ මානව ශාස්ත්‍ර උපුටන සුවිගත සඟරාව(වෙබ් ඔෆ් සයන්ස්)<br>ඈ. එල්සිවියර් ස්කෝපස්<br>ඉ. එමරල්ඩ් ඉන්සයිට්,<br>ඊ. කේබල්ස් ඉන්ටර්නැෂනල් |
| **5** | 2019 වසර සඳහා ඉහළම h-දර්ශකය ඇති පර්යේෂකයන්<br><br>• 5 කාණ්ඩයේ සම්මාන සඳහා සලකා බැලීම පිණිස පර්යේෂකයාට 5 හෝ ඊට වැඩි h දර්ශකයක් තිබිය යුතුය<br>• සෑම පීඨයකටම සම්මාන තුනක් පිරිනැමේ<br>• 2016 සිට ක්‍රියාත්මක වන පරිදි එකම අපේක්ෂකයා සඳහා 1 වන, 2 වන සහ 3 වන ස්ථාන වසර පහකට වරක් ප්‍රදානය කෙරේ. |
| **6** | පිළිගත් සුවිගත සඟරාවල සම්පූර්ණ පත්‍රිකා 5ක් හෝ වැඩි ගණනක් ප්‍රකාශයට පත් කර ඇති පර්යේෂකයන් (ඉහත 4 වැනි වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති). අනුබද්ධිත ආයතය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සඳහන් කළ යුතුය. |
| **7** | පූර්ව වෘත්තීය පර්යේෂක සම්මානය<br><br>• h-දර්ශකය 5 හෝ 5 ට වැඩි විය යුතුය<br>• පර්යේෂකයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියේ විය යුතුය<br>• පර්යේෂණ සම්මාන අයදුම්පත් සඳහා නියමිත කාල සීමාව වන විට පර්යේෂකයා අවුරුදු 40 ට අඩු විය යුතුය |

| | |
|---|---|
| | • ප්‍රකාශිත ලිපිවල පළමු කතුවරයා විය යුතුය<br>• ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අනුරූප කතුවරයාගේ අනුබද්ධ ආයතනය විය යුතු අතර විශ්වවිද්‍යාලයේ විද්‍යුත් තැපැල් ලිපිනය පර්යේෂණ ලිපියේ තිබිය යුතුය.<br>• දර්ශක සහරාවල ප්‍රකාශයට පත් කරන ලද සම්පූර්ණ පත්‍රිකා සඳහා ඉහළම සමුච්චිත බලපෑම් සාධකය ඇති අපේක්ෂකයාට සම්මානය පිරිනැමේ. (විද්‍යා උපුටන දර්ශකය / සමාජ විද්‍යා උපුටා දැක්වීම් දර්ශකය, කලා සහ මානව ශාස්ත්‍ර උපුටා දැක්වීම් දර්ශකය, සිල්වර් ස්කෝපස්, එමරල්ඩ් ඉන්සයිට්, කේබල්ස් ඉන්ටර්නැෂනල්) |
| **9** | උපකුලපති සම්මානය (CVCD මාර්ගෝපදේශ අනුගමනය කරන්න)<br>• අයදුම්කරුවන් පසුගිය වසර පහ තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවයේ යෙදී සිට තිබිය යුතුය<br>• කිසිදු පීඨ සාමාජිකයෙකුට වසර පහකට වරකට වඩා සම්මානය ලැබිය නොහැක. |
| **10** | බාහිර පර්යේෂණ ආධාර ලබා ගත් පර්යේෂකයන් |

*සියලුම ප්‍රකාශනවල කර්තෘගේ අනුබද්ධ ආයතය ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නම තිබිය යුතුය.

## ලෝක බැංකු ආධාර යටතේ උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීම

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය කාර්යාලය**

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය දැනුම පදනම් කරගත් කාර්මික සහ සේවා අංශයේ ක්‍රියාකාරකම් හරහා ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීම, විවිධාංගීකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සහ ගෝලීය වශයෙන් ගුණාත්මක උපාධිධාරීන් බිහි කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

### උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ මෙහෙයුම් ඉලක්ක

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ මෙහෙයුමේ ප්‍රධාන ඉලක්ක තුනක් (03) තිබේ.

1. උසස් අධ්‍යාපන අංශයේ ප්‍රමුඛතා විෂයය ධාරාවන් සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම
2. උසස් අධ්‍යාපන අංශයේ උපාධි වැඩසටහන් වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම
3. උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

### ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර

**ලෝක බැංකුව විසින් විවිධ ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනක් යටතේ විශ්වවිද්‍යාල සඳහා ප්‍රදාන කිහිපයක් පිරිනමා ඇත.**

**ප්‍රතිඵල ක්ෂේත්‍රය 1:**
උසස් අධ්‍යාපනයට ක්ෂෙත්‍රයේ බඳවා ගැනීම් වැඩි කිරීම:

විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත (STEM) උපාධි වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කරමින් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් තාක්ෂණ ආයතන තුළ බඳවා ගැනීම් වැඩි කිරීම.

**ප්‍රතිඵල ක්ෂේත්‍රය 2:**

උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම:

අ. (i) ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම වැඩි දියුණු කිරීම (ELTA)

(ii) ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම (ELSE)

ආ. වෘත්තීය සංවර්ධන ප්‍රදානය

ඇ. තත්ත්ව සහතික (QA) ප්‍රදානය

**ප්‍රතිඵල ක්ෂේත්‍රය 3:**

පර්යේෂණ සහ සංවර්ධනය, සහ නවෝත්පාදන ප්‍රවර්ධනය:

1. අරමුණ:

පර්යේෂණ සහ සංවර්ධන, නවෝත්පාදන සහ වාණිජකරණ (RDIC) සංස්කෘතියක් වර්ධනය කිරීම.

(අ) සංවර්ධනය අරමුණුකොටගත් පර්යේෂණ (DOR)

(ආ) පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණය (RIC)

(ඇ) විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතාවය (UBL)

2. ක්‍රියාත්මක කිරීම:

අ. ජාතික මට්ටමේ නියෝජිතායතන හරහා: උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වි.වි.ප්‍ර.කොා.ස. සහ ශ්‍රී.ලං.ඵ.තා.අ ආයතනය

ආ. ආයතනික මට්ටම: විශ්ව විද්‍යාල සහ උසස් තාක්ෂණ ආයතන

ඇ. මෙහෙයුම් අධීක්ෂණ සහාය කණ්ඩායම (OMST)

ඈ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS)

## මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය

මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ කර්තව්‍යය වනුයේ මෙහෙයුම් සහ අධීක්ෂණ සහායක කණ්ඩායමේ සහාය ඇතිව ප්‍රසම්පාදනය, මූල්‍ය කළමනාකරණය සහ කොන්ත්‍රාත් කළමනාකරණය ඇතුළුව විශ්වවිද්‍යාලයේ අදාළ කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩව ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් සංවිධානය කිරීමයි. 2020 වර්ෂය තුළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ ගිණුම්කරණ අධයයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අධ්‍යක්ෂ/මෙ.තා.ලේ. ආචාර්ය ඩබ්ලිව්.ජී.එස්.කැලුම් මහතා යටතේ ක්‍රියාත්මක විය. එමෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන ලෙස කේ.ජී.බ්‍රිටෝ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ/මුදල් ලෙස කේ.ටී.සී.ප්‍රියංගනී මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ/ඉංජිනේරු ලෙස ඕ.ඒ.ඩබ්. කරුණාරත්න මහතා, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී ලෙස ආර්.එම් ගුණරත්න මහත්මිය, ලේකම් ලෙස ඩබ්ලිව්.ඩී.එස්.එස්.ප්‍රේමතිලක මහත්මිය, සහ තාක්ෂණික සහකාරවරුන් ලෙස කේ.ඒ.ඩී.එස්.ටී.කුරුප්පුආරච්චි මෙය, කේ.ඒ.ඩී.නිපුනි රංගිකා මෙය, අයි.එස්.ආර්. ප්‍රනාන්දු මෙනවිය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියට සහාය වනු පිණිස මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ කටයුතු සඳහා අඛණ්ඩව සහයෝගය දැක්වූහ.

වර්තමානයේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයේ ගිණුම්කරණ අධයයන අංශයේ ප්‍රධානී මහාචාර්ය ඒ.එස්.එන්. කාරියවසම්

යටතේ ක්‍රියාත්මක වේ. එම්. එන්. සුරවීර මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන ලෙස කටයුතු කරන අතර එම්.එස්. කුරේ මහත්මිය මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහකාර ලෙස සේවය කරයි.

## ප්‍රතිපාදන වෙන් කිරීම් සහ වියදම්

### (i) ප්‍රතිඵල ක්ෂේත්‍ර 1:

ප්‍රතිඵල ක්ෂේත්‍ර **1** හි පරමාර්ථය වන්නේ විද්‍යා**,** තාක්ෂණ**,** ඉංජිනේරු**,** සහ ගණිතය වැනි ප්‍රමුඛතා විෂය ධාරාවන් තුළ උසස් අධ්‍යාපනය සඳහා බඳවා ගැනීම් වැඩි කිරීමයි**,** ඒ යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයට**,** තාක්ෂණ පීඨයට සහ ව්‍යවහාරික විද්‍යා පීඨයට තරඟකාරී නොවන ප්‍රදාන තුනක් ලැබුණි.

**2020** වර්ෂයේ වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් සහ වියදම් පහත වගුවේ දක්වා ඇත.

| වෛද්‍ය විද්‍යා පීඨය - **STEM** | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංකය | | **2020**.01.01 දිනට අරමුදල් ශේෂය | අරමුදල් ලැබීම් | **2020** දී වියදම් | **2020** දී ප්‍රතිපාදන උපයෝගී කිරීම **%** | ප්‍රසම්පාදන ප්‍රගතිය |
| **1** | සිවිල් වැඩ | මිලියන**156** | **0.0** | මිලියන **1.3** | **0.83 %** | ක්‍රියාත්මක වේ |
| තාක්ෂණ පීඨය - **STEM** | | | | | | |
| 1 | **සිවිල් වැඩ** | **මිලියන** 10.6 | **මිලියන** 10.6 | **මිලියන** 10.6 | 100 % | **සම්පූර්ණ කර ඇත** |
| 2 | **භාණ්ඩ** | **මිලියන** 31.4 | **මිලියන** 65 | **මිලියන** 50 | 51.9 % | **ක්‍රියාත්මක වේ** |
| ව්‍යවහාරික විද්‍යා පීඨය - **STEM** | | | | | | |
| 1 | **භාණ්ඩ** | 0.0 | **මිලියන** 20 | 0.0 | 0.0 % | **මිලදී ගැනීම් සඳහා ඇණවුම් කරන ලදී.** 2020 **දී භාණ්ඩ ලැබී නොමැත.** |

### (ii) ප්‍රතිඵල ක්ෂේත්‍ර 2:

ප්‍රතිඵල ක්ෂේත්‍ර 2 යටතේ, ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම වැඩිදියුණු කිරීම- ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පීඨ මට්ටමේ ප්‍රදාන, ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම වැඩිදියුණු කිරීම- ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන, කලා විෂය ධාරාව සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව වැනි උප ක්ෂේත්‍ර හතරක් යටතේ තරඟකාරී පදනමින් ප්‍රදාන ලබා ගැනීමට විශ්ව විද්‍යාල සුදුසුකම් ලබා ඇත.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යන පීඨ සඳහා එක් ප්‍රදානයක වටිනාකම රුපියල් මිලියන 120ක් වූ පීඨ මට්ටමේ ප්‍රදාන තුනක් (03) දිනාගෙන ඇත. ඊට අමතරව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා අධ්‍යයනාංශය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, තීරණ විද්‍යා අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ

අධ්‍යයනාංශය සහ ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය විසින් රුපියල් මිලියන 18 බැගින් වටිනා අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන පහක් (05) දිනා ඇත.
දර්ශන ශූරී උපාධි ශිෂ්‍යත්වය ලබා ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 40කට වඩා තෝරාගෙන තිබුණද. එක් අයෙකුට රුපියල් මිලියන 9 බැගින් වූ එම ශිෂ්‍යත්ව පහසුකම ලබාගෙන ඇත්තේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු පමණි.

2020 වර්ෂයේ මුළු ප්‍රතිපාදන සහ වියදම් පහත වගුවේ දක්වා ඇත.

| **1. ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම වැඩිදියුණු කිරීම- ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා** පීඨ මට්ටමේ ප්‍රදාන | | | | | |
|---|---|---|---|---|---|
| **අනු අංකය** | **පීඨය** | **මුළු ප්‍රතිපාදනය** | **2020 දී වියදම්** | **2020 දී ප්‍රතිපාදන උපයෝගී කිරීම %** | **ප්‍රසම්පාදන ප්‍රගතිය** |
| 1 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | මිලියන 120 | මිලියන 30.7 | 25.5 % | ක්‍රියාත්මක වේ |
| 2 | ව්‍යවහාරික විද්‍යා පීඨය | මිලියන 120 | මිලියන 4.3 | 3.6 % | ක්‍රියාත්මක වේ |
| 3 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | මිලියන 120 | මිලියන 33.1 | 27.6 % | ක්‍රියාත්මක වේ |
| **2. ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම වැඩිදියුණු කිරීම- ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා** අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදාන | | | | | |
| 1 | මානව විද්‍යා අධ්‍යයනාංශය | මිලියන 18 | මිලියන 3.4 | 18.9 % | ක්‍රියාත්මක වේ |
| 2 | භූගෝල විද්‍යා අධ්‍යයනාංශය | මිලියන 18 | මිලියන 5.4 | 30.0 % | ක්‍රියාත්මක වේ |
| 3 | තීරණ විද්‍යා අධ්‍යයනාංශය | මිලියන 18 | මිලියන 8.2 | 45.6 % | ක්‍රියාත්මක වේ |
| 4 | අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | මිලියන 18 | මිලියන 5.2 | 28.9 % | ක්‍රියාත්මක වේ |
| 5 | ක්‍රීඩා විද්‍යා අධ්‍යයනාංශය | මිලියන 18 | මිලියන 1.2 | 6.7 % | ක්‍රියාත්මක වේ |

| **3.** දර්ශන ශූරී උපාධි ශිෂ්‍යත්වය සඳහා මානව සම්පත් සංවර්ධන ප්‍රදාන | | | | | | |
|---|---|---|---|---|---|---|
| **අනු අංකය** | **පීඨය** | **ශිෂ්‍යත්ව ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව** | **මුලු ප්‍රතිපාදනය** | **2020 දී වියදම්** | **2020 දී ප්‍රතිපාදන උපයෝගී කිරීම %** | **ප්‍රගතිය** |
| 1 | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 04 | මිලියන 36 | මිලියන 6 | 16.7 % | ක්‍රියාත්මක වේ |
| 2 | ව්‍යවහාරික විද්‍යා පීඨය | 03 | මිලියන 27 | මිලියන 9.0 | 33.3 % | ක්‍රියාත්මක වේ |
| 3 | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | 14 | මිලියන 126 | මිලියන 38.4 | 30.5 % | ක්‍රියාත්මක වේ |
| 4 | වෛද්‍ය විද්‍යා පීඨය | 02 | මිලියන 18 | මිලියන 2.2 | 12.2 % | ක්‍රියාත්මක වේ |

**(iii) ප්‍රතිඵල ක්ෂේත්‍ර 3:**

ප්‍රතිඵල ක්ෂෙත්‍ර 3 හි අරමුණ වනුයේ විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමවේ. මේ යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජකරණ (RIC) ප්‍රදාන තුනක්, සංවර්ධනය අරමුණුකොටගත් පර්යේෂණ (DOR) ප්‍රදාන දෙකක්, නවෝත්පාදන වාණිජකරණ වැඩිදියුණු කිරීම් (ICE) ප්‍රදානයක් සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා අරමුදල් ලැබී ඇත.

2020 **වර්ෂයේ මුළු ප්‍රතිපාදන සහ වියදම් පහත වගුවේ දක්වා ඇත.**

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.** පර්යේෂණ සහ නවෝත්පාදන වාණිජකරණ **(RIC)** ප්‍රදාන: | | | | | |
| අනු අංකය | පීඨය | මුළු ප්‍රතිපාදනය | **2020** දී වියදම් | **2020** දී ප්‍රතිපාදන උපයෝගී කිරීම **%** | ප්‍රගතිය |
| I | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | මිලියන **45** | මිලියන **1.9** | **4.2 %** | ක්‍රියාත්මක වේ |
| Ii | ව්‍යවහාරික විද්‍යා පීඨය | මිලියන **45** | මිලියන **2.8** | **6.2 %** | ක්‍රියාත්මක වේ |
| Iii | තාක්ෂණ පීඨය | මිලියන **25** | මිලියන **4.1** | **16.4 %** | ක්‍රියාත්මක වේ |
| 2. සංවර්ධනය අරමුණුකොටගත් පර්යේෂණ ප්‍රදාන **(DOR) :** | | | | | |
| I | කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය | මිලියන **10** | මිලියන **3.3** | **33 %** | ක්‍රියාත්මක වේ |
| Ii | වෛද්‍ය විද්‍යා පීඨය | මිලියන **35** | මිලියන **15.1** | **43.1 %** | ක්‍රියාත්මක වේ |
| 3. නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම සඳහා වූ **(ICE)** ප්‍රදානය | | | | | |
| I | ව්‍යවහාරික විද්‍යා පීඨය | මිලියන **40** | මිලියන **10.4** | **26 %** | ක්‍රියාත්මක වේ |
| 4. විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය | | | | | |
| I | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | මිලියන **15** | මිලියන **3.4** | **22.7 %** | ක්‍රියාත්මක වේ |

## නිගමනය

කොවිඩ් 19 වසංගතය පැතිරීම වැලැක්වීම සඳහා රජය විසින් සමාජ දුරස්ථභාවය වැනි සීමා කිරීම් නියම කිරීම සහ රටපුරා වසා දැමීම නිසා එක් එක් ප්‍රදාන යටතේ නියමිතව තිබූ ක්‍රියාකාරකම් බොහොමයක් අඩාල විය. ඇතැම් භාණ්ඩ සඳහා ආනයන සීමා කිරීම් සිදුකිරීම සහ මව් සමාගම්වල නිෂ්පාදන ගැටළු හේතුවෙන් ප්‍රසම්පාදන ප්‍රමාදවීම් සිදු විය. ශ්‍රම බලකායේ අවශ්‍ය ප්‍රමාණය නොමැතිවීම හේතුවෙන් සිවිල් වැඩ නියමිත

දිනට නිම කිරීමට බාධා ඇති විය. භෞතිකව වැඩමුළු පැවැත්වීමට නොහැකි විය. එහෙයින් බොහෝ වැඩමුළු සූම් තාක්ෂණය භාවිතයෙන් පවත්වන ලදී.

අප රටේ මෙන්ම මුළු ලෝකයේම පවතින සෞඛ්‍ය තත්ත්වය තවමත් වැඩිදියුණු වී නැතත්, AHEAD ව්‍යාපෘති මෙහෙයුම, මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය සහ සියලුම ප්‍රදාන සම්බන්ධ කාර්ය මණ්ඩල, ඉලක්ක සපුරා ගැනීමට සහ නියමිත සියලු කාර්යයන් සම්පූර්ණ කිරීමට කණ්ඩායමක් ලෙස එක්ව කටයුතු කරයි.

## තත්ත්ව සහතික මධ්‍යස්ථානය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය රාජ්‍ය ආයතනයක් වශයෙන් එහි ගුණාත්මක භාවය සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා සිය වගකීම නිසි පරිදි ඉටු කිරීම අවශ්‍යය. තත්ත්ව සහතිකය යනු විශ්ව විද්‍යාලයකට එහි සම්මානවල ප්‍රමිතීන් සහ එහි අධ්‍යාපන කටයුතුවල ගුණාත්මකභාවය සහ දැනුම උත්පාදනය පවත්වා ගෙන යන බවට විශ්වාසයෙන් සහ නිශ්චිතව සහතික කළ හැකි මාධ්‍යය වේ.

මෙම සන්දර්භය තුළ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ තත්ත්ව සහතික සභාව (QAC) විසින් පනවා ඇති ජාතික තත්ත්ව සහතික රාමුවට අනුකූලව තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) වගබලාගත යුතුය. විශ්වවිද්‍යාලය තුළ තත්ත්ව සහතිකය පිළිබඳ අපේක්ෂිත ප්‍රමිතීන් පවත්වා ගැනීම සුවිශාල කාර්යයක් වුවද, විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ති සේනාරත්න, තත්ත්ව සහතික මධ්‍යස්ථානය සම්බන්ධයෙන් වූ අධ්‍යයන හා පරිපාලනමය කාර්යයන් ඉටු කිරීම සඳහා අර්ධකාලීන පදනමින් කටයුතු කරයි.

2020 වර්ෂය තුළ තත්ත්ව සහතික ඒකකය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

1. **අභ්‍යන්තර තත්ත්ව සහතිකය ශක්තිමත් කිරීම පිළිබඳ 09/2019 කොමිෂන් සභා චක්‍රලේඛයට අනුකූලව තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය ලෙස නැවත නම් කිරීම.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය 09/2019 කොමිෂන් සභා චක්‍රලේඛය මගින් උපදෙස් දී ඇති පරිදි 2020.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය ලෙස ප්‍රතිසංවිධානය කර ඇත. තවද, පීඨවල අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකක, තත්ත්ව සහතික ඒකක ලෙස යළි නම් කර ඇත.

විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධති ශක්තිමත් කිරීම සඳහා 2019.10.07 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ 09/2019 මගින් පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත.

(i) සෑම විශ්වවිද්‍යාලයකම අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (IQAU) එහි විශ්වවිද්‍යාලීය මට්ටම වඩා හොඳින් පිළිබිඹු කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) ලෙස නැවත නම් කිරීම.

(ii) තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය අධ්‍යයන අංශයක් ලෙස ක්‍රියාත්මක වීම.

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතේ 46(6)(vii) වගන්තියේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාර, අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයෙහි වත්මන් කළමනාකරණ කමිටුව සෑම විශ්වවිද්‍යාලයකම සෙනෙට් සභාවේ ස්ථාවර කමිටුවක් බවට පත් කරනු ලැබේ.

(iv) ස්ථාවර කමිටුවේ සංයුතිය අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයෙහි වත්මන් කළමනාකරණ කමිටුවට සමාන වේ. උපකුලපතිවරයා එම කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරයි.

(v) තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ නියෝජ්‍ය උපකුලපති, රෙක්ටර් හෝ පීඨාධිපතිවරයෙකුට සමාන මට්ටමක ස්ථානගත කිරීමට බලාපොරොත්තු වේ.

ඉහත කොමිෂන් සභා චක්‍රලේඛය මගින් යෝජනා කරන ලද සංශෝධන ඇතුළත් කිරීම සඳහා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2017 අංක 01 දරන අභ්‍යන්තර තත්ත්ව සහතික අතුරු ව්‍යවස්ථාව 2020.01.21 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද අතර 2020 අංක 01 දරන අතුරු ව්‍යවස්ථාව සකස් කර ඇත. සංශෝධිත අතුරු ව්‍යවස්ථාව 2020.02.27 දින පැවති 380 වැනි සෙනෙට් සභා රැස්වීමේදී සහ 2020.03.12 දින පැවති 498 වැනි විශ්වවිද්‍යාල සභා රැස්වීමේදී අනුමත කරන ලදී.

**2. ආයතනික සමාලෝචනයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම**

විශ්ව විද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ (IR) අවසන් වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද 2018-2022 ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික සභාවට ඉදිරිපත් කරන ලදී. එය විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කිරීම සඳහා 2020.01.21 දින විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලසුම් කමිටුව වෙත ද ඉදිරිපත් කරන ලදී.

**(අ). ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යයන් පිළිබඳ විශ්ලේෂණය:**

ආයතනික සමාලෝචනයේ අවසන් සමාලෝචන වාර්තාවේ දක්වා ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 2019.11.06 දින පැවති තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනුකාරක සභාවේදී සමාලෝචනය කරන ලදී. ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් විශ්ලේෂණය 2020.09.24 දින පැවති ස්ථාවර තත්ත්ව සහතික මධයස්ථාන රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී. ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මත පදනම්ව, ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කර ඇති පහත ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දීමට තීරණය කරන ලදී.

(i) විශ්වවිද්‍යාලය සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා කමිටු පත් කිරීමට:
1. සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තිය
2. ප්‍රජා සහභාගීත්වය සහ භාහිර ප්‍රජා සත්කාර පිළිබඳ ප්‍රතිපත්තිය
3. අධ්‍යයන වගවීම පිළිබඳ ප්‍රතිපත්තිය
(පත් කර ඇති කමිටු සාමාජිකයින් පහත දැක්වේ).

(ii) විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයාගේ විෂය පථයට අයත් විශ්වවිද්‍යාල කළමනාකරණ මාර්ගෝපදේශය සකස් කිරීම කඩිනම් කිරීම.

(iii) පීඨවල සහ විවිධ අංශවල ව්‍යාප්තව පවතින තොරතුරු පද්ධති ඒකාබද්ධ කරමින් විශ්වවිද්‍යාලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් පිහිටුවීම.

(iv) අධ්‍යයන කාර්ය මණ්ඩල සහ පරිපාලන නිලධාරීන්ගේ රැස්වීමට ඇතුළත් කළ යුතු න්‍යාය පත්‍ර අයිතමයක් ලෙස තත්ත්ව සහතිකය ඇතුළත් කිරීම

(v) විශ්වවිද්‍යාල දින දර්ශනය වෙබ් පාදක ලේඛනයක් ලෙස සංවර්ධනය කිරීම

(vi) ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් සකස් කරන ලද විභාග පිළිබඳ මෙහෙයුම් අත්පොත සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් පසු විශ්වවිද්‍යාලයේ අනෙකුත් සියලුම පීඨ සඳහා යොදා ගැනීම

මෙම ක්ෂේත්‍රවල ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ.

**(i) අනු කමිටු සාමාජිකත්වය**:

**1. සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා වන කමිටුව**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. ජී. යසවර්ධන - පීඨාධිපති/වෛ.වි.පීඨය (සභාපති)
ආචාර්ය අසිත කුරේ - ව්‍ය.වි.පීඨය
නිශාන්ති විදානගේ මෙනවිය - අධ්‍යක්ෂ/ PE
ආචාර්ය එම්.එච්.වී.ඩී.වයි.මුදුන්කොටුව- ඉං.පීඨය
වෛද්‍ය රාජිත ගුණරත්න - තා.පීඨය

**2. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රජා සත්කාර පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීමේ කමිටුව**

ආචාර්ය ශ්‍යාමලී සමරනායක - වෛ.වි.පීඨය (සභාපති)
ආචාර්ය කේ.පී. ලලිත් චන්ද්‍රලාල් - ක.අ.හා වා.පීඨය
කේ.ඩබ්ලිව්.ඒ.එම්.කොන්පොල මෙනවිය – SAL
ආචාර්ය වරුණි ජයසූරිය - ව්‍ය.වි.පීඨය
ආචාර්ය එම්.ඒ.එස්. විජේසිංහ - මා.ශා.හා.ස.වි.පීඨය

**3. අධ්‍යයන වගවීම පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීමේ කමිටුව**

මහාචාර්ය පී.පී. රසික පෙරේරා – වෛ.වි.පීඨය (සභාපති)
ආචාර්ය තුසිත අබේසේකර – ක.අ.හා වා.පීඨය
ඉරෝෂා චන්ද්‍රසේකර මෙනවිය - මා.ශා.හා.ස.වි.පීඨය
ඩබ්ලිව්.ආර්. ද මැල් මහතා – තා.පීඨය

**4. විශ්ව විද්‍යාලය පුරා ක.තො.ප. සංවර්ධනය කිරීමේ කමිටුව**

ආචාර්ය සී.රනිල් පීරිස් - ක.අ.හා වා.පීඨය (සභාපති)

ආචාර්ය පී.ඩී.කේ.අමිත කුමාර - ක.අ.හා වා.පීඨය

හර්ෂ මුණසිංහ මහතා - තො.තා.අ.මධ්‍යස්ථානය

**(ii). විභාග පිළිබඳ මෙහෙයුම් අත්පොත සහ සම්මත මෙහෙයුම් පටිපාටිය**

ව්‍යවහාරික විද්‍යා පීඨයේ තත්ත්ව සහතික ඒකකයේ සම්බන්ධීකාරක, මහාචාර්ය දිනිති පීරිස් විසින් ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා සකස් කරන ලද විභාග පිළිබඳ මෙහෙයුම් අත්පොත සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය 2019.09.24 දින තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටුවේදී ඉදිරිපත් කරන ලදී. මෙම ලේඛන දෙක සියලුම පීඨාධිපතිවරුන් සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ තත්ත්ව සහතික ඒකක සම්බන්ධීකාරකවරුන් වෙත සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ අදහස් දැක්වීම සඳහා යැවීමට තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටුව තීරණය කළේය. මෙම අදහස් මත පදනම්ව, විශ්ව විද්‍යාලය සඳහා පොදු මෙහෙයුම් අත්පොතක් සකස් කරනු ලබන අතර, තම

අවශ්‍යතාවලට සරිලන පරිදි සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කරන ලෙස පීඨවලින් ඉල්ලා සිටිනු ලැබේ.

**(ආ) විශ්වවිද්‍යාල දින දර්ශනය:**

තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ තවත් වැදගත් කාර්යයක් සහ දැඩි අවධානයක් යොමුවූ කාරණයක් වන්නේ 2017 ආයතනික සමාලෝචන වාර්තාව මගින් නිර්දේශ කර ඇති විශ්වවිද්‍යාල දින දර්ශනය සකස් කිරීමයි. 1998 වසරෙන් පසු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් දින දර්ශනයක් ප්‍රකාශයට පත් කර නොමැති බව සටහන් විය . විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයක් මගින් විශ්වවිද්‍යාලයක් විසින් එවැනි ලේඛනයක් සකස් කිරීම අනිවාර්ය නොවන නමුත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය විසින් එම ලේඛනය හොඳම භාවිතයක් ලෙස සකස් කරනු ලැබේ. එබැවින් එවැනි ලේඛනයක් සකස් කිරීම යහපත් ක්‍රියාවක් සේ සැලකේ. තත්ත්ව සහතික මධ්‍යස්ථාන විසින් සකස් කරන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දින දර්ශනයේ කෙටුම්පතක් 2020.08.27 දින පැවති තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටුවෙදී ඉදිරිපත් කරන ලදී. මෙම ලේඛනයේ අවසන් කෙටුම්පත 2020.12.31 වන විට සකස් කර ඇති අතර එය 2021 පළමු කාර්තුවේදී සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

**3. තත්ත්ව සහතික ක්‍රියාවලිය සඳහා ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය පිළිබඳ ප්‍රතිපත්තිය**

2020.07.30 දින පැවති විශ්ව විද්‍යාලයේ තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනුකමිටුවේ දී, එක් එක් විශ්ව විද්‍යාලය විසින් තත්ත්ව සහතික කාර්යයෙහි සිසුන් සම්බන්ධ කර ගැනීමේ ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කරන ලද චක්‍රලේඛය පිළිබඳව සාකච්ඡා කරන ලදී . විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශයට අනුව, විශ්ව විද්‍යාල ජීවිතයේ පහත සඳහන් අංශවලට සහභාගී වීම සඳහා සිසුන් දිරිමත් කළ යුතු අතර, ඒ සියල්ල ශිෂ්‍ය ඉගෙනීමේ අත්දැකීමට බලපාන අතර තත්ත්ව සහතිකය කාර්යයෙහි අවියෝජනීය අංග වේ .

- නවක සිසුන් ප්‍රේරණය සහ දිශානුයෝජනය
- ඉගැන්වීම්-ඉගෙනීමේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම
- වැඩසටහන් සැලසුම් කිරීම, පැවැත්වීම සහ සංවිධානය කිරීම
- ඉගෙනුම් සම්පත්
- ශිෂ්‍ය සුභසාධනය සහ යහපැවැත්ම
- වෘත්තීය මාර්ගෝපදේශනය සහ සේවා නියුක්තභාවය
- විශ්වවිද්‍යාල යටිතල පහසුකම් සංවර්ධනය
- ප්‍රජා භාහිර ක්‍රියාකාරකම්
- ශිෂ්‍ය අත්දැකීම්වලට සම්බන්ධ ක්ෂේත්‍රවලට අදාළව විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම
- උපාධිධාරී පොදු ගුණාංග වර්ධනය කිරීම

තත්ත්ව සහතික ක්‍රියාවලිය සඳහා ශිෂ්‍යයින් සම්බන්ධවීම පිළිබඳ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, පීඨ තත්ත්ව සහතික ඒකකවල සම්බන්ධීකාරකවරුන් සහ සෙනෙට් සභාව විසින් නම්කරන ලද පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙම ප්‍රතිපත්තිය, තත්ත්ව සහතික ක්‍රියාවලියේ ශිෂ්‍යයින් නියැලීම පිළිබඳව නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයට අනුකූලව සකස් කිරීමට නියමිතය. ශ්‍රී

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ සහාය ඇතිව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙම කාර්යය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය සකස් කිරීමට පෙර, පහත සඳහන් කරුණු දහය යටතේ තත්ත්ව සහතික කාර්යයෙහි ශිෂ්‍යයින් නියැලීමේ වර්තමාන තත්ත්වය පිළිබඳව එක් එක් පීඨයෙන් රැස් කරන ලද තොරතුරු මත පදනම්ව විශ්ලේෂණයක් සිදු කර ඇත.

1. ශිෂ්‍ය අත්දැකීම් සම්බන්ධ ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම
2. උපාධිධාරී පොදු ගුණාංග වර්ධනය කිරීම
3. වැඩසටහන් සැලසුම් කිරීම, පැවැත්වීම සහ සංවිධානය කිරීම
4. ඉගැන්වීම්-ඉගෙනීමේ ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම
5. විශ්වවිද්‍යාල යටිතල පහසුකම් සංවර්ධනය
6. නවක සිසුන් ප්‍රේරණය සහ දිශානුයෝජනය
7. ඉගෙනුම් සම්පත්
8. ශිෂ්‍ය සුභසාධනය සහ යහපැවැත්ම
9. වෘත්තීය මාර්ගෝපදේශනය සහ සේවා නියුක්තභාවය
10. භාහිර ප්‍රජා සත්කාර ක්‍රියාකාරකම්

මෙම විශ්ලේෂණය සඳහා සිසුන් කණ්ඩායම් දෙකකට, එනම් උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි සිසුන් වශයෙන් වර්ග කර ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි පීඨ හතක දත්ත භාවිතා කරමින් උපාධි අපේක්ෂකයින් විශ්ලේෂණය කර ඇති අතර, පහත දක්වා ඇති පරිදි සහතික, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි භාවිතා කරමින් පශ්චාත් උපාධි සිසුන් විශ්ලේෂණය කර ඇත.

1. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
2. අධීක්ෂණ සහ ඇගයීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
3. අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති, දර්ශන පති සහ දර්ශන ශූරී උපාධිය
4. භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
5. ව්‍යවහාරික මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය
6. කාර්මික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය

උපාධි අපේක්ෂකයින් විශ්ලේෂණය කිරීමේදී පහත දැක්වෙන පරිදි පොදු ලක්ෂණ සහ විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනාගන්නා ලද බව අධ්‍යක්ෂවරයා පැහැදිලි කළේය.

**සෑම පීඨයකම දක්නට ලැබෙන පොදු ලක්ෂණ (උපාධි අපේක්ෂකයින්)**

1. ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු අධ්‍යයනාංශ රැස්වීම්වලට සහභාගී වන අතර උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී ද තම ගැටළු ප්‍රකාශ කරති.

2. ශිෂ්‍ය නියෝජිතයින් දෙදෙනෙකු පීඨ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වන අතර විෂයමාලා, පීඨයේ යටිතල පහසුකම් සහ සුබසාධන පහසුකම් (නේවාසිකාගාර සහ සනීපාරක්ෂක පහසුකම්, දේශන ශාලා ආදිය) පිළිබඳ සිය කනස්සල්ල පළ කරති.

3. සියලුම කණ්ඩායම්වල නියෝජිතයන් පීඨවල ශිෂ්‍ය සුබසාධන කමිටු රැස්වීම්වලට සහභාගි වන අතර එහිදී ශිෂ්‍ය සුබසාධනය සහ යහපැවැත්ම පිළිබඳව ඔවුන්ගේ යෝජනා සහ අදහස් ඉදිරිපත් කරයි.

4. උපාධි පැතිකඩ සහ අධ්‍යයන වැඩසටහන්වල ගුණාංග සැලසුම් කිරීමේදී සිසුන්ගේ අදහස් සලකා බලනු ලැබේ.

**5.** වැඩසටහන් සැලසුම් කිරීමේ අදියරේදී සිසුන් එහි කොටස්කරුවන් ලෙස නියෝජනය කරන අතර විෂයමාලා සංවර්ධනය සහ බෙදාහැරීමේදී ඔවුන්ගේ ප්‍රතිපෝෂණ භාවිතා කෙරේ.

6. පිරිනමනු ලබන සෑම පාඨමාලාවකම සමාසික අධ්‍යයන වාරය අවසානයේ දී පාඨමාලා සහ කථිකාචාර්යවරුන් පිළිබඳ ඇගයීම් සිසුන්ගෙන් ලබාගනු ලැබේ.

7. පීඨයේ ජ්‍යෙෂ්ඨ සිසුන් දිශානුයොජන වැඩසටහනේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ මෙහෙයවීම සඳහා සහභාගී වේ.

8. මාසික පීඨ මණ්ඩල රැස්වීම් සහ මාසික ශිෂ්‍ය සුභසාධන රැස්වීම් වලදී සිසුන්ට තම යෝජනා සහ අදහස් ඉදිරිපත් කළ හැක.

9. සිසුන්ට ඔවුන්ගේ විශේෂීකරණය වූ ක්ෂේත්‍රවල සීමාවාසික පුහුණුව ලබා දෙන අතර ඔවුන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සමඟ පූර්ව සීමාවාසික සංවිධානය කිරීමේ ක්‍රියාකාරකම්වල නිරත වේ.

10. සිසුහු ප්‍රජා සත්කාරක ව්‍යාපෘතිවල නිරත වන අතර ලේ දන්දීමේ වැඩසටහන්, ශ්‍රමදාන ව්‍යාපාර සහ පුස්තකාලවලට පොත් පරිත්‍යාග කිරීම වැනි ප්‍රජා සේවා කටයුතු සිදු කරති.

**සෑම පීඨයකම දැකිය හැකි විශේෂ ලක්ෂණ (උපාධි අපේක්ෂකයින්):**

| පීඨය | විශේෂ ලක්ෂණ |
|---|---|
| මා.ශා.ස.වි.පී. | සියලුම අධ්‍යයනාංශවල ක්ෂේත්‍ර චාරිකා සහ ආයතනික අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම සඳහා සිසුන් සම්බන්ධ වේ. |
| | යටිතල පහසුකම් (දේශන ශාලා, බහුමාධ්‍ය ආදිය) ඇතුළු සිසුන්ගේ ඉල්ලීම් දෙපාර්තමේන්තු ශිෂ්‍ය සංගම් හරහා දෙපාර්තමේන්තු රැස්වීම්වලදී කැඳවනු ලැබේ. |
| | ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් ඇගයීම සඳහා වැඩමුළු අනුව ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ලබා ගන්නා ලදී. |
| | වාර්ෂික සමාරම්භක උත්සවයේදී එක් සිසුවෙකු විසින් සභාව අමතනු ලබන අතර එක් එක් අධ්‍යයනාංශයට තෝරාගනු ලබන නව විශේෂවේදී උපාධි අපේක්ෂකයින් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව දිශානුයෝජන වැඩසටහන් සංවිධානය කරයි. |

| | |
|---|---|
| | අධ්‍යයනාංශ විසින් සංවිධානය කරනු ලබන මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සහ අනෙකුත් සම්මන්ත්‍රණවල කැඳවුම්කරුවන්, සම කැඳවුම්කරුවන් සහ සමපදස්තයින් ලෙස සිසුහු කටයුතු කරති . |
| | සිසුන් විසින් මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී සංස්කෘතික සංදර්ශන සහ අධ්‍යයනාංශ සම්මන්ත්‍රණවල සමාරම්භක උත්සවවල සහ සංස්කෘතික සංදර්ශනවල ඉදිරිපත් කිරීම් සිදුකනු ලබයි. |
| | සිසුන් සංස්කාරකවරුන්ගේ සහායකයින් ලෙස ක්‍රියා කරන අතර අධ්‍යයනාංශ විසින් ප්‍රකාශයට පත් කරන ලද සඟරා, ජර්නල්, පුවත් ලිපි සඳහා කතුවරුන්ගෙන් ලිපි එකතු කිරීමට සහාය වේ. |
| | අධ්‍යයනාංශවල ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ අධ්‍යයන හා සුභසාධන කටයුතුවලදී කනිෂ්ඨ සිසුන් සඳහා උපදේශකයන් ලෙස ක්‍රියා කරති. |
| | තම විශේෂීකරණ ක්ෂේත්‍රවලට අදාළව සීමාවාසික පුහුණුව ලබාදේ |
| | සිසුහු තම ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කර ගැනීම සඳහා පීඨ ප්‍රවේශ සමාජයේ කටයුතුවල සක්‍රීයව නියැලී සිටිති. |
| | ශිෂ්‍ය නියෝජිතයයෝ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සමඟ සහයෝගයෙන් රැකියා ප්‍රදර්ශන සහ අදාළ වෘත්තීය මාර්ගෝපදේශක ක්‍රියාකාරකම් සංවිධානය කරති. |
| වෛ.වි.පී. | අවශ්‍ය අවස්ථාවලදී සමාලෝචන ක්‍රියාවලිය (වැඩසටහන්/ ආයතනික) සම්බන්ධයෙන් විශේෂිත ශිෂ්‍ය රැස්වීම් පවත්වනු ලැබේ. |
| | එක් එක් මොඩියුලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා සිසුන්ගේ ප්‍රතිපෝෂණ එක් රැස් කරනු ලැබේ. |
| | ආපනශාලා සහ පුස්තකාල කමිටුවල දී යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ අදහස් සලකා බලනු ලැබේ. |
| | දිශානුයෝජන වැඩසටහනේ කාලසටහනේ ශිෂ්‍ය සංගමය සහ ශිෂ්‍ය සමාජ සහ සමිති සඳහා ප්‍රමානවත් කාලයක් ලබා දේ. |
| | පීඨාධිපතිවරයා කණ්ඩායම් නියෝජිතයින් සහ අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ පවත්වනු ලබන රැස්වීමකදී සිසුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම පිළිබඳ අදහස් ලබා ගනී. |
| | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් රෝහල්වල සීමාවාසික නිවාස නිලධාරීන් ලෙස පත් කිරීමට පෙර සිසුන් සඳහා දිශානුයෝජන වැඩසටහන් පවත්වයි. |
| ඉං.පී. | වොෂින්ටන් ගිවිසුමේ අවශ්‍යතා සහ කර්මාන්තවල යෙදවුම මගින් උපාධිධාරී සුවිශේෂීතා විශාල ලෙස තීරණය වේ. |
| | ශිෂ්‍ය උපදේශක කමිටු පවත්වන අවස්ථාවල දී පාඨමාලා පැවැත්වීම සහ සංවිධානය කිරීම පිළිබඳ යෝජනා සහ අදහස් එක් එක් අධ්‍යයනාංශය විසින් ලබා ගනු ලැබේ. |

| | |
|---|---|
| | ශිෂ්‍ය නියෝජිතයින්ට ඕනෑම ගැටළුවක් පාඨමාලා සම්බන්ධීකාරක හරහා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත දැනුම් දිය හැක. |
| | ශිෂ්‍ය අනුකමිටු හරහා දිශානති කමිටුවේදී සිසුන්ගේ දායකත්වය ලබා ගැනේ |
| | ශිෂ්‍ය උපදේශක කමිටු තුළ දී ඉගෙනුම් සම්පත් පිළිබඳව සිසුන්ගේ යෝජනා සහ අදහස් ලබා ගැනේ. |
| | සීමාවාසික පුහුණුව සම්බන්ධයෙන් සිසුන්ගේ යෝජනා සහ අදහස්, පීඨ මණ්ඩල, සුබසාධන සහ ශිෂ්‍ය උපදේශක කමිටු රැස්වීම්වලදී ගනු ලැබේ. |
| | යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ යෝජනා සහ අදහස් ශිෂ්‍ය සුබසාධන රැස්වීම්වලදී සලකා බලනු ලැබේ. |
| ස.සෞ.වි.පී | උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී උපාධිධාරීන්ගේ තෘප්තිමත්බව පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වනු ලැබේ. |
| | එක් එක් සිසුන්ගේ යහපැවැත්ම හඳුනා ගැනීම සඳහා පුද්ගලික උපදේශකවරුන් සමඟ රැස්වීම් සඳහා විෂයමාලා කාලය වෙන් කරනු ලැබේ. |
| | සිසුන්ගෙන් ලබාගත් ප්‍රතිපෝෂණ (කාර්මික, සායනික සහ රැකියා තෘප්තිමත් සමීක්ෂණය) වෘත්තීය අංශ සහ සේවා නියුක්තිය වැඩිදියුණු කිරීම සඳහා අන්තර්ගත කරනු ලැබේ. |
| | යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ යෝජනා සහ අදහස් ශිෂ්‍ය සුබසාධන රැස්වීම්වලදී සලකා බලනු ලැබේ. |

මා.ශා.ස.වි.පී. - මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ඉං.පී. - ඉංජිනේරු පීඨය
වෛ.වි.පී. - වෛද්‍ය විද්‍යා පීඨය
ස.සෞ.වි.පී. - සම සෞඛ්‍ය විද්‍යා පීඨය

පීඨ තත්ත්ව සහතික ඒකක රැස්වීම් සහ තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටු රැස්වීම් සඳහා සිසුන්ට ආරාධනා කිරීමට තීරණය කරන ලදී. මෙහිදී 3 වන වසරේ හොඳම සිසුන්ගෙන් හෝ පීඨාධිපති ලැයිස්තුවෙන්/ශිෂ්‍ය සංගමයෙන්/විෂය සංගම්වලින්/තත්ත්ව කවවලින්/ශිෂ්‍ය උපදේශක කමිටුවලින් සිසුන් තෝරාගත හැකිය. පීඨ තත්ත්ව සහතික ඒකක රැස්වීම් සඳහා සිසුන් දෙදෙනා තෝරා ගන්නේ කෙසේද යන්න තීරණය කිරීමට සෑම පීඨයකටම ඉඩ ලබා දීමටත්, මාස 06 ක කාලයක් සඳහා මාරුවීමේ පදනම මත පීඨ තත්ත්ව සහතික ඒකකවලින් තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටු රැස්වීම් සඳහා සිසුන් තෝරා ගැනීමටත් තවදුරටත් තීරණය විය.

**4. විෂයමාලා සමාලෝචනය පිළිබඳ සෙනෙට් අනු කමිටුවක් ස්ථාපිත කිරීම**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි විෂයමාලා සමාලෝචනය පිළිබඳ සෙනෙට් අනු කමිටුවක් පිහිටුවීම සම්බන්ධයෙන් වන යෝජනාවක් 2020.02.26 දින පැවති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකය පිළිබඳ සෙනෙට් අනු කමිටුව විසින් නිර්දේශ කරන ලදී. " ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි විෂයමාලා සමාලෝචන කමිටුව" ලෙස නම් කරන ලද මෙම කමිටුව 2020.08.27 දින පැවති සෙනෙට් සභාව විසින් අනුමත කරන ලදී.

මෙම කමිටුවේ පරමාර්ථය වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සහ සැලසුම් කරන ලද අධ්‍යයන වැඩසටහන් ජාතික හා විශ්ව විද්‍යාල මට්ටමේ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන බව සහතික කිරීම සහ එමඟින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සම්මානවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීමයි. මෙම අනුකමිටුව පිහිටුවීම තත්ත්ව සහතිකයේ මනා පිළිවෙතක් ලෙස හඳුනාගනු ඇත. තවද, 2017 වසරේ පවත්වන ලද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ සමාලෝචන වාර්තාවෙන් මඟින් ද එවැනි කමිටුවක් විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කිරීම සඳහා යෝජනා කර ඇත.

**5. ශ්‍රේණි ප්‍රදානය කිරීම සඳහා කඩඉම් ලකුණු තීරණය කිරීම: ශිෂ්‍ය ඇගයුම්වල ප්‍රමිති සැකසීම පිළිබඳ තත්ත්ව සහතික මධ්‍යස්ථානයෙහි, ව.වි.ප්‍ර.කොා.ස. අනු කමිටු වාර්තාව**

ශිෂ්‍ය ඇගයුම්වල ප්‍රමිති සැකසීම පිළිබඳව තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනු කමිටු වාර්තාව 2020.08.27 දින පැවති ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකය පිළිබඳ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද අතර අදාළ පීඨවල අදහස් සහ නිර්දේශ ලබා ගැනීම සඳහා පීඨවල තත්ත්ව සහතික සම්බන්ධීකාරකවරුන් අතර එය හුවමාරු කර ගැනීමට තීරණය කරන ලදී.

**6. තත්ත්ව සහතිකකරණයෙහි ශිෂ්‍ය සහභාගීත්වය හඳුන්වාදීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය කවුන්සිලයෙන් සහ බටහිර ස්කොට්ලන්ත විශ්ව විද්‍යාලයෙන් ධූත සංචාරයක නියැලීම**

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහ බටහිර ස්කොට්ලන්ත විශ්ව විද්‍යාලයේ නියෝජිතයින් 2020.02.12 දින උදෑසන විශ්වවිද්‍යාලයට පැමිණ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, පීඨ තත්ත්ව සහතික ඒකකවල සම්බන්ධීකාරකවරුන් සහ සෑම පීඨයකම ශිෂ්‍ය නියෝජිතයන් සමඟ සාකච්ඡා කළහ. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණයේ ශිෂ්‍යයින් නියැලීමේ වර්තමාන තත්ත්වය අවබෝධ කර ගැනීම සහ ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල තුළ මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම පිළිබඳව සාකච්ඡා කිරීමයි.

ඉන් අනතුරුව විශ්වවිද්‍යාල තුළ තත්ත්ව සහතිකකරණය සඳහා සිසුන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ හඳුන්වාදීම සඳහා වූ සාකච්ඡා සංසදය 2020.02.14 වන දින කොළඹ 03, මූවන්පික් හෝටලයේ දී පැවැත්විණි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ නියෝජනය කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ තත්ත්ව සහතික එකකයෙහි සම්බන්ධීකාරක ආචාර්ය රාජිත ගුණරත්න මහතා මෙම සාකච්ඡා මණ්ඩපයට සහභාගී විය. බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් බටහිර ස්කොට්ලන්ත විශ්ව විද්‍යාලයේ නියෝජිතයින් සමඟ එක්ව මෙම සංසදය සංවිධානය කර තිබුණි.

**7. තත්ත්ව සහතිකය පිළිබඳව පවත්වන ලද වැඩමුළු**

තත්ත්ව සහතිකය පිළිබඳ පවත්වන ලද වැඩමුළු පහත වගුවේ දක්වා ඇත

| අනු අංකය | | කාලය | දේශනයේ මාතෘකාව | දේශක | ප්‍රේක්ෂකයින් |
|---|---|---|---|---|---|
| 1 | 05.02.2020 | පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා | උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ති සේනාරත්න, අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.<br><br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කල්‍යාණි පෙරේරා, තත්ත්ව සහතික උපදේශක, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතිකපත් පාඨමාලාවට සහභාගිවන්නන් (විශේෂ බඳවා ගැනීම) |
| 2 | 05.02.2020 | ප.ව.01.00 සිට – ප.ව.04.00 දක්වා | ස්වයං ඇගයීම් වාර්තා රචනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කල්‍යාණි පෙරේරා, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | ව්‍යවහාරික විද්‍යා පීඨයේ ස්වයං ඇගයීම් වාර්තා රචනා කණ්ඩායම |
| 3 | 10.02.2020 | පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ප.ව.01.00 සිට ප.ව. 04.00 දක්වා | ස්වයං ඇගයීම් වාර්තා රචනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කල්‍යාණි පෙරේරා, තත්ත්ව සහතික උපදේශක, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | ව්‍යවහාරික විද්‍යා පීඨයේ ස්වයං ඇගයීම් වාර්තා රචනා කණ්ඩායම |
| 4 | 17.02.2020 | පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා | ස්වයං ඇගයීම් වාර්තා රචනය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කල්‍යාණි පෙරේරා, තත්ත්ව සහතික උපදේශක, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. | ව්‍යවහාරික විද්‍යා පීඨයේ ආහාර විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | 15.09.2020 | පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ප.ව.01.00 සිට ප.ව. 04.00 දක්වා | 1. තත්ත්ව සහතිකය පිළිබඳ දළ විශ්ලේෂණය<br><br>2. SLQF පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ති සේනාරත්න, අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.<br><br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය උපාලි මාම්පිටිය | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය. |
| 6 | 06.11.2020 | පෙ.ව.09.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ප.ව.01.00 සිට ප.ව. 04.00 දක්වා | උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සමන්ති සේනාරත්න, අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | උසස් අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීමේ සහතිකපත් පාඨමාලාවට සහභාගිවන්නන් |

## 8. යෝජනා ඇගයීම: 2020

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ) අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර තත්ත්ව සහතික මධයස්ථානය විසින් පහත අධ්‍යයන වැඩසටහන්වල යෝජනා ඇගයීමට ලක් කරන ලදී.

| | | |
|---|---|---|
| **සහතිකපත්** | | |
| 04.03.2020 | සංචාරක කර්මාන්තය පිළිබඳ සහතිකපත් පාඨමාලාව | 01වන මට්ටම |
| **උසස් සහතිකපත්** | | |
| 11.02.2020 | සමාජ විද්‍යාඥයින් සඳහා දත්ත විශ්ලේෂණය පිළිබඳ උසස් සහතිකපත් වැඩසටහන | 02වන මට්ටම |
| **ඩිප්ලෝමා** | | |
| 13.03.2020 | සමාජ වැඩ පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | 03වන මට්ටම |
| 02.04.2020 | ගෘහ ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | අල්ලස් හා දූෂණ වැළැක්වීම පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| 28.04.2020 | පරිගණක අපරාධ වැළැක්වීම සහ පාලනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | අපරාධ විමර්ශන සහ නවීන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 25.06.2020 | පරිගණක අපරාධ වැළැක්වීම සහ පාලනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| | අපරාධ විමර්ශන සහ නවීන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| | අපරාධ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව සහ වැරදිකරුවන්ගේ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | අපරාධ වැළැක්වීම සහ පාලනය සඳහා නීති අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | නිජබිම සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| | අල්ලස් හා දූෂණ වැළැක්වීමේ ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 03.07.2020 | පරිගණක අපරාධ වැළැක්වීම සහ පාලනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| | අපරාධ විමර්ශන හා නවීන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| | අපරාධ මනෝවිද්‍යාව සහ වැරදිකරුවන්ගේ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| | අපරාධ වැළැක්වීම සහ පාලනය සඳහා නීති අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| | නිජබිම සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| | අල්ලස් හා දූෂණ වැළැක්වීම පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| 26.08.2020 | පරිගණක පාදක ගිණුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 09.09.2020 | බෞද්ධ උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 12.11.2020 | පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | රූපලාවන්‍ය තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| 14.12.2020 | පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 16.12.2020 | පොලිමර් සැකසුම් තාක්ෂණය සහ ක්‍රියාවලි විශ්ලේෂණය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (අවසාන සමාලෝචනය) | |
| උසස් ඩිප්ලෝමා | | |
| 11.08.2020 | පරිගණක පාදක ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | 04වන මට්ටම |
| 26.08.2020 | පරිගණක පාදක ගිණුම්කරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 02.10.2020 | අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 06.10.2020 | ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා වැඩසටහන | |
| **ප්‍රථම උපාධිය** | | |
| 28.02.2020 | නාගරික ජෛව සම්පත් පළිබඳ විද්‍යාවේදී උපාධිය | 05වන මට්ටම |
| | ජලජ ජෛව සම්පත් පළිබඳ විද්‍යාවේදී උපාධිය | |
| **ප්‍රථම ගෞරව උපාධිය** | | |
| 17.02.2020 | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 06වන මට්ටම |
| 20.02.2020 | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | බෞද්ධ උරුමය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | භූ අවකාශ තාක්ෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| | තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (අවසාන සමාලෝචනය) | |
| 28.02.2020 | නාගරික ජෛව සම්පත් පළිබඳ විද්‍යාවේදී උපාධිය | |
| | ජලජ ජෛව සම්පත් පළිබඳ විද්‍යාවේදී උපාධිය | |
| 23.06.2020 | භූ අවකාශ තාක්ෂණ පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (දෙවන සමාලෝචනය) | |
| 29.06.2020 | සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දෙවන සමාලෝචනය) | |
| 07.07.2020 | බෞද්ධ උරුමය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දෙවන සමාලෝචනය) | |
| 10.07.2020 | ජාන විද්‍යාව සහ අනුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| | මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (දෙවන සමාලෝචනය) | |
| | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය උපාධිය (දෙවන සමාලෝචනය) | |
| 28.07.2020 | මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (තෙවන සමාලෝචනය) | |
| | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය උපාධිය (තෙවන සමාලෝචනය) | |
| 17.08.2020 | ජාන විද්‍යාව සහ අනුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (සෙනෙට් සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| 03.09.2020 | දන්ත ශල්‍ය විද්‍යාවේදී උපාධිය (පළමු සමාලෝචනය) | |
| 07.09.2020 | බෞද්ධ උරුමය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (තෙවන සමාලෝචනය) | |
| 14.09.2020 | දන්ත ශල්‍ය විද්‍යාවේදී උපාධිය (වි.වි.ප්‍ර.කෝ.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| 12.10.2020 | බෞද්ධ උරුමය සහ සංචාරක ව්‍යාපාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කෝ.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| 14.10.2020 | මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කෝ.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කෝ.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| 21.10.2020 | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (දෙවන සමාලෝචනය) | |
| 22.10.2020 | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කො.සභාවේ අදහස් දැක්වීම් ලැබීමෙන් පසු අවසාන සමාලෝචනය ) | |
| | මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කො.සභාවේ අදහස් දැක්වීම් ලැබීමෙන් පසු අවසාන සමාලෝචනය ) | |
| 25.11.2020 | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (තෙවන සමාලෝචනය) | |
| 30.11.2020 | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කො.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| 03.12.2020 | නිර්මානාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය (පළමු සමාලෝචනය) | |
| 04.12.2020 | ජාන විද්‍යාව සහ අනුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (වි.වි.ප්‍ර.කො.සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| 14.12.2020 | නිර්මානාත්මක සංගීත තාක්ෂණය සහ නිෂ්පාදනය පිළිබඳ ශාස්ත්‍රවිදී ගෞරව උපාධිය(දෙවන සමාලෝචනය) | |
| **පශ්චාත් උපාධි සහතිකපත්‍ර** | | |
| 27.05.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන (පළමු සමාලෝචනය) | 07වන මට්ටම |
| 11.06.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 06.10.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන (තෙවන සමාලෝචනය) | |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා** | | |
| 27.05.2020 | මානවවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | 08වන මට්ටම |
| | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 11.06.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 29.09.2020 | මානවවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 06.10.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (තෙවන සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| 10.12.2020 | කාර්මික කාබනික රසායනවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| **පාඨමාලා වැඩ අනුව ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධිය** | | |
| 27.08.2020 | ලේඛකන කලාව සහ සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | 09වන මට්ටම |
| 17.09.2020 | වාණිජපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 27.05.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 11.06.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 06.10.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (තෙවන සමාලෝචනය) | |
| 10.12.2020 | කාර්මික කාබනික රසායනවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| **පාඨමාලා වැඩ සහ පර්යේෂණ අනුව ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධිය** | | |
| 06.01.2020 | කාර්මික කාබනික රසායනවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (තෙවන සමාලෝචනය) | |
| 24.01.2020 | මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | 10වන මට්ටම |
| 27.05.2020 | මානව විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| | නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 11.06.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 29.06.2020 | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |

| | | |
|---|---|---|
| 12.08.2020 | සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 27.08.2020 | ලේඛකන කලාව සහ සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 17.09.2020 | වාණිජපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 06.10.2020 | දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (තුන්වන සමාලෝචනය) | |
| 08.12.2020 | වාණිජපති උපාධි වැඩසටහන (දෙවන සමාලෝචනය) | |
| 10.12.2020 | කාර්මික කාබනික රසායනවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන (පළමු සමාලෝචනය) | |
| 22.12.2020 | වාණිජපති උපාධි වැඩසටහන (සෙනෙට් සභාවට ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| **දර්ශනපති උපාධිය** | | |
| 27.02.2020 | ව්‍යාපාර පිළිබඳ **දර්ශනපති උපාධි වැඩසටහන** (වි.වි.ප්‍ර.කොා.සභාවේ අදහස් ලැබීමෙන් පසු පළමු සමාලෝචනය) | 11වන මට්ටම |
| 17.08.2020 | ව්‍යාපාර ජ **දර්ශනපති උපාධි වැඩසටහන** (වි.වි.ප්‍ර.කොා.සභාවේ අදහස් ලැබීමෙන් පසු අවසාන සමාලෝචනය) | |
| **ආචාර්ය උපාධි** | | |
| 21.10.2020 | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ **ආචාර්ය උපාධි වැඩසටහන** (පළමු සමාලෝචනය) | 12වන මට්ටම |
| 02.11.2020 | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ **ආචාර්ය උපාධි වැඩසටහන** (වි.වි.ප්‍ර.කොා.සභාව වෙත ඉදිරිපත් කිරීමට පෙර අවසාන සමාලෝචනය) | |
| **පීඨ ස්ථාපිත කිරීම** | | |
| 28.02.2020 | නාගරික හා ජලජ ජෛව සම්පත් පීඨය **ස්ථාපිත කිරීම** පිළිබඳ යෝජනාව | |
| 05.08.2020 | දන්ත වෛද්‍ය විද්‍යා පීඨය **ස්ථාපිත කිරීම** පිළිබඳ යෝජනාව (පළමු සමාලෝචනය) | |

# තිරසර ප්‍රගති වාර්තාව 2020

## ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය

එක්සත් ජාතීන්ගේ තිරිසර සංවර්ධන ඉලක්ක 17 සහ විශ්වවිද්‍යාලය විසින් වරින් වර සිදුකරනු ලබන ක්‍රියාකාරකම් හරහා තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන විද්‍යාලයේ න්‍යාය පත්‍රයට අනුකූලව මෙම වාර්තාව මගින් අප සාර්ථකත්වයේ කිනම් ස්ථානයක පසුවේද? සහ එම ක්‍රියාවලියේ නියමිත තත්ත්වයට පැමිණ නොමැත්තේ කෙසේද? හා ඇයිද? යන්න පිළිබඳ යාවත්කාලීන තොරතුරු සපයයි.

තිරසාරභාවය පිළිබඳ අනාගත අපේක්ෂාවන්: 2019 දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය ප්‍රධාන උපායමාර්ගික තිරසාර ක්ෂේත්‍ර ඉලක්ක 7ක් ඉදිරිපත් කරයි:

**1. ඉගෙනීම සහ අධ්‍යාපනය**

**2. පර්යේෂණ සහ සංවර්ධනය: පර්යේෂණ, ප්‍රකාශන, මහජන සහභාගීත්වය, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන**

**3. මහජනතාව**

**4. යටිතල පහසුකම්**

**5. මූල්‍ය**

**6. විශිෂ්ට ශිෂ්‍ය අත්දැකීම්**

**7. යාවජීව ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය/කලාපීය බලපෑම**

එක්සත් ජාතීන්ගේ තිරිසර සංවර්ධන ඉලක්ක 17න් එකක් හෝ කිහිපයක් ආවරණය කිරීම උපාය මාර්ගික ඉලක්ක 7ම මගින් ඉලක්ක කර ඇත. මෙම වාර්තාව මගින් UI හරිත මෙට්‍රික් විශ්ව විද්‍යාල ශ්‍රේණිගත කිරීම් පිළිබඳ යාවත්කාලීන සැපයීමට අමතරව සහ විශ්ව විද්‍යාලයක් ලෙස, 2021 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අනුගමනය කරන ලද වෙනත් ක්‍රමවලට අමතරව, එක් එක් උපාය මාර්ගික ඉලක්ක 7න් ප්‍රධාන අරමුණු සාක්ශාත් කරගැනීම පිළිබඳ සාක්ෂි සහ උදාහරණ සපයනු ඇත.

### 1. ඉගෙනීම සහ අධ්‍යාපනය

පුරෝගාමී, නව්‍ය සහ ස්වාධීන පෞරුෂයක් සහිත දක්ෂ ගෝලීය පුරවැසියන් ලෙස වර්ධනය වීමට සිසුන් පෙළඹවීම.

**තෝරාගත් ප්‍රධාන අරමුණු**:

| | |
|---|---|
| 1.1 | අපගේ සිසුන් ගෝලීය වශයෙන් තරඟකාරී වීමට ශක්තිමත් කිරීම සඳහා උපාධි ගුණාංග සහ සේවානියුක්ති කුසලතා අන්තර්ගත කරමින් විෂය මාලාව නිතිපතා යාවත්කාලීන කිරීම . |
| 1.2 | අධ්‍යාපනයේ සෑම අංශයකම ගුණාත්මක බව සහතික කිරීම සහ ලෝක මට්ටමේ ප්‍රතිඵලය ලබා ගැනීම . |
| 1.3 | විමර්ශනාත්මක සහ සක්‍රීය ඉගෙනුම් ප්‍රවේශයන් තුළින් ඉගෙනීම සඳහා සෑම සිසුවෙකුගේම හැකියාව වර්ධනය කිරීම . |

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

1.1- **නව පාඨමාලාව**: අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රය තුළ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන උපාධිධාරී නොවන සේවකයින්ගේ සහ උසස් පෙළ සුදුසුකම් ලත් සිසුන්ගේ සඛ්‍යතාවය ගොඩනැගීමේ අරමුණින් වෛද්‍ය විද්‍යා පීඨයේ, අධිකරණ වෛද්‍ය අධ්‍යයනාංශයේ අධිකරණ වෛද්‍ය විද්‍යාව සහ ධූලකවේදය පිළිබඳ නව ඩිප්ලෝමාවක් ආරම්භ කරන ලදී.

*"එය ඉහළ සුදුසුකම් ලත් පළපුරුදු අධ්‍යයන කාර්ය මණ්ඩලයක් විසින් පවත්වනු ලැබේ නව්‍ය සහ බහුවිෂයීක ඩිප්ලෝමා පාඨමාලාවකි. අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ සහාය ඇතිව එවැනිම ලෝක මට්ටමේ වැඩසටහන්වලට සමානලෙස මෙහි විෂය මාලාව සකස් කර ඇත."*

1.2 - **ප්‍රතිඵලය:** තිරසර සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය ජාත්‍යන්තර සංවිධාන 3කින් ප්‍රතිඵලය ලබා ඇත:

- ලෝක මට්ටමේ විශ්ව විද්‍යාල ව්‍යාපෘතිය
- UI විශ්වවිද්‍යාල හරිත මෙට්‍රික් ශ්‍රේණිගත කිරීම
- ටයිම්ස් උසස් අධ්‍යාපන ආයතනය(THE) විසින් බලපෑම් ශ්‍රේණිගත කිරීම්




**යූඅයි ග්‍රීන් මෙට්‍රික් විශ්ව විද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම**

රටවල් 84 කින් ඉදිරිපත් වූ 912 විශ්වවිද්‍යාල අතරින් මෙම විශ්වවිද්‍යාලය 599 වැනි ස්ථානයේ ශ්‍රේණිගත කිරීමක් හිමිකර ගත්තේය. ශ්‍රේණිගත කිරීම කාණ්ඩ 6 කට බෙදා ඇති ලකුණු 4,525 ක් මත පදනම් විය. ඛාණ්ඩ අනුව කාර්ය සාධනය විශ්ලේෂණය කිරීමට සහ අනාගත වැඩිදියුණු කිරීම් සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ලකුණු ක්‍රමය අපට අවකාශ සලසයි

| Category | Point | Percentage of Point to Total Score | Maximum Point | Percentage of Point to Maximum Point |
|---|---|---|---|---|
| Setting and Infrastructure (SI) | 225 | 5 % | 1,500 | 15.00 % |
| Energy and Climate Change (EC) | 1,425 | 31 % | 2,100 | 67.86 % |
| Waste (WS) | 600 | 13 % | 1,800 | 33.33 % |
| Water (WR) | 325 | 7 % | 1,000 | 32.50 % |
| Transportation (TR) | 750 | 17 % | 1,800 | 41.67 % |
| Education (ED) | 1,200 | 27 % | 1,800 | 66.67 % |
| Total Score | 4,525 | 100 % | 10,000 | 45.25 % |



Figure 1.1 Overall Score Diagram

## යූඅයි ග්‍රීන් මෙට්රික් දත්ත

පසුගිය වසර 3 තුළ අපගේ සමස්ත ලකුණු ප්‍රමාණය වැඩි වී නොමැති වුවත්, ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල විශ්වවිද්‍යාලයේ තත්ත්වය ශීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර අපගේ ලකුණුවල සංගතභාවය තිරසාර පිළිවෙත් පවත්වා ගැනීමට අප විසින් දරන ලද අඛණ්ඩ උත්සාහයන් පිළිබිඹු කරයි. වර්තමානයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 'බලශක්ති සහ දේශගුණික විපර්යාස' කාණ්ඩයේ ජාතික මට්ටමින් ශ්‍රේණිගත කිරීම්වල පෙරමුණේ සිටී.



Figure 3.1 World Rankings History Diagram

| Country Ranking | SI Ranking | EC Ranking | WS Ranking |
|---|---|---|---|
| 6 | 6 | 1 | 6 |

| WR Ranking | TR Ranking | ED Ranking |
|---|---|---|
| 6 | 6 | 2 |

| Indicator | | Score |
|---|---|---|
| EC.1 | Energy efficient appliances usage | 50 |
| EC.2 | Smart building implementation | 75 |
| EC.3 | Number of renewable energy source in campus | 75 |
| EC.4 | Total electricity usage divided by total campus population | 300 |
| EC.5 | The ratio of renewable energy production divided by total energy usage per year | 200 |
| EC.6 | Elements of green building implementation as reflected in all construction and renovation policies | 225 |
| EC.7 | Greenhouse gas emission reduction program | 200 |
| EC.8 | Total carbon footprint divided by total campus population | 300 |




Figure 5.2 Percentage of Score to Maximum Score for Energy and Climate Change

පරිසර සංරක්ෂණය සඳහා වන අංක 1 ශ්‍රේණිගත කිරීම මූලික වශයෙන් තිරසර සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානයේ ව්‍යාපෘතිය හරහා සාක්ෂාත් කරගනු ලැබීය: 'කරුවලගස්වැව රක්ෂිත වනාන්තරයේ වන්නියාගම බීට්ටුවෙහි හෙක්ටයාර 400 ප්‍රතිසංස්කරණය කිරීම'. ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ භායනයට ලක්වූ වනාන්තර ඉඩම් හෙක්ටයාර් 400ක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ සියලු නියාමන පරිසර පද්ධතිවල ප්‍රතිලාභ සමස්ත ප්‍රජාව වෙත ලබා දීම වන අතර ව්‍යාපෘතියේ අමතර ඉලක්ක තිබේ.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන්ට සහ ශාස්ත්‍රඥයින්ට ප්‍රායෝගික දැනුම, පුහුණුව ලබාදීම සහ දැනුවත් කිරීම් සිදුකරන අතරම, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට විද්‍යාත්මක දැනුම ලබා ගැනීම ලඳහා සහයෝගීව කටයුතු කිරීමට හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම.

- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අතර විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම සඳහා උපස්ථරයක් නිර්මාණය කිරීම.

- බලපත්‍රලාභී ප්‍රදේශයේ තිරසාර කළමනාකරණය තුළින් ගැටුම් නිරාකරණය සඳහා වනාන්තර ප්‍රතිෂ්ඨාපනය සහ පසු අධීක්ෂණ කටයුතු සඳහා ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ තිරසාරභාවය පිළිබඳ මධ්‍යස්ථානය ISO 14064 ප්‍රමිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා වන සිය ක්‍රියාමාර්ගවලින් ඔබ්බට යමින් පළමු කාබන් මධ්‍යස්ථ විශ්ව විද්‍යාලය ලෙස රාජ්‍ය විශ්ව විද්‍යාල ඉතිහාසය අතර යෝධ පියවරක් ඉදිරියට තබා ඇත.

**1.3 - ඉගෙනීම සඳහා සක්‍රීය ප්‍රවේශයන්**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ක්‍රියාකාරී ඉගෙනීම් සම්බන්ධයෙන් දක්වන ලද බොහෝ උදාහරණ අතර රන්රසු වැඩසටහන මූලික උදාහරණයක් විය. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද මෙම කලා උළෙල 2020 ජනවාරි මස විශ්වවිද්‍යාලයේ බණ්ඩාරනායක ශාලාවේදී පැවැත්විණි. මෙය වනාහි නර්තනය, ගායනය, නිවේදනය, වාදනය, රංගනය, චිත්‍ර, ගී පද රචනය, කෙටිකතා රචනය, කෙටි චිත්‍රපට නිර්මාණය, වෘතාන්ත වැඩසටහන් රචනය සහ නිෂ්පාදනය ආදී විවිධ ක්ෂේත්‍රයන්හි උපාධි අපේක්ෂකයින්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් විවෘත කිරීමේ අරමුණින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය විසින් පවත්වනු ලබන විශාලතම කලා උළෙල වේ,

**1 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු**




## 2. පර්යේෂණ සහ සංවර්ධනය

ශ්‍රී ලංකාවේ, ආසියාවේ සහ එමඟින් ගෝලීය ප්‍රජාවන්ගේ තිරසාර සංවර්ධනය සඳහා විවිධ විෂය ක්ෂේත්‍රවල නව දැනුම සහ මානව කෘති නිර්මාණය කිරීම, සොයා ගැනීම සහ බෙදා හැරීම සඳහා ආකර්ශනීය, සාර්ථක සහ අන්තර්ක්‍රියාකාරී පර්යේෂණ සංස්කෘතියක් පෝෂණය කිරීම.

**තෝරාගත් ප්‍රධාන අරමුණු**

2.1 ගුණාත්මක පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපිත කිරීම සඳහා පර්යේෂකයන්ගේ පර්යේෂණ හැකියාවන් සහ නිපුණතා වැඩිදියුණු කිරීම

2.2 පර්යේෂණ සහ නවෝත්පාදන හරහා උත්පාධිත දැනුම ප්‍රකාශයට පත් කිරීම, ප්‍රචලිත කිරීම, වාණිජකරණය කිරීම සහ භාවිතයෙහි යෙදවීම.

2.3 පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා සහ පර්යේෂණ ප්‍රදාන සොයා ගැනීම සඳහා කර්මාන්ත, ජාතික සහ ජාත්‍යන්තර ආයතන සමඟ ඵලදායී සහයෝගීතාවයක් ගොඩනගා ගැනීම

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

**2.1- නව පර්යේෂණ මධ්‍යස්ථානය:** ආචාර්ය බී.එම්.එස්. බටගොඩ විසින් කඩොලාන සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තපාන ප්‍රදේශයේ කඩොලාන බහුල අක්කර 2ක ඉඩමක් පරිත්‍යාග කරන ලදී. ඉත්තපාන හි ඉඩම සහ භාවිතයට නොගත් පර්යේෂණ මධ්‍යස්ථානය ලැබීමෙන් පසු, විශ්ව විද්‍යාලය තිරසර සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානය සමඟ එක්ව 'කඩොලාන වනාන්තර

ප්‍රතිසංස්කරණය සහ ජෛව විවිධත්ව ව්‍යාපෘතියේ' පුරෝගාමී කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය බොහෝ අනාගත පර්යේෂණ සහ ජාත්‍යන්තර සහයෝගීතාවයට පහසුකම් සපයනු ලබන අතර එමගින් කඩොලාන පරිසර පද්ධතියට සහ ඉන් සහාය ලැබෙන ප්‍රාදේශීය ප්‍රජාවට උපකාර වනු ඇත.

- **ඉඩම් බදු ලබාගෙන ඇත.**
- **ව්‍යාපෘති යෝජනාව සකසා ඇත.**
- **අයවැය තහවුරු කර ඇත.**
- **අරමුදල් රැස් කිරීම සිදු වෙමින් පවතී.**
- **ආයතනික අනුග්‍රාහකයින් සමඟ සම්බන්ධතා ගොඩනගා ඇත**

**2.2 - නවෝත්පාදන පර්යේෂණ :**




මෙම නව්‍ය පැසවුම් කුටිය ව්‍යවහාරික විද්‍යා පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ මහාචාර්ය එස්.බී. නවරත්න සහ රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශයේ මහාචාර්ය සී.එම්. නවරත්න මිය විසින් ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික ප්‍රදානය යටතේ (ප්‍රදාන අංකය: TG/2017/Tech-D/07) සැලසුම් කර සංවර්ධනය කරන ලදී.

**2.3 – සහයෝගිතා**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයේ පර්යේෂකයන්ට බර්ක්ලි හි කැලිෆෝනියා විශ්ව විද්‍යාලයෙන් උපආධාර ගිවිසුමක ආකාරයෙන් ජාතික සෞඛ්‍ය ආයතනවල කොටසක් වන අසාත්මිකතා සහ බෝවන රෝග පිළිබඳ ජාතික ආයතනයෙන් අරමුදල් ලැබුණි. මෙම ප්‍රදානය (1U01AI151788) ඇමරිකා එක්සත් ජනපදයේ බර්ක්ලි හි කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ ආචාර්ය ඊවා හැරිස් සහ ආචාර්ය ජොසපිනා කොලෝමාගේ ප්‍රධානත්වයෙන් ආබෝ වයිරස් පර්යේෂණ සහ වැඩිදියුණු කළ ආවේක්ෂණ පිළිබඳ ආසියානු සහ ඇමරිකානු මධ්‍යස්ථානය (A2CARES) ආරම්භ කිරීමට උපකාරී වනු ඇත. වසර 5ක් පුරා ඩොලර් මිලියන 1.15ක මුදලක් ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයෙ මහාචාර්ය නීලිකා මලවිගේ මිය වෙත සහ වෛද්‍ය චන්දිම ජීවන්දර මහතාට ප්‍රදානය කර ඇත. ජාතික බෝවන රෝග පිළිබඳ ආයතනයේ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා

අංශයේ වෛද්‍ය හසිත තිසේරා සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සායනික වෛද්‍ය අංශයේ මහාචාර්ය තාෂි වැන්ග් ද මෙම පර්යේෂණ වැඩසටහන සඳහා සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

**A2CARES හි හවුල්කාර ආයතන සහ ප්‍රධාන සහයෝගිතාකරුවන් යන්නට අනෙකුත් අය අතර:**

- ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා විශ්ව විද්‍යාලයේ ඊවා හැරිස් සහ ජොසපින් කොලොමා
- ඇමරිකා එක්සත් ජනපදයේ උතුරු කැරොලිනා විශ්වවිද්‍යාලයේ අරවින්ද ද සිල්වා
- ඇමරිකා එක්සත් ජනපදයේ මිචිගන් විශ්ව විද්‍යාලයේ ආබ්‍රූ ගෝර්ඩන් සහ ජෝෂප් එඩන්බර්ග්
- ඇමරිකා එක්සත් ජනපදයේ බෙතෙස්ඩාහි ජාතික සෞඛ්‍ය ආයතනයේ ලී කැට්සෙල්නික්
- ඇමරිකා එක්සත් ජනපදයේ එමොරි විශ්වවිද්‍යාලයේ ජෙසී වැගනර්
- ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයේ නීලිකා මලවිගේ
- නිකරගුවාවේ මැනගුවා හි තිරසාර විද්‍යා ආයතනයේ ඒන්ජල් බල්මසෙඩා
- නිකරගුවාවේ මැනගුවා හි AMOS Health and Hope ආයතනයේ ඩේවිඩ් පැරජන්
- ඉක්වදෝරයේ සැන් ෆසන්සිස්කෝ ද කිව්ටෝ විශ්වවිද්‍යාලයේ ගේබ්‍රියල් ත්‍රොව්බා
- ඉක්වදෝරයේ ජාතික සෞඛ්‍ය පර්යේෂණ ආයතනය INSPI හි වාර්සොවියා සෙවැලොස්
- එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ලන්ඩනයේ ඉම්පීරියල් කොලේජ් හි නූනෝ ෆාරියා
- ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියා හි විද්‍යා ඇකඩමියේ ශැනන් බෙනට්
- එක්සත් ජනපදයේ කොලොම්බියා විශ්ව විද්‍යාලයේ ඉයන් ලිප්කින් යන අය, ඇතුළත් වේ

**2 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු :**




## 3. මහජනතාව

විශ්ව විද්‍යාලය වැඩ කිරීමට පහසු සහ ආශ්වාදජනක ස්ථානයක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ පූර්ණ හැකියාවන් අගය කිරීම, සහාය දීම, සංවර්ධනය කිරීම සහ උපයෝගීකර ගැනීම.

**තෝරාගත් ප්‍රධාන අරමුණු :**

3.1 ලොව පුරා සිටින දක්ෂයින්කරා ප්‍රවේශ වෙමින් හොඳම පුද්ගලයින් ආකර්ෂණය කරගැනීම, ත්‍යාග පිරිනැමීම සහ රඳවා ගැනීම.

3.2 නව සහ ස්ථාපිත පර්යේෂණ දෙකෙහිම ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අප සමස්ත කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාවන් සහ කුසලතා වැඩි දියුණු කිරීම.

3.3 අභිමානය, ගෞරවය, විවිධත්වය, සෞඛ්‍යය සහ යහපැවැත්ම තහවුරු කිරීම මගින් උපකාරක සහ සාමූහික පරිසරයක් නිර්මාණය කිරීම .

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

### 3.1 - කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීම

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතාවයක් ගොඩනගා ඇත. සහයෝගීතා ව්‍යාපෘතිය "ශ්‍රී ලංකාවේ බෝ නොවන රෝග වසංගතවේදය වැඩිදියුණු කිරීම මගින් සෞඛ්‍ය පර්යේෂණ ශක්තිමත් කිරීම" නම් වේ.

කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයේ සහයෝගයේ ඇතැම් ප්‍රධාන අරමුණු වන්නේ:

- දකුණු ආසියාතිකයන් අතර ජාන සහ පාරිසරික සාධක අතර සහ විවිධ ජාන අතර රෝග අවදානම පිළිබඳ සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වය තීරණය කිරීම සඳහා ජෛව සම්පතක් ලෙස සේවය කිරීම.

- අනාගත කොවිඩ් අවදානම පුරෝකථනය කිරීම සහ ස්ථාපිත අවදානම් ස්තරීකරණ ප්‍රවේශයන් සමඟ සංසන්දනය කිරීම සඳහා "දකුණු ආසියානු" අවදානම් ලකුණු වර්ධනය කිරීමට දායක වීම.

- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය විද්‍යාත්මක සහ මහජන සෞඛ්‍ය යටිතල පහසුකම් සහ හැකියාවන් වැඩිදියුණු කිරීමට සහායවීම.

### 3.2 - ඇමරිකා එක්සත් ජනපදය සමඟ ද්විත්ව ආචාර්ය අවස්ථා සඳහා නව්‍ය පර්යේෂණ

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලෝක මට්ටමේ විශ්ව විද්‍යාල ව්‍යාපෘතිය (WCUP-USJ) විසින් 2020 ජනවාරි 6 වන දින " නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය සඳහා ඉංජිනේරු විද්‍යාව සමඟ වෛද්‍ය විද්‍යාව ඒකාබද්ධ කිරීම: අනාගතයට පියවර තැබීම" නමින් යුත් ඒකාබද්ධ සම්මන්ත්‍රණයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජනපදයේ ටෙක්සාස් හි හූස්ටන් විශ්ව විද්‍යාලයේ (UoH) නියෝජිත පිරිසකට සත්කාරකත්වය සපයන ලදී. මෙම ඒකාබද්ධ සම්මන්ත්‍රණය 2019 සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්වතුන් පිරිසක් ටෙක්සාස්හි හූස්ටන් විශ්ව විද්‍යාලය වෙත පැමිණීමේ ප්‍රතිඵලයක් වූ අතර, එය සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණක් වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජෛව වෛද්‍ය ඉංජිනේරු අධ්‍යයනාංශයක් පිහිටුවීමේ කාර්යය සඳහා මූලික පදනම සකසන ලදී.

### 3.3 –උපදේශන සේවාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මනෝචිකිත්සා අධ්‍යයනාංශය, දකුණු කොළඹ ශික්ෂණ රෝහලෙහි සායනික ඒකකයේ, සහ අධ්‍යයනාංශයේ උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවා සහාය සපයයි. සායනික මනෝවිද්‍යාඥ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය රමණි පෙරේරා මහත්මියගෙන් සතියේ දින දෙකක් උපදේශන ලබා ගත හැකි අතර සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අහහරුවාදා අධයයනාංශයට පැමිණ හමුවීමෙන් හෝ කල්තියා වේලාව වෙන්කර ගැනීමෙන් සේවා ලබා ගත හැක.

### 3 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු




## 4. යටිතල පහසුකම්

ලෝක මට්ටමේ අධ්‍යයන සහ උපකාරක ක්‍රියාකාරකම් පවත්වාගෙන යාම සඳහා නවීන, අති නවීන, කාර්යක්ෂම සහ ආකර්ශනීය ඉගෙනුම් සහ සේවා පරිසරයක් සැලසීම.

**තෝරාගත් ප්‍රධාන අරමුණු:**

4.1 හරිත සංකල්පය සැලකිල්ලට ගනිමින් අපගේ භෞතික, පුස්තකාලය, තොරතුරු තාක්ෂණය සහ අනෙකුත් යටිතල ව්‍යුහයන්හි සියලුම අංග හරහා ගුණාත්මක භාවයේ සහ අත්දැකීම්වල සංගත භාවය සහ අඛණ්ඩතාවය පවත්වාගෙන යාම.

4.2 අපගේ උරුමයේ ප්‍රධාන අංගයක් නිර්මාණය කරන ප්‍රකට ගොඩනැගිලි ඇතුළුව පවතින ඉඩ කළමනාකරණය කිරීම සහ නව වැදගත් පහසුකම් ගොඩනඟන අතරම අපගේ ස්ථානයේ පරිමාණය සහ තිරසාරභාවය පවත්වාගෙන යාම.

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

**4.1 අපද්‍රව්‍ය, බලශක්ති පරිභෝජනය සහ තිරසාරභාවය පිළිබඳ විශ්වවිද්‍යාලයේ අනෙකුත් ප්‍රයත්නයන්**:

විශ්වවිද්‍යාලය, ආයතනයක් ලෙස, බාහිරින් ලබාගත් ආහාරවලට අමතරව විශ්වවිද්‍යාලය තුළ සපයනු ලබන ආහාරවලින් ජනනය වන ආහාර අපද්‍රව්‍ය ප්‍රමාණය මනිනු ලැබේ. තවද, අපද්‍රව්‍ය වෙන් කිරීම සහ ප්‍රතිචක්‍රීකරණ පද්ධති විශ්වවිද්‍යාල මණ්ඩපය පුරා ක්‍රියාත්මක කර ඇත.

**4.2 හරිත ගොඩනැගිල්ල:**

දැනට ඉදිවෙමින් පවතින නව තිරසාර මධ්‍යස්ථානය, දැව සැකසුම් නවෝත්පාදන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකක ගොඩනැගිල්ල සඳහා සූර්ය පද්ධතියක් සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ ගෙස්ලා පවර් (පුද්) සමාගම අතර අවබෝධතා ගිවිසුමක් 2020 මාර්තු මාසයේදී අත්සන් කරන ලදී. එම අවබෝධතා ගිවිසුමේ ප්‍රධාන කරුණු කිහිපයක් පහත දැක්වේ.

- ගෙස්ලා සමාගම විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ සිසුන්ට සහනදායී මිල ගණන් යටතේ සූර්යබල පද්ධති ලබා දිය යුතුය.

- පාරිභෝගිකයා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවය කරන තාක් පමණක් එහි සඳහන් කර ඇති ගාස්තු අදාළ වේ. එසේ නොවන විටදී, දැනට පවතින පාරිභෝගික බාහිර ගාස්තු අදාළ වේ.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් ගෙස්ලා සමාගම වෙත අලෙවිකරණ පහසුකම් සැපයිය යුතු නමුත් ගෙස්ලා සමාගම සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ඔවුන්ගේ ගනුදෙනුකරුවන් අතර සිදුවන කිසිදු ගනුදෙනුවක් සම්බන්දයෙන් නීත්‍යානුකූල බැඳීමක් නොමැත.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හරිතකරණ ක්‍රමෝපාය සඳහා දායකත්වයක් ලෙස ගෙස්ලා සමාගම විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාරිභෝගිකයාට අලෙවි කරන සෑම සූර්ය පද්ධතියක් සඳහාම සූර්ය පැනලයක් පරිත්‍යාග කළ යුතුය.



විදුලිය භාවිතය අවම කිරීම පිණිස ස්වභාවික ආලෝකය ලබාගැනීම සඳහා ඉහළ මහල්වල ඉදිකළ කවුළු



නව ගොඩනැගිලිවල සහ සෝපානවල ජනේලවල ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය



ස්වාභාවික ආලෝකය වැඩි කිරීමට සහ වායු සමීකරණයේ අවශ්‍යතාවය අඩු කිරීමට විවෘත පැති සහ පාරභාසක වහල  ද්‍රව්‍ය සහිත ඉහළ මහලේ ආපනශාලාව.

**4 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු :**




## 5. මූල්‍ය

තිරසාර තරඟකාරී තත්වයක් ගොඩනැගීම සඳහා සමස්ත මූල්‍ය ශක්තිය පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම.

**තෝරාගන්නා ලද ප්‍රධාන අරමුණු :**

5.1 වගවීම, විනිවිදභාවය, අඛණ්ඩතාව සහ මූල්‍ය පාලනය පිළිබඳ ඉහළ ප්‍රමිතීන් සහතික කිරීම.

5.2 අපගේ සියලුම ක්‍රියාකාරකම්වල ප්‍රශස්ථතම  වටිනාකම කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස නියමිත වේලාවට ලබා දීම.

මෙම අරමුණු  සාක්ෂාත් කර ගත් ආකාරය:

**5.1 ප්‍රසම්පාදන වැඩමුළුව**: ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැදගත්කම අවබෝධ කරගනිමින් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කිරීමට කටයුතු ආරම්භ කළේය. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයෙහි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මෙම වැඩමුළුව 2020 සැප්තැම්බර් 23 වන දින පීඨයේදී පැවැත්විණි. මෙම වැඩමුළුවේ ප්‍රධාන කථිකයා ලෙස මහාචාර්ය පී.බී. මණ්ඩාවල සහභාගි වූ අතර, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කේ.ජී. බ්‍රිටෝ මහතා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේහි සහකාර මූල්‍යාධිකාරීවරිය වන ලලනි ප්‍රියන්තිකා මහත්මිය ඇතුළු අනෙකුත් වැදගත් පිරිසක් මෙම අසස්ථාවට සහභාගි වූහ.

**5.2 - නව මූල්‍ය ක්‍රම**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිසුන්ට නව ඩිජිටල් බැංකුකරණ ක්‍රමයක් 2020 අගෝස්තු 31 වන දින හඳුන්වා දෙන ලදී. පීඨයේ අධ්‍යාපනය ලබන සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා මහජන බැංකුවේ සහයෝගයෙන් පීඨය විසින් මෙම ක්‍රමය හඳුන්වා දුන් අතර මෙම නව ක්‍රමය හඳුන්වාදීම අන්තර්ජාල බැංකුකරණයේ නව පියවරක් වෙයි. එමෙන්ම එය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දෙනු ලබනුයේ ප්‍රථම වරටය. මෙම ක්‍රමය මඟින් සිසුන්ට තම ශිෂ්‍ය හැඳුනුම්පත ඩිජිටල් බැංකු කාඩ්පතක් ලෙස භාවිත කිරීමට පහසුකම් සැලසෙන අතර එමඟින් ඔවුන්ගේ ශිෂ්‍යාධාර සහ මහපොළ ශිෂ්‍යත්වවල තත්ත්වය පහසුවෙන් පරීක්ෂා කිරීමට අවස්ථාව සැලසේ. එපමණක් නොව, මෙම ක්‍රමය හරහා ජාත්‍යන්තර සහරා සඳහා ගෙවීම්, ශිෂ්‍ය සුබසාධන ගෙවීම්, ශිෂ්‍ය ණය සහ තවත් බොහෝ මූල්‍ය පහසුකම් පහසුවෙන් සිදු කිරීමට හැකිය.

**5 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු :**




## 6. ශිෂ්‍යයින්ගේ විශිෂ්ට අත්දැකීම්

සිසුන්ට තම අධ්‍යයන කටයුතුවලින් ඔබ්බට ජීවිතය සඳහා සූදානම් වීමට සුවිශේෂී, විශිෂ්ට සහ ගුණාත්මක අත්දැකීමක් ලබා ගැනීමට අවස්ථාවන් නිර්මාණය කිරීම.

**තෝරාගන්නා ලද ප්‍රධාන අරමුණු:**

6.1 අපගේ අධ්‍යාපන සහ සහාය සෙවා පුනර්ජීවනය කිරීම.

6.2 සිසුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍යය, යහපැවැත්ම සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම.

6.3 කලාපීය සහ ගෝලීය නිරාවරණය ප්‍රවර්ධනය කිරීම.

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

**6.1 – AHEAD** වැඩසටහන: උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ වැඩසටහන (AHEAD) ඉගෙනීම, ඉගැන්වීම, ඇගයීම් වැඩි දියුණු කිරීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම පිණිස පීඨ ප්‍රදානය - ප්‍රතිඵල පදනම් කරගත් අධ්‍යාපනය සහ භාෂා සන්නිවේදන සහ තාක්ෂණවේදය සඳහා උපදේශනය සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් කරනු ලබන ඉල්ලීම.

ශ්‍රී ලංකාව පහළ මධ්‍යම ආදායම් ලබන රටක සිට ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් කරා සංක්‍රමණය වීමට හැකිවීම සඳහා උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා ඇත්තේ අතිෂය වැදගත්කමකි. මෙය අවබොධකර ගනිමින්, ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව බැංකු අරමුදල්

මඟින් උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ මෙහෙයුමක් හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සහාය දැක්වීමට එකඟ වී ඇත. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ මෙහෙයුමේ ප්‍රතිඵල ක්ෂේත්‍ර තුන පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

1. අපේක්ෂා කරන ඉහළ මධ්‍යම ආදායම් ලබන ආර්ථිකයක් සඳහා අවශ්‍ය අධ්‍යයන වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් උසස් අධ්‍යාපනයට බඳවා ගැනීම වැඩි කිරීම.

2. උසස් තත්ත්වයේ සමාජ-චිත්තවේගීය කුසලතා සමඟ අධ්‍යයන විශිෂ්ටත්වය ඒකාබද්ධ කරන නවීන ඉගැන්වීම් සහ ඉගෙනුම් ප්‍රවේශයන් පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම.

3. ආර්ථික සංවර්ධනයට, විශේෂයෙන්ම ඉහළ වටිනාකම් සහිත කර්මාන්ත සහ සේවා වර්ධනයට සහාය විය හැකි ප්‍රභල පර්යේෂණ සහ නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.

**6.2 – සෞඛ්‍ය වෙබ් අඩවිය**: ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වයං-ඉගෙනුම් පුළුල් ලිංගික අධ්‍යාපන වෙබ් අඩවිය එනම් www.RoadToAdulthood.lk යන වෙබ් අඩවිය දහස් සංඛ්‍යාත තරුණ තරුණියන්ට ලිංගිකත්වය හා ආදරය ප්‍රජනන සෞඛ්‍ය සේවා පිළිබඳ සංකීර්ණ සහ අභියෝගාත්මක ගැටළුවලට විසඳුම් සොයාගැනීමට උපකාර කිරීම සඳහා සංවර්ධනය කරන ලදී.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මහපෙන්වීම යටතේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ (UNFPA) සහ Y-PEER තරුණ ජාලයේ සහය ඇතිව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය විසින් නිෂ්පාදනය කරන ලද මෙම අන්තර්ජාල වේදිකාව, ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවයේ සිට ප්‍රජනක සෞඛ්‍යය සහ ප්‍රජනක පදධතිය දක්වා සහ ආරක්ෂිත ලිංගිකත්වයේ (HIV සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන ඇතුළුව) සහ ප්‍රතිසන්ධිරෝධනයේ සිට මත්ද්‍රව්‍ය අනිසි භාවිතය සහ ඇබ්බැහි වූ හැසිරීම් දක්වා වූ ගැටළු රාශියක් පිළිබඳ අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් මෙවලම් සහිතව තරුණ වැඩිහිටියන් ඉලක්ක කර ක්‍රියාත්මක වේ.

**ආහාර සහනය**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල මණ්ඩපයේ ආපනශාලාවල ආහාර සහන ක්‍රමයක් ස්ථාපිත කර ඇත

**6.3 – HELVETAS** අවබෝධතා ගිවිසුම: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය, HELVETAS Inter-cooperation gGmbH සමඟ 2020 අගෝස්තු 17 වැනි සඳුදින තරුණ ප්‍රජාවක් සවිබල ගැන්වීම මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ප්‍රවර්ධනය කිරීමට සහ එයට ගරු කිරීමට සැලසුම් කර ඇති නව ව්‍යාපෘතියක් සඳහා සහයෝගී වීමට මූලික සැලසුම් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබා ඇත. මෙම ගිවිසුම යටතේ, HELVETAS Intercooperation gGmbH සංවිධානය විසින් දෙපාර්තමේන්තුවේ උපාධි අපේක්ෂකයින්ගේ අවශ්‍යතා සඳහා සියලුම මෙවලම් සහ උපාංගවලින් සමන්විත ඉන්කියුබේටර් මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ඇත. අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ආයතන දෙකේ සබඳතාවයේ වැදගත් සන්ධිස්ථානයකි.

InSPIRE ලෙස නම් කර ඇති මෙම ගිවිසුම, බහුවිෂයික ඉගෙනීම හරහා සිසුන් සම්බන්ධ කිරීම පිළිබඳ ඔවුන්ගේ පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ අදහස් ප්‍රකාශනය සඳහා නිර්මාණාත්මක අවකාශයන් ලබා දීමේ අරමුණ සහිතව ආයතන දෙක අතර සහයෝගීතාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කෙරේ.

**5 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරිසාර සංවර්ධන අරමුණු :**




## 7. යාවජීව ප්‍රජාව, සමාජ වගකීම, ජාතික සංවර්ධනය සහ ගෝලීය/කලාපීය බලපෑම

යාවජීව ප්‍රජාව සහ පාර්ශ්වකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක සබඳතා නඟා සිටුවීම තුළින් ජාතික, කලාපීය සහ ගෝලීය සංවර්ධනයට දායක වීම

**තෝරාගන්නාලද ප්‍රධාන අරමුණු:**

**7.1 අපගේ සම්පත් සහ විශේෂඥතාව පුළුල් ලෙස උපයෝගී කර ගත හැකි සහ වගකිවයුතු සහ බලගතු උපදේශකයෙකු, අසල්වැසියෙකු සහ සේවා යෝජකයෙකු බවට පත්කිරීම.**

**7.2 ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සහ අපගේ ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා පසුබිම නිර්මාණය කිරීම සහ විශ්ව විද්‍යාලය සහ ඉන් ඔබ්බට සමාජ වගකීම් සහ තිරසාරත්වය සඳහා දායක වීමට පෙළඹවීම.**

**7.3 අපගේ කාර්යයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ජාතික ආයතන සමඟ ශක්තිමත් සහයෝගීතා ගොඩනගා ගැනීම සමඟ ජාතික සංවර්ධනයේ අපගේ නියැලීම වැඩිදියුණු කිරීම සහ වෙනසක් ඇති කිරීම.**

මෙම අරමුණු සාක්ෂාත් කර ගත් ආකාරය:

7.1 –මහපොළ ශිෂ්‍යත්වය: වෙළෙඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල ගෙවීම් ලේඛන සකස් කිරීම සහ ගෙවීම් සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සිදු කරයි. එය අධ්‍යයන වර්ෂයකට වාරික දහයකින් සමන්විත වේ.

**2019 වර්ෂයේ මහපොළ ශිෂ්‍යාධාර ලාභීන්ගේ තත්‍ය සංඛ්‍යාව**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

| පීඨය | අධ්‍යයන වර්ෂය (ඇතුළත්කරගැනීම) | | | | | | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | 2012/2013 | 2013/2014 | 2014/2015 | 2015/2016 | 2016/2017 | 2017/2018 | |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | - | - | 514 | 503 | 534 | 619 | 2170 |
| ව්‍යවහාර්ක විද්‍යා | - | - | 117 | 182 | 226 | 287 | 882 |
| කළමනාකරණ හා වාණිජ | | | 884 | 838 | 844 | 940 | 3506 |
| වෛද්‍ය විද්‍යා | 67 | 65 | 118 | 89 | 105 | 106 | 550 |
| ඉංජිනේරු | - | - | - | 37 | 51 | 52 | 140 |
| තාක්ෂණවිද්‍යා | - | - | - | 208 | 2019 | 245 | 672 |
| මුළු එකතුව | | | | | | | 7860 |

මෙම වාරික ගෙවනු ලබන දිනයන් පිළිබඳව සුබසාධන අංශය මගින් සිසුන්ට ප්‍රසිද්ධ නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබේ.

**මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුව**: දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය සංවිධානය කරන ලද මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ විශේෂ දෙදින වැඩමුළු මාලාවක් සැප්තැම්බර් 19 සහ 20 යන දිනවල විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. මෙම වැඩමුළුවේදී මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වන මනෝචිකිත්සාවන් සහ උපදේශන සේවා පිළිබඳව දැඩි අවධානයක් යොමු කර තිබූ අතර අපරාධ සිද්ධි විමර්ෂණ කොට්ඨාශය, පොලිස් ළමා හා

කාන්තා කාර්යාංශය සහ පොලිස් ඇකඩමිය ඇතුළු කොළඹ දිස්ත්‍රික් කලාපයට අනුයුක්ත පොලිස් නිලධාරීන් 150 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ. දේශන සහ ප්‍රායෝගික සැසිය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගන්දාස පෙරේරා විසින් මෙහෙයවන ලද අතර ඔහු විසින් විශේෂඥ දැනුමට අදාළව සමස්ත වැඩමුළුවම අධීක්ෂණය කරන ලදී.

**7.2 – උපකාරක ව්‍යාපෘතිය**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ටයිකොන්ඩෝ කණ්ඩායම විසින් කොළඹ දිස්ත්‍රික් ටයිකොන්ඩෝ සංගමය සමඟ එක්ව සංවිධානය කරන ලද "හෙල්පින් හැන්ඩ්" ප්‍රජා ව්‍යාපෘතිය 2020 අප්‍රේල් 12, 17 සහ 18 යන දිනයන්හිදී සාර්ථකව පවත්වන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ගෝලීය වසංගතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති "කොවිඩ්-19" වසංගතය හේතුවෙන් රට පුරා පවතින තත්ත්වය සැලකිල්ලට ගනිමින් ටයිකොන්ඩෝ කණ්ඩායමේ සාමාජිකයින් වියළි සලාක ඇතුළුව අනෙකුත් දෛනික අත්‍යවශ්‍ය භාණ්ඩ අගහිගකම් ඇති ජනතාවට පරිත්‍යාග කිරීමේ මානුෂීය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළහ. එබැවින් විශ්වවිද්‍යාල ටයිකොන්ඩෝ කණ්ඩායමේ හිටපු සහ වත්මන් සාමාජිකයින්ගේ සහ කොළඹ දිස්ත්‍රික්

ටයිකොන්ඩෝ සංගමයේ සාමාජිකයින්ගේ නොමසුරු පරිත්‍යාගයන් සමඟ මෙය කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සාර්ථකව ක්‍රියාත්මක විය.

**7.3 – සෞඛ්‍ය අංශයේ සොයාගැනීම්**: ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ශිෂ්‍යයෙකු වන අශාන් කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වාතාශ්‍රක යන්ත්‍රයක් නිපදවන ලදී. තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ දෙවන වසරේ මැකැට්‍රොනික විෂය ධාරාවේ සිසුවෙකු වන පී.ඩී.එස්. අශාන් කුමාර විසින් කොවිඩ් 19 වසංගතයේ මෙම තීරණාත්මක කාලය තුළ නව්‍ය වාතාශ්‍රයක මූලාකෘතියක් නිර්මාණය කර ඇත. අශාන් විසින් නිර්මාණය කරන ලද නව වාතාශ්‍රකය පීඩන-පාලිත ශ්වසන මාදිලියක ක්‍රියා කරයි. දේශීය වශයෙන් වාතාශ්‍රය නිපදවීම සඳහා මෙය මනා දිරිගැන්වීමකි. ශිෂ්‍යයාගේ නව නිපැයුම තවදුරටත් වැඩිදියුණු කිරීමට උපකාර කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය එකඟ වී ඇත.

**7 වන වගන්තියේ ප්‍රධාන අරමුණු යටතේ ආවරණය වන තිරසාර සංවර්ධන අරමුණු :**



## 2020 වර්ෂයේ පුණරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| 2020 වර්ෂයේ පුණරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු | රු '000 |
|---|---|
| **අයිතමය** | මුදල |
| පුද්ගල පඩිනඩි | 4,362,927 |
| ගමන් වියදම් | 3,757 |
| සැපයුම් | 98,479 |
| නඩත්තු වියදම් | 32,441 |
| කොන්ත්‍රාත් සේවා | 548,886 |
| වෙනත් | 293,930 |
| ප්‍රාග්ධන ප්‍රදාන - පුණරාවර්තන ස්වරූපයේ වියදම් | 396,948 |
| **එකතුව** | **5,737,368** |



## මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය-පීඨ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය 2020 (අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්)

| පීඨය | මුළු පිරිවැය (රු.) | මුළු සිසුන් සංඛ්‍යාව 2020 | ඒක ශිෂ්‍ය පිරිවැය (රු.) |
|---|---|---|---|
| අ. ව්‍යවහාරික විද්‍යා | 1,133,689,661 | 2464 | 460,101 |
| ආ. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 1,131,035,966 | 3462 | 326,700 |
| ඇ. වෛද්‍ය විද්‍යා | 821,566,926 | 951 | 863,898 |
| ඈ. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ | 1,455,215,554 | 4843 | 300,478 |
| ඉ. ඉංජිනේරු | 274,611,098 | 472 | 581,803 |
| ඊ. තාක්ෂණ | 423,102,766 | 1246 | 339,569 |
| උ. සම සෞඛ්‍ය විද්‍යා | 184,218,114 | 320 | 575,682 |
| | **5,423,440,085** | **13,758** | |

## ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු

**රු.'000**

| අයිතමය | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| අ. වත්කම් අත්පත්කරගැනීම් | 542,137 | 724,950 | 300,926 | 211,156 |
| ආ. ගොඩනැගිළි හා ආකෘති අත්පත්කරගැනීම් | 269,169 | 1,395,075 | 787,141 | 1,364,228 |
| ඇ. පුස්තකාල පොත් | 33,337 | 30,914 | 21,304 | 11,231 |
| ඈ. දැණුම වර්ධනය සඳහා ප්‍රදාන | - | - | - | - |
| ඉ.මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති | 1,650 | 9,253 | 12,937 | 3,601 |
| ඊ. පර්යේෂණ ශක්තිමත් කිරීම | 146,417 | 369,062 | 168,857 | 100,794 |
| උ.වෙනත් (පුණරුත්තාපන) | 142,472 | 127,597 | 234,210 | 223,455 |
| **එකතුව** | **1,135,182** | **2,656,851** | **1,525,375** | **1,914,465** |

## මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2020 රු.( '000)

| අයිතමය | සූත්‍රය | '000 ඒක ශිෂ්‍ය වියදම රු.'000 |
|---|---|---|
| අ.ඒක ශිෂ්‍ය පුණරාවර්තන වියදම (පු.වි.) | පු.වි. / ශිෂ්‍ය සංඛ්‍යාව | 417 |
| ආ . ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම (ප්‍රා.වි.) | ප්‍රා.වි / ශිෂ්‍ය සංඛ්‍යාව | 139 |

## පූර්ව වර්ෂ 5ක මූල්‍ය සුවිශේෂිතා (සංඛ්‍යා රු. '000 දක්වා ඇත)

| අයිතමය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| 1.පුද්ගල පඩිනඩි | 2,181,660 | 2,384,967 | 2,989,044 | 3,875,309 | 4,362,927 |
| 2.ගමන් වියදම් | 46,122 | 32,170 | 41,015 | 30,504 | 3,757 |
| 3.සැපයුම් | 105,859 | 117,133 | 126,643 | 142,706 | 98,479 |
| 4.නඩත්තු වියදම් | 129,262 | 35,884 | 74,378 | 28,070 | 32,441 |
| 5.කොන්ත්‍රාත් සේවා | 350,182 | 496,041 | 577,564 | 652,018 | 548,886 |
| 6.වෙනත් | 313,821 | 385,306 | 377,922 | 547,760 | 292,028 |
| 7. පර්යේෂණ සහ සංවර්ධන | 945 | 293 | 1,682 | 979 | 1,902 |
| 8. විශ්වවිද්‍යාල නාගරීකරණ ව්‍යාපෘතිය සහ වෙනත් | 114,359 | 259,834 | 391,920 | 414,833 | 396,948 |
| **එකතුව** | **3,242,210** | **3,711,628** | **4,580,168** | **5,692,179** | **5,737,368** |

## පූර්ව වර්ෂ 05ක මූල්‍ය ප්‍රදාන ලැබීම පිළිබඳ විශේෂ තොරතුරු (සංඛ්‍යා රු. '000 දක්වා ඇත)

| අයිතමය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන | 1,297,200 | 1,139,312 | 2,653,700 | 1,510,156 | 1,919,000 |
| පුණරාවර්තන ප්‍රදාන | 2,537,702 | 2,907,750 | 3,590,000 | 4,589,000 | 4,975,000 |




**පූර්ව වර්ෂ 05ක මූල්‍ය වියදම් පිළිබඳ විශේෂ තොරතුරු (සංඛ්‍යා රු. '000 දක්වා ඇත)**

| | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | 1,296,190 | 1,135,182 | 2,656,851 | 1,525,375 | 1,914,465 |
| පුණරාවර්තන වියදම් | 3,242,210 | 3,711,628 | 4,580,168 | 5,692,179 | 5,737,368 |


7000000
6000000
5000000
4000000
3000000
2000000
1000000
0
2016
2017
2018
2019
2020
ප්‍රග්ධන වියදම්
පුනරාවර්තන වියදම්

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ අදායම් ප්‍රකාශනය

**(ඉලක්කම් ආසන්න රුපියලට ගලපා ඇත)**

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | රු. | රු. |
| | **සටහන්** | | |
| රජයේ ආධාර - පුනරාවර්තන | | 4,975,000,000 | 4,589,000,000 |
| රජයේ ආධාර - මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 1 | 362,830,270 | 394,188,677 |
| අභ්‍යන්තර ආදායම් | 2 | 609,926,178 | 817,429,736 |
| රජයේ ආධාර සහ පරිත්‍යාග ක්‍රමක්ෂය | | 851,663,702 | 708,820,644 |
| මහපොළ ශිෂ්‍යත්ව | 30 | - | 72,373,750 |
| ශිෂ්‍යාධාර | | 52,391,000 | 53,482,100 |
| **මුළු ආදායම** | | **6,851,811,150** | **6,635,294,907** |
| **මෙහෙයුම් වියදම** | | | |
| සේවක වැටුප් හා දීමනා | 4 | 4,362,927,468 | 3,875,309,550 |
| ගමන් වියදම් | 4 | 3,757,135 | 30,504,296 |
| සැපයීම් | 4 | 98,479,392 | 142,706,205 |
| නඩත්තු සේවා | 4 | 32,440,819 | 28,070,295 |
| කොන්ත්‍රාත් සේවා | 4 | 548,885,654 | 652,018,404 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 4 | 293,930,316 | 548,738,657 |

| | | | |
|---|---|---|---|
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | 24 | 90,871,943 | 85,776,849 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභ සහ පාඩු | 24 | (51,700,476) | 714,907,070 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත පොලී පිරිවැය | 24 | 137,861,114 | 55,747,648 |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් පාඩු | 3 | (2,638,416) | 269,444 |
| කඩාදැමූ ගොඩනැගිලි වත්කම් අලාභ | 3 | 12,225,251 | - |
| මූලධන ආධාර - පුනරාවර්තන වියදම් | 5 | 396,947,641 | 414,832,945 |
| ක්ෂය වීම් | 6-7 | 1,000,081,213 | 826,318,757 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | 9 | 21,902,045 | 5,559,806 |
| මහපොළ ශිෂ්‍යත්ව | 30 | - | 72,373,750 |
| ශිෂ්‍යාධාර | | 52,391,000 | 53,482,100 |
| **මුළු වියදම** | | **6,998,362,101** | **7,506,615,777** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් ඌනතාවය/අතිරික්තය** | | **(146,550,951)** | **(871,320,870)** |

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | | **2020 දෙසැ : 31 දිනට** | **2019 දෙසැ : 31 දිනට** |
|---|---|---|---|
| | | **(රු.)** | **(රු.)** |
| **වත්කම්** | **සටහන්** | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 6 | 16,404,814,192 | 9,910,769,599 |
| පුස්තකාල පොත් සහ උපාධි ලෝගු | 7 | 26,275,115 | 57,276,878 |
| කෙරීගෙන යන වැඩ | 8 | 210,699,022 | 2,614,067,646 |
| ආයෝජන | 9 | 18,123,863 | 23,643,797 |
| | | **16,659,912,193** | **12,605,757,921** |
| **ජංගම වත්කම්** | | | |
| ගබඩා තොගය | 10 | 54,303,944 | 56,664,388 |
| මූල්‍ය වත්කම් | 11 | 1,979,204,422 | 1,783,402,618 |
| ණය ගැතියන් සහ ලැබිය යුතු දේ | 12 | 175,602,386 | 130,435,842 |
| **වත්මන් මූල්‍ය වත්කම්** | | | |
| සේවක අත්තිකාරම් | 13 | 598,268 | 745,468 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් | 14 | 667,932,822 | 235,390,373 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 15 | 701,012,727 | 358,215,225 |
| | | **3,578,654,569** | **2,564,853,915** |
| **වත්කම් එකතුව** | | **20,238,566,762** | **15,170,611,835** |

| | | 2020 දෙසැ : 31 දිනට | 2019 දෙසැ : 31 දිනට |
|---|---|---|---|
| | | (රු.) | (රු.) |
| **ස්කන්ධය හා වගකීම්** | **සටහන්** | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | 16 | 7,203,997,538 | 6,337,961,992 |
| මූලධන ආධාර | 17 | 1,341,881,328 | 966,321,412 |
| ත්‍යාග හා ප්‍රදාන | 18 | 462,862,511 | 490,212,514 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 8,756,249,121 | 5,245,641,447 |
| රඳවා ගත් ඉපයීම් | | (1,585,604,973) | (1,421,832,744) |
| | | **16,179,385,525** | **11,618,304,621** |
| **සංචිත හා අරමුදල්** | | | |
| අභ්‍යන්තර විශේෂිත අරමුදල් | 19 | 969,561,541 | 722,059,096 |
| මූලධන සංචිත | 20 | 1,574,237 | 1,574,237 |
| අනුස්මරණ අරමුදල් | 21 | 35,527,763 | 31,969,905 |
| විවිධ පර්යේෂණ අරමුදල් | 22 | 143,591,367 | 140,089,224 |
| විලම්භීත අදායම් - ස්වයන් මූල්‍ය හා ව්‍යාපෘති | 23 | 710,448,127 | 590,026,671 |
| | | **1,860,703,035** | **1,485,719,132** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා වෙන්කිරීම් | 24 | 1,432,083,342 | 1,312,962,990 |
| | | **1,432,083,342** | **1,312,962,990** |
| **ජංගම වගකීම්** | | | |
| ආපසු ගෙවිය යුතු තැම්පත් | 25 | 37,797,544 | 32,728,127 |
| උපචිත හා වෙනත් ගෙවිය යුතු වියදම් | 26 | 728,597,312 | 720,896,961 |
| | | **766,394,856** | **753,625,088** |
| **ස්කන්ධය හා වගකීම් වල එකතුව** | | **20,238,566,762** | **15,170,611,835** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

කේ.ටී.සී.ප්‍රියංගනී
මූල්‍යාධිකාරී

ඒ.බී.වැලිවිට
ලේඛකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයින් වගකිව යුතුය.

පාළක සභාව වෙනුවෙන් අත්සන් කළේ :

සුජීව රාජපක්ෂ

07. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC ලිපිය) විසින් මෙම උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචිය අත්හිටුවා ඇති බැවින් 2020 කලා උපාධියේ බාහිර උපාධි වැඩසටහන සඳහා අයදුම්කරුගෙන් පාඨමාලා ගාස්තු ලෙස රුපියල් 101,150,000ක් ගෙවිය යුතු බවට වාර්තා කර ඇති අතර වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන නොමැත. 28/09/2020 දිනැති).

08. ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් ක්‍රියාකාරී සභ කළමනාකරණ උපදේශක විසින් නිර්වචනය කරන ලද බැඳීම් පිළිබඳ ප්‍රතිපාදන අගය කර ඇත. වර්ෂය තුළ තක්සේරු කිරීම පහත උපකල්පන මත පදනම් විය

මරණ:1967/70 (වගුව)
ආබාධිත: 10%of (වගුව)
කාර්ය මණ්ඩල පිරිවැටුම: 1% (වාර්ෂිකව)
වට්ටම් අනුපාතය 8%(වාර්ෂිකව)
වැටුප් වර්ධක අනුපාතය: අධ්‍යයන 7%, අනධ්‍යන 5%

09. ආසියානු සංවර්ධන බැංකුව (ADB) යටතේ ක්‍රියාත්මක වන විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය සහ උපකරණ ඉදිකිරීම සඳහා ඩොලර් මිලියන 35 (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6) ප්‍රදානය කිරීමට අනුමැතිය ලබා දී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය. මහා භාණ්ඩාගාරය විසින් 2019/01/17 වන දින ආසියානු සංවර්ධන බැංකුව සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත. ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා වන ගිවිසුමක් 2021 ජනවාරි මාසයේ දී සන්කෙන් කන්සල්ටන්ට් (පුද්ගලික) සමාගමේ ලේකම් විසින් රුපියල් මිලියන 3,625 (වැට් බද්ද නොමැතිව) ඉදිකිරීම සඳහා අත්සන් කර ඇත. ADB අරමුදල් මත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය. 2020 වර්ෂය තුළ රුපියල් මිලියන 82 ක් වටිනා උපකරණ විශ්වවිද්‍යාල පොත්වල ප්‍රාග්ධනිත කර ඇත.

10. විශ්ව විද්‍යාලවල උසස් අධ්‍යාපන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන (AHEAD) වැඩසටහන යටතේ ලෝක බැංකු ප්‍රදානය විශ්වවිද්‍යාලයට ලැබී ඇත. ලෝක බැංකු ප්‍රදානය රු. පහත සඳහන් ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීම සඳහා 2018 වසරේ සිට 2020 දක්වා රුපියල් මිලියන 880ක් ලැබී ඇත.

අරමුණු 01- විද්‍යා තාක්ෂණ ඉංජිනේරු කළමනාකරණ
වෛද්‍ය විද්‍යා පීඨය සහ තාක්ෂණ පීඨය වැඩි දියුණු කිරීම
රුපියල් මිලියන. 583

අරමුණු 02- ඉගෙනුම් සහ ඉගැන්වීම් තක්සේරු කිරීම හා ඉංග්‍රිසි භාෂාව
මානව සම්පත් සංවර්ධනය රුපියල් මිලියන. 197

අරමුණු 03- පර්යේෂණ වැඩිදියුණු කිරීම, නවෝත්පාදන,
වාණිජකරණය හා ව්‍යාපාර සම්බන්ධය රුපියල් මිලියන. 100

ඉහත ප්‍රදානයෙන් මිල දී ගත් මිලියන 119 ක් වටිනා උපකරණ 2020 වර්ෂය තුළ ප්‍රාග්ධනීකරණය කරන ලදී. තාක්ෂණ පීඨයේ අධ්‍යයන ගොඩනැඟීමේ පිරිවැය සඳහා රුපියල් මිලියන 350 ක AHEAD ප්‍රදානයක් ලැබුණු අතර එය වසර තුළ ප්‍රාග්ධනීකරණය කර ඇත. ප්‍රදානයේ ඉතිරි ශේෂය විවිධ ව්‍යාපෘති සඳහා ලැබී ඇති අතර එම ව්‍යාපෘති අඛණ්ඩව පවතින අතර ව්‍යාපෘති අවසන් වූ පසු ප්‍රාග්ධනය කරනු ලැබේ.

11. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අයත් කළුබෝවිල පිහිටි රුපියල් මිලියන 347 ක් වටිනා ඉඩම සහ ගොඩනැඟිල්ල දැනට දෘශ්‍ය කලා හා රංග විශ්වවිද්‍යාලය විසින් භාවිත කරනු ලැබේ. එම දේපල සෞන්දර්ය කළා විශ්ව විද්‍යාලයෙන් ආපසු ලබා ගැනීමට විශ්ව විද්‍යාලය විසින් කටයුතු කර ඇත.

12. ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක්, ව්‍යායාම ශාලාවක් සහ පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා නාගරික දෙපාර්තමේන්තු ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 618 ක් වටිනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට 2014 පෙබරවාරි 13 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. උපදේශන ගාස්තු සහ සැලසුම් සකස් කිරීම සඳහා මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) 2016 වර්ෂයේදී රුපියල් 5,794,676ක් ගෙවා ඇත. අයවැය ප්‍රතිපාදන ලැබී නොමැති අතර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පසු විපරමක් සිදු කර ඇත.



# ජාතික විගණන කාර්යාලය

தேசிய கணக்காய்வு அலுவலகம்

NATIONAL AUDIT OFFICE



22 JUN 2021

VICE - CHANCELLOR'S OFFICE
HUGE GODA

මගේ අංකය
எனது இல.
My No. } එව්ඩී/සී/යූවයසේ/ඉගප/2017/5

දිනය
திகதி
Date } 2021 ජූනි 17 දින.




උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෛනික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.ඒ.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
02. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම් - මුදල් අමාත්‍යාංශය

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. HED/D/USJ/FA/20/02

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජූනි 7 දින

උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත සඳහනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් කවුරුවත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද පහත සඳහන් නිර්දේශ හැර අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ යම් සාමාජිකයෙකුට ආයතනය සමඟ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නිකිරීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) අතුරු අග්‍රිම , නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී චෙක්පත් මඟින් හා මුදලින් නිකුත් කර නිබු එකතුව රු. 1,069,879 ක අත්තිකාරම් 06 ක් හා 2018 හා 2019 වර්ෂවල නිකුත් කළ එකතුව රු. 83,027 ක් වූ අත්තිකාරම් 3 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.<br>(ii) තත්ත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින දහයක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද එකතුව රු. 679,400 ක් වූ අත්තිකාරම් 22 ක් ආපසු පියවීම දින 23 සිට දින 133 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි.<br>(iii) තත්ත්කාර්ය අතුරු අග්‍රිම උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවා නිලධාරීන් 02 දෙනෙකුට අවස්ථා 13 කදී එකතුව රු. 1,561,800 ක් ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 (2) | 2016,2017,2018 යන වර්ෂවල ලද එකතුව රු. 1,486,675 ක් වූ ආපසු ගෙවිය යුතු චෙන්ඩර් තැන්පතු 107 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය | |
| XX චෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 34 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 19,705,186 ක් බැඳුම්කර කඩවීම මත විශ්වවිද්‍යාලයට අයවිය යුතුව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 102 ක් යටතේ පැවති රු. 35,527,763 කින්, අරමුදල් 98 ක් යටතේ වූ රු. 32,839,003 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව අක්‍රීයව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ශේෂය රු. 36,658,732 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 28 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එකතුව රු. 22,503,744 ක් වූ අරමුදල් ගිණුම් 47 ක් හා එකතුව රු. 347,586,262 ක් වූ විශේෂ අරමුදල් 28 ක් සමාලෝචිත වර්ෂය තුළ දී උපයෝජනය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ වර්ෂ 06 ක කාල සීමාවක් තුල විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 669 ක් වූ විවිධ පර්යේෂණ 366 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ඉන් ඉවත් කර ගැනීම් හා මුදල් ලබා නොගැනීම් මත පර්යේෂණ 31 ක් නවතා දමා තිබූ අතර පර්යේෂණ 173 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණ කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 14.89 ක ප්‍රතිපාදන අනුමත වූ කථිකාචාර්යවරුන් 31 දෙනෙකු වාර්තාවේ දිනය දක්වාම පර්යේෂණ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් වෙනත් කථිකාචාර්යවරයෙකුට ඒ සඳහා වූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා 1991 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන අතර විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) පාඨමාලාව පමණක් 2014 වර්ෂයෙන් පසු නව පාඨමාලාවක් ලෙස සමාලෝචිත වර්ෂයේදී හඳුන්වා දී තිබූ අතර මෙම පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු වර්ෂය අවසානය දක්වා අවසන් කර නොතිබුණි.

(ඊ) 2018, 2019 වර්ෂවලදී බාහිර විභාග පාඨමාලා ගාස්තු සහ සම්මන්ත්‍රණ සඳහා සිසුන්ගෙන් ලද රු. 172,295,076 ක් අදාළ පාඨමාලා සහ සම්මන්ත්‍රණ නොපැවැත් වීම හේතුවෙන් විලම්බිත ආදායම් ලෙස දක්වා තිබුණි.

(උ) එකතුව රු. 7,053,294 ක් වූ ලැබිය යුතු ශේෂ 11 ක් සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක් ගත වී ඇති නමුත් එම ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

(ඌ) නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය කර ගෙන යාමේ හැකියාව නිශ්චය කිරීමකින් තොරව ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළ කාර්යය වෙනුවෙන් උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජූනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම් අනාර්ථික ගනුදෙනුවක් වී තිබුණි.

(එ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 6.5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජූනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, 2019 වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාවට අනුකූලව ගන්නා ලද ක්‍රියාමාර්ග

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

දුරකථනය Telephone } 2802695, 2802696
2803191, 2803192

ෆැක්ස් Fax } 2801604

E. Mail } unisj@sjp.ac.lk

මගේ අංකය My Number }

ඔබගේ අංකය You're Number } HED/D/USJ/FA/20/02

නුගේගොඩ
ශ්‍රී ලංකාව
NUGEGODA
SRI LANKA.

තැපැල් පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.

2021.05.13

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක HED/D/USJ/FA/20/02 හා 2021 අප්‍රේල් 28 දිනැති මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණන වාර්තාව හා බැඳේ.

එහිදී යථෝක්ත වාර්තාවේ කෙටුම්පතට අදාල පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදත්ත ලියනගේ
උපකුලපති

| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව | |
|---|---|
| **1.2 මතය සඳහා පදනම** | |
| (අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.11 (a) (v) යටතේ සහ 2.11 (b) යටතේ Computer Software and online journals ක්ෂය කිරීමේදී අනුගමනය කරන ප්‍රතිපත්ති දෙකක් අනුගමනය කරන බව දක්වා තිබුණි. ගිණුම්කරණ ප්‍රතිපත්ති 2.11 (b) යටතේ ඇස්තමේන්තු ජීවිත කාලය වසරක් ලෙස දක්වා තිබුණද, පිරිවැය රු. 40,683,991 ක් වූ Software වසර 5 ක ඇස්තමේන්තු ජීවිත කාලයක් ලෙස සලකා වසරකට සියයට 20 බැගින් ක්ෂය කර තිබුණි. | 2.11.a (V) අස්පෘශ්‍ය වත්කම්, එම වත්කම්වල ජීවකාලය තුල ක්‍රමක්ෂය කරන බව දක්වා ඇත. එබැවින් මාර්ගගත ජ'නල ජීව කාලය වසරක් වන අතර පරිගණක මෘදුකාංග ජීවකාලය ලෙස වසර 5 ක් ගනු ලබයි. මේ අනුව ක්‍රමක්ෂය කර ඇති අතර පෙර වසර වලදී එලෙසම ගිණුම්ගත කර ඇත. මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි ජීව කාලය වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා ඇති රු. 3,018,138 ක් වූ පෙර වර්ෂවලට අදාළ ගැලපුම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව සටහනක් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | මෙය කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ පැවති ගිණුම් ශේෂ කිහිපයක් අදාල ලේඛන සමඟ සසඳා තුලනය කිරීම සඳහා වූ ගිණුම් සටහනකි. මෙම සියළු නිවැරදි කිරීමේ සටහන් 2020.10.08 දින පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 06 හි ඡේද අංක 9 සි ප්‍රකාරව ගිණුම්වල ගැලපීම් කළ හැකිව තිබූ සමාලෝචිත වර්ෂය තුළ වෛද්‍ය පීඨයට ලද රු. 1,682,283 ක් වූ විද්‍යාගාර උපකරණ ප්‍රදාන , තක්සේරු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. | විද්‍යාගාර උපකරණ ඇතුළුව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා තිබූ නමුත් රටේ පැවතිය වූ වසංගත රෝග තත්ත්වය හේතුවෙන් තක්සේරු කටයුතු කිරීමට නොහැකි විය. එම නිසා මෙම උපකරණ විශ්වවිද්‍යාලයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් 2021 පෙබරවාරි මස පිරිවැය තක්සේරු කොට පිරිවැය සටහනක් මඟින් පෙන්වා ඇත. භාණ්ඩ ලැයිමේ පත්‍රිකා නිකුත්කිරීම |

| | |
|---|---|
| | 2020.12.31 න් අවසන් වන බැවින් මෙම භාණ්ඩ සඳහා භාණ්ඩ ලැබීමේ පත්‍රිකා නිකුත් කළ නොහැකි බැවින් 2021 වසරේදී ගිණුම්ගත කරනු ලැබේ. මේ පිළිබඳ ගිණුම්කරණ සටහන් අංක 30 හි 5 මඟින් දක්වා ඇත. |
| (ඇ) ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර වූ මුදල නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඉවත් කරන ලද ගොඩනැගිලි 3 ක සහ වත්කම් වර්ග 6 ක ශුද්ධ වටිනාකම වූ රු. 25,892,326 ක් ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමෙන් ඉවත් කර තිබුණි. | ඉවත්කරන ලද ගොඩනැගිලි ඉතා ඇත අතීතයේ සිට පවතින ගොඩනැගිලි වන අතර මෙවායේ වටිනාකම ශූන්‍ය අගයක්ව පැවති බැවින් ඒවා 2014 දී ප්‍රත්‍යාගණනය කොට පොත්වල සටහන් කොට ඇත.<br>ගොඩනැගිලි ගිණුම හර<br>ප්‍රත්‍යාගණන සංචිත ගිණුම බැර<br>අදාළ ගොඩනැගිලි ඉවත් කිරීමේදී එම ප්‍රත්‍යාගණන ලාභය උපලබ්ධි වීමක් කොට සලකා ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත්කොට රදවාගත් සංචිතයට මාරුකොට ඇත. එසේම අනෙකුත් වත්කම්ද 2014 ප්‍රත්‍යාගණන කිරීමට පෙර ශූන්‍ය ශුද්ධ අගයක්ව පැවති ඇති බැවින් මුළු ප්‍රත්‍යාගණන වටිනාකම පිරිවැය ලෙස සටහන් කොට ඇත. එමනිසා වත්කම් ඉවත්කිරීමේදී ප්‍රත්‍යාගණන සංචිතයට බැර වී ඇති මුළු අගයම රදවාගත් සංචිතයට බැර කොට ප්‍රත්‍යාගණන සංචිතයෙන් ඉවත්කොට ඇත. |

| | |
|---|---|
| (ඉ) ආධාර මත ලැබී තිබුණු සහ ප්‍රාග්ධන ප්‍රදාන මඟින් මිල දී ගෙන තිබූ ප්‍රත්‍යාගණන කරන ලද වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේ දී පිරිවැය පදනම් කර ගැනීම වෙනුවට ප්‍රත්‍යාගණන වටිනාකම් පදනම් කරගෙන සිදු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී පමණක් රු. 851,663,702 ක් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හා ආධාර ගිණුමට හර කර වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ආධාර මත ලැබී තිබුණු සහ ප්‍රාග්ධන ප්‍රධාන මඟින් මිලදී ගෙන තිබූ ප්‍රත්‍යාගණන කරන ලද වත්කම් සඳහා ක්‍රමක්ෂය කිරීමේදී නිවැරදි ලෙස පිරිවැය පදනම් කරගෙන ක්‍රමක්ෂය කර ඇත. |
| (ඊ) මහජන බැංකුවේ අංක 097-60-01-00007309-3 දරන රු. 9,989,072 ක ස්ථාවර තැන්පතුවේ කල්පිරීමේ කාලය මාස 03 ක් ලෙස ස්ථාවර තැන්පතු සහතිකයේ දක්වා තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ තහවුරු ලිපිය අනුව ස්ථාවර තැන්පතුව නැවත අළුත්කර තිබුණි. තැන්පතුව අළුත් කිරීමේදී පොලිය ලැබී තිබිය යුතු නමුත් 2020 දෙසැම්බර් 31 දිනට රු. 356,186 ක මුදලක් ලැබිය යුතු පොලිය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (උ) AHEAD ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විශ්වවිද්‍යාලයට රු. මිලියන 892.7 ක ප්‍රදාන ලැබී තිබුණු අතර ඉන් රු. මිලියන 308.8 ගිණුම්ගත කර නොතිබුණි. | AHEAD ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන ඇති සියළු උපකරණ හා ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් වන රු.මිලියන 657 විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රාග්ධනීත කර ඇත. එම සියළු උපකරණ විශ්වවිද්‍යාලයට ලැබීමෙන් අනතුරුව හා ගොඩනැගිලි ඉදිකිරීම් අවසන් වීමෙන් අනතුරුව ප්‍රාග්ධනීත කර ඇත. AHEAD ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන අරමුණු තුනකට මුදල් ලැබෙන අතර එම වියදම් තවමත් සිදුකරමින් පවතී. එම වියදම් අදාල කාර්යය අවසන් වූ පසු විශ්වවිද්‍යාල ගිණුම් සඳහා ගනු ලබයි. |

| | |
|---|---|
| | උදා :- පශ්චාද් උපාධි අධ්‍යයන ගෙවීම් අවුරුදු තුනක් සඳහා ගෙවීම් කරනු ලබන අතර අවසාන ගෙවීමෙන් අනතුරුව පමණක් ගිණුම්ගත කල හැකිය. එක් එක් කාර්යයන් සඳහා ගිණුම්ගත කලයුතු වැය ශීර්ෂයන් AHEAD ව්‍යාපෘතිය මඟින් සියළු විශ්වවිද්‍යාල සඳහා ලබා දෙන්නේ නම් වඩාත් යෝග්‍ය වේ.<br>අදාල මුදල් ලැබීම සහ AHEAD ප්‍රධානය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 30 හි 10 මඟින් දක්වා ඇත. |
| (උ) වර්ෂ ගණනාවකට පෙර හඳුනා ගන්නා ලද ආරම්භක ශේෂ ගැලපීම් සඳහා වූ රු. 11,507,838 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දක්වා තිබුණි. | මෙම ගැලපීම් පෙර වර්ෂවලට අදාලව සිදුකරන ලද මූල්‍ය ක්‍රියාකාරකම් වලට අදාල ගැලපීම් කර ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත. |
| (එ) බාහිර විභාගවල විලම්බිත ආදායම් ලෙජර ගිණුමේ ශේෂය සහ අවසන් මූල්‍ය ප්‍රකාශනයෙහි දැක්වෙන ශේෂය අතර රු. 20,500 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඒ) 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 235,600 ක් වූ ප්‍රකාශන 3,978 ක් භාවිතයට නොගන්නා බවත් එම ප්‍රකාශන දිනෙන් දින හානි වන බවත් 2020 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් දක්වා තිබුණද එම ප්‍රකාශන නොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල තොගය ඉවත් කිරීම සඳහා පුස්තකාල සංවර්ධන කමිටුවේ හා මුදල් කමිටුවේ අනුමැතිය ලබාගත යුතුය. අදල අනුමැතිය ගෙන ඉවත්කිරීමට කටයුතු කරනු ඇත. |

| 2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව. | | |
|---|---|---|
| **නීතිරීති/ විධානයට යොමුව** | **විස්තරය** | |
| (අ) 2015 සැප්තැම්බර් 25 දිනැති අංක එස්පී/එස්බී/07/15 දරන හා 2018 දෙසැම්බර් 07 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති චක්‍රලේඛය | අවම පිරිවැයක් දරමින් වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්විය යුතු වුවත් හෝටල් වල ත්‍රෛත්තීය සංවර්ධන වැඩ සටහන් පැවැත්වීම හේතුවෙන් 2019 මූල්‍ය වර්ෂය තුළ ත්‍රෛත්තීය සංවර්ධන වැඩසටහන් 12 ක් සඳහා එකතුව රු. 6,211,425 ක්ද සමාලෝචිත වර්ෂයේදී දෙදිනක ත්‍රෛත්තීය සංවර්ධන වැඩසටහන් 02 ක් සඳහා රු. 1,377,125 ක්ද ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් වැය කර තිබුණි. | සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම සඳහා ආයතන තෝරා ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරනු ලබන අතර ඒ ඒ වැඩමුළුව සඳහා ස්ථාන තෝරා ගැනීමේදී ඊට සහභාගී වන සංඛ්‍යාව අනුව නවාතැන් ලබාදීමේ පහසුව සම්මන්ත්‍රණ ශාලා ඉඩ පහසුකම් දින ලබා දීමේ හැකියාව ආදිය තීරණය වේ. ඒ අනුව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පාලනය වන ආයතනයන්හිදී වැඩමුළු 4ක් පවත්වා ඇත.<br>2020 වර්ෂයේ එක් වැඩමුළුවක් යුධහමුදාව විසින් පවත්වාගෙන යනු ලබන ආයතනයක රු. 883,046 ක් වියදම් දරමින් පවත්වා ඇති අතර අනෙක් වැඩමුළුව සඳහා සහභාගී වන සේවක සංඛ්‍යාව නවාතැන් පහසුකම් හා සම්මන්ත්‍රණ ශාලා පහසුකම් ලබාදීමේ හැකියාව මත ආයතනය තෝරාගෙන ඇත. |

| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
|---|---|---|
| i. 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් වක්‍රලේඛය | i. අතුරු අග්‍රිම, නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී චෙක්පත් මඟින් නිකුත් කර තිබූ රු. 850,000 ක අත්තිකාරම් 02 ක් හා මුදලින් නිකුත් කර තිබුණු රු. 219,879 ක අත්තිකාරම් 4 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබූ අතර 2018 හා 2019 වර්ෂවල නිකුත් කළ එකතුව රු. 83,027 ක් වූ අත්තිකාරම් 3 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | 2020 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ උපාධි ප්‍රදානෝත්සවය සඳහාත්, වර්ණ ප්‍රදාන උළෙල සඳහාත් S.W.R.D. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට හා Golden Rose ආයතනයට ශාලාව චෙන් කරවා ගැනීමට අත්තිකාරම් ලබාදුන් අතර රටේ පැවති COVID තත්වය හේතුවෙන් එම උත්සව පැවැත්වීමට නොහැකි විය. එම නිසා එම මුදල් තැන්පතු ලෙස එම ආයතන තුළ රඳවා තබා ගෙන ඇත.<br>තව ද "The Economist" සඟරාව සඳහා 2019 වර්ෂයේ විජිත යාපා ආයතනයට ගෙවීම් කරන ලද මුදල 2019.11.30 දින සිට 2020.11.21 දින දක්වා වසරක කාල සීමාවකට යටත්ය. 2020.12.31 දිනට පෙර එම අත්තිකාරම් පියවීමට නොහැකි වූයේ රටේ පැවති COVID තත්වය මත සිංගප්පුරුවේ සිට එම සඟරාව ගෙන්වා ගැනීමට නොහැකි වීම මත අදාල ඉන්වොයිසිය එම ආයතනයෙන් නොලැබීම හේතුවෙනි. |
| | ii. 2019 වර්ෂයේ නිකුත් කළ එකතුව රු. 97,756 ක් වූ පර්යේෂණ අත්තිකාරම් 2 ක් හා එකතුව රු. 133,486 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් 2 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | පර්යේෂණ අත්තිකාරම් මුදල පියවීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | iii. තක්ත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින දහයක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද එකතුව රු. 679,400 ක් වූ අත්තිකාරම් 22 ක් ආපසු පියවීම් දින 23 සිට දින 133 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | රටේ පැවති COVID තත්වය මත විශ්වවිද්‍යාල වසා තැබීම, සේවක හවතුන් නිරෝධායනයට ලක්වීම, සේවකයින් සේවයට වාර්තා කිරීම සීමා කිරීම, වසා තැබූ ප්‍රදේශයට අයත් සේවකයින් සිටීම හා රට තුල භාණ්ඩ හිඟ වීම ආදී කරුණු මත අත්තිකාරම් ලබාගත් කටයුතු ප්‍රමාද වීම හා වියදම් වූ බිල්පත් ලබාගෙන ඉතුරු මුදල් සරප් වෙත ගෙවා පියවීම් කිරීමට ප්‍රමාද වී ඇත. |
| | v. තක්ත්කාර්ය අතුරු අග්‍රිම රු.100,000 ක් වූ උපරිම සීමාව ඉක්මවා නිලධාරීන් 02 දෙනෙකුට අවස්ථා 13 කදී එකතුව රු. 1,561,800 ක් ලබාදී තිබුණි. | රු. 100,000.00 ඉක්මවා අත්තිකාරම් ලබාදී ඇත්තේ පාලක සභා රැස්වීම් සඳහා වන අතර ඒ සඳහා සහභාගී වන පාලක සභා සමාජිකයින්ට සාමාජික දීමනාව හා ප්‍රවාහන දීමනාව ලබා දීමට එක් අයෙකුට රු. 10,000.00 බැගින් සාමාජිකයින් 12 දෙනෙකුට රු. 120,000.00 වැය වන බැවින් එම ගෙවීම් කිරීම සඳහා විශේෂ අවස්ථාවක් ලෙස සලකා බලා උපකුලපති අනුමැතියක් ලබාගෙන රු. 100,000.00 ඉක්මවූ අත්තිකාරම් මුදලක් ලබා දී ඇත. |
| (ii)මුදල් රෙගුලාසි 396 (ඇ) | විශ්වවිද්‍යාලයට අයත් ජංගම ගිණුම් 03 ක මාස 06 කට වැඩි නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ වටිනාකම රු. 306,071 ක් වූ චෙක්පත් 51 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අදාළ චෙක්පත් අදායමට ගැනීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| (iii) මුදල් රෙගුලාසි 571 (2) | 2016, 2017, 2018 යන වර්ෂවල ලද එකතුව රු. 1,486,675 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 107 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් ප්‍රදානයන් සඳහා එම තැන්පත්කරුවන් හට ලිඛිතව දැනුවත් කලද ඔවුන් එම මුදල් නැවත ඉල්ලා නොසිට නැවත ඊලඟ ටෙන්ඩර් තැන්පතු වාරය සඳහා දිගින් දිගට පවත්වා ගන්නා අතර ඔවුන්ගේ කාලය අවසන් වූ පසු එම ටෙන්ඩර් තැන්පතු ආපසු ගෙවනු ලැබේ. එම නිසා එම ශේෂයන් ලෙජර් ගිණුම් වල පෙන්වන අතර ඔවුන් එම මුදල් නැවත ඉල්ලා නොසිටියහොත් ඉදිරියේදී අදායමට ගැනීමට කටයුතු කරනු ඇත. |
| **(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය** | | |
| XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය.<br>මෙම කරුණ පෙර වර්ෂ වලදීද පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සාකච්ඡාවට භාජනය විය. |

| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
|---|---|---|
| 8.14.1 වගන්තිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව පාලක සභා තීරණ මඟින් ප්‍රමාද වූ කොන්ත්‍රාත්තු සඳහා කොන්ත්‍රාත් කාලය නොසලකා දීර්ඝ කර තිබුණි. | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2018.12.14 දිනැති HE /PR /2017 /Works / Contract Extension අංක දරණ ලිපිය අනුව කාලය දීර්ඝ කිරීම් ලබාදීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.8.4 ප්‍රකාරව | ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශයේ ක්‍රීඩා මණ්ඩපය විස්තාරණය කිරීමේ රු. මිලියන 11,998,275 (වැට් රහිත) ක කොන්ත්‍රාත්තුව හා රසායනාගාර විද්‍යාගාරය අළුත්වැඩියා කිරීම හා ව්‍යාප්ත කිරීමේ රු. 16,169,600 ක කොන්ත්‍රාත්තුව සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවට අවම වශයෙන් එක් සාමාජිකයෙක් රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් දැනුමක් ඇති අයෙකු පත් කළ යුතු වුවද එයට පටහැනිව විශ්වවිද්‍යාලීය නිලධාරීන් තිදෙනෙකු පත් කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන අත්පොත් 2.8.4 වගන්ති ප්‍රකාරව විශාල කොන්ත්‍රාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු සංයුතිය තුළ අවම වශයෙන් එක් සාමාජිකයෙකු හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර විෂය දැනුම ඇති අයෙකු විය යුතු වුවත් උක්ත කොන්ත්‍රාත්තුව එකී විශාල කොන්ත්‍රාත් වටිනාකම් සීමාව වන මිලියන 20ට වැඩිවන සීමාවට අයත් නොවන අතර කොන්ත්‍රාත් වටිනාකම රු. 11,998,275.00 බැවින් එය කුඩා කොන්ත්‍රාත් ගණයට අයත් වන බැවින් තිදෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. |

| 2.2 වෙනත් කරුණු | |
|---|---|
| (අ) නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකොට ව්‍යාපෘතිය කර ගෙන යාමේ හැකියාව නිශ්චය කිරීමකින් තොරව ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක්, ව්‍යායාම ශාලාවක් සහ පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළ කාර්යය වෙනුවෙන් උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජූනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණි. මූලික ප්‍රසම්පාදන කටයුතු නිමකොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට කටයුතු නොකිරීම නිසා දරන ලද මෙම වියදම අනාවර්තික ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය. | ගිණුමේ පවතින රු. 5,794,676/- ක වියදමක් ඇත්තේ උපදේශන සේවා ආයතනය විසින් සැලසුම් ඉදිරිපත් කිරීමට වන අතර එය විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත. මෙය නගර ව්‍යාපෘති (Township) වැඩ පිළිවෙල යටතේ සිදුකර ඇති අතර ඒ සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් කොන්ත්‍රාත්තු ප්‍රදානයක් සිදු කර නොමැත. මෙය නව ව්‍යාපෘතියක් ලෙස මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |
| (ආ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 6.5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජූනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, 2019 වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වේ. ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන අතර ඉක්මනින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීම විශ්වවිද්‍යාලයේද අභිප්‍රාය වේ. |
| (ඇ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 38 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 19,705,186 ක බැඳුම්කර කඩවීම් මත විශ්වවිද්‍යාලයට අයවිය යුතුව පැවතුණි. | 2020 වර්ෂයේ රු. 17,548,926.93 ක් අය කර ගැනීමට කටයුතු සිදු කර ඇත. තවද නිලධාරීන් 15 දෙනෙකු සඳහා නීති මය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නිලධාරීන් 12 දෙනෙකු සඳහා මූලික පරීක්ෂණ පැවැත්වීමටත් නිලධාරීන් 7 දෙනෙකුගේ අර්ථ සාධක අරමුදලෙන් අයකර ගැනීමටද කටයුතු සිදු කරමින් පවතී. |

| | |
|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 102 ක් යටතේ පැවති රු. 35,527,763 කින්, අදාළ අරමුණ සඳහා උපයෝජනය කර තිබූ මුදල රු.1,528,000 ක් හෙවත් සියයට 4 ක් පමණ අඩු ප්‍රතිශතයක් වූ අතර ඉන් අරමුදල් 98 ක් යටතේ වූ | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇත්තේ විශේෂ අරමුණක් හෝ පරමාර්ථයක් සඳහාය. අදාල අරමුණ හා නිර්ණායකයන් ලභා කර ගැනීමට සමත් වූවහොත් පමණක් උපයෝජයන කරනු ඇත. මෙම වර්ෂය තුල උපාධි ප්‍රදානෝත්සවය නොපැවැත්වීම මතද මෙම අරමුදල් උපයෝජනය අවම මට්ටමක පැවතුණි. අරමුදලේ ආදායම් පමණක් වියදම් කරනු ලබන අතර ආයෝජන මුදල ඉදිරියට පවත්වා ගැනීම සිදු කරනු ලබයි. |
| (ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ශේෂය රු. 36,658,732 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 28 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොනිබුණු අතර එකතුව රු. 22,503,744 ක් වූ අරමුදල් ගිණුම් 47 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොනිබුණි. | විවිධ ආයතන විසින් ලබා දී ඇති ප්‍රදාන අදාළ කාර්යයන් සඳහා පමණක් භාවිතා කරනු ලබන අතර 2020 වර්ෂය තුළ අරමුදල් ඌණ උපයොජනය සඳහා කොවිඩ් - 19 බලපෑම්ද ඇති කරන ලදී. |
| (ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු. 347,586,262 ක් වූ විශේෂ අරමුදල් 28 ක් වර්ෂය තුළ උපයෝජනය කර නොනිබුණි. | විශේෂ අරමුදල් එක් එක් දෙපාර්තමේන්තුව විසින් ජනනය කරන ලද ආදායම් වන අතර එම ආදායම් අරමුදල් පිහිටුවීමේ අරමුණු අනුව උපයෝජනය කරනු ලැබේ. 2020 වර්ෂයේ කොවිඩ් - 19 බලපෑම් අනුව ඌණ උපයෝජනය දක්නට ලැබේ. |

| | |
|---|---|
| (උ) සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වර්ෂ 06 ක කාල සීමාවක් තුල විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 669 ක් වූ විවිධ පර්යේෂණ 366 ක් වෙනුවෙන් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ඉන් ඉවත් කර ගැනීම් හා මුදල් ලබා නොගැනීම් මත පර්යේෂණ 31 ක් නවතා දමා තිබූ අතර පර්යේෂණ 185 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණ කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 14.89 ක ප්‍රතිපාදන අනුමත කථිකාචාර්යවරුන් 31 දෙනෙකු වාර්තාවේ දිනය දක්වාම පර්යේෂණ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් වෙනත් කථිකාචාර්යවරයෙකුට ඒ සඳහා වූ අවස්ථාව අහිමි වී තිබුණි. | පර්යේෂණ සභාව විසින් නිරන්තරයෙන් පර්යේෂණ සම්බන්ධයෙන් සමාලෝචනය කරනු ලබන අතර මෙම වාර්තාවට අදාල කොරතුරු ලබාදීමෙන් පසු පර්යේෂණ 12ක් අවසන් කර වාර්තා ලබා දී ඇති අතර තවත් වාර්තා ප්‍රමාණයක් සඳහා දින දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. |
| (ඌ) කොන්ත්‍රාත් වැඩ 59 කට අදාළව 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය අවසානය දක්වා පැවත එන එකතුව රු. 104,314,753 ක් වූ රැඳවුම් මුදල් අදාළ කොන්ත්‍රාත්වල නඩත්තු කාලය ඉක්මවා ගොස් ඇද්දැයි පරීක්ෂා කර නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිහි කැඳවීමේ ලිපි යවා ඇත. ඒ අනුව රඳවා ගැනීමේ මුදල් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. |
| (එ) 2020 දෙසැම්බර් 31 දිනට වසර 1 සිට වසර 2 දක්වා කාල පරාසයක අය කරගෙන නොතිබූ ආපදා ණය එකතුව රු. 479,220 ක් වූ අතර වසර 3 ක් හා ඊට වැඩි කාලපරාසයකට අදාළව අය කරගෙන නොතිබූ ආපදා ණය එකතුව රු. 1,169,805 ක් විය. තවද වසර 3 කට වැඩි කාල පරාසයකට අදාළව අයකර ගෙන නොතිබූ එකතුව රු. 12,000 ක් වූ පරිගණක ණයද, එකතුව රු. 9,910 ක් වූ කාර්ය මණ්ඩල ණයද, එකතුව රු. 42,780 ක් වූ වාහන ණයද 2020 දෙසැම්බර් 31 දිනට අයකර ගෙන නොතිබුණි. | වසර 1 සහ 2 අතර කාලයක ආපදා ණය මුදල් අයවීමට ඇත්තේ වැඩ තහනමට ලක්වූ සේවකයින් දෙදෙනෙකු හා වැටුප් රහිත නිවාඩු ලැබූ සේවකයින් දෙදෙනෙකුගේ ණය මුදල් වේ. ඔවුන් නැවත සේවයට පැමිණීමෙදී හෝ සේවයෙන් ඉවත්වීමකදී අර්ථසාධක අරමුදලින් අයවීමට කටයුතු කරනු ලැබේ.<br>වසර 2 සහ 3 කාල පරාසයට අයත් ණය අයවීම් වල හේතුව වූයේ සේවයෙන් ඉවත්වීම, වැටුප් රහිත නිවාඩු හා වැඩ තහනම්වීම් ය. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති බැවින් එම |

| | |
|---|---|
| | මුදල් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකිරීමට කටයුතු කරනු ඇත.<br>පරිගණක ණය සහ වාහන ණයද අයවීමට ඇත්තේ ඉවත්වූ සහ වැඩ තහනමට ලක්වූ සේවකයින්ගේ වේ. ඔවුන් නැවත සේවයේ පිහිටවීමකදී හෝ ඉවත්වීමකදී නම අර්ථසාධක අරමුදලින් අයවීමට කටයුතු කරනු ඇත. |
| (ඒ) මිය යාම, ස්ථාන මාරු කිරීම සහ වැඩ තහනම් කිරීම වැනි හේතූන් නිසා අයවීම අත්හිටු වූ එකතුව රු. 137,100 ක් වූ උත්සව අත්තිකාරම් එකතුව රු. 131,418 ක් වූ වැටුප් අත්තිකාරම් හා එකතුව රු. 58,550 ක් වූ විශේෂ අත්තිකාරම් අයකර ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීම සිදුකර නොතිබුණි. | වැඩ තහනමකට ලක්වූ සහ සේවයෙන් ඉවත්වූ සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමෙදීද, ස්ථාන මාරුවීම් ලැබීම් හේතුවෙන් අයවීමට ඇති මුදල් අදාල විශ්වවිද්‍යාල වලින් ලබා ගැනීමට කරයුතු කරමින් පවතී. |
| (ඔ) එකතුව රු. 246,291 ක් වූ විදේශ වාර සහරා මිලදී ගැනීමට ලබා දුන් ප්‍රාග්ධන අත්තිකාරම් 2 කට අදාළව නිකුත් කරන ලද චෙක්පත් (Foreign Draft) අවලංගු කරන ලෙස 2016 හා 2017 වර්ෂවලදී මහජන බැංකුව වෙත දැනුම් දී තිබුණද එම වර්තාකම සමාලෝචිත වර්ෂය අවසාන වන විටදීද ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් බැංකුවට ලිපි යවා ඇති අතර අදාළ පුස්තකාල පොත් අත්තිකාරම නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඕ) ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම රු.මිලියන 4,983 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු. මිලියන 5,338 ක් විය.ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන රු. මිලියන 355 කින් වැඩි වී තිබුණද විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් නොකරන බවත් ආසන්න අධ්‍යයන වර්ෂ දෙකක (2017/2018, 2018/2019) පිළිවෙලින් සිසුන් 3726 ක් සහ 3722 ක් බඳවා ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. | මෙහෙයුම් ධාරිතාව වැඩිවීමක් සිදු නොවූ අතර 2020 වසරේ ජනවාරි මස වැටුප් වැඩිවීම මත මෙම වැඩි වීම සිදු වී ඇත. ඒ අනුව වැටුප් හා වේතන රුපියල් මිලියන 187 ක් හා අධ්‍යයන දීමනා රුපියල් මිලියන 185 කින් වැඩි වී ඇති අතර සාපේක්ෂව වැටුප් හා වේතන වැඩිවීම මත පුනරාවර්තන වියදමද වැඩි වී ඇත. |

| | |
|---|---|
| (ක) ආසන්න අධ්‍යයන වර්ෂ දෙකක විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයින් බඳවා ගැනීමේදී තවදුරටත් පාඨමාලාවල පැවති පුරප්පාඩු සම්බන්ධයෙන් සලකා බැලීමේදී ව්‍යවහාරික විද්‍යා පීඨයේ 2016/2017 හා 2017/2018 අධ්‍යයන වර්ෂ සඳහා පිළිවෙලින් 28 ක හා 41 ක් වශයෙන් පුරප්පාඩු පැවතුණි. මෙම පීඨයේ භෞතික විද්‍යා විෂය ධාරාව සඳහා දිගින් දිගටම පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කල් ගතවන බැවින් බොහෝ ශිෂ්‍යයන් දෙවන වර උසස් පෙළ විභාගයට පෙනී සිට වෛද්‍ය පීඨය සඳහා ඇතුලත්වීමේ අපේක්ෂාවෙන් මෙම පීඨය සඳහා ලියාපදිංචි වීම අඩු වී ඇත.<br>ශිෂ්‍යයින් බඳවා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලබන අතර ලබාදී ඇති ලේඛණ අනුව ශිෂ්‍යයින් බඳවාගෙන ඇත. |
| (ග) විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පාඨමාලා 1991 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන අතර 2014 වර්ෂයට පසු නව පාඨමාලා හඳුන්වාදීමක් සිදුකර නොමැති අතර 2020 වර්ෂයේදී විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) පාඨමාලාව නව පාඨමාලාවක් ලෙස හඳුන්වා දී තිබූ අතර මෙම පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන් කර නොතිබුණි. | නව පාඨමාලා හඳුන්වාදීමට අදාළ පීඨ විසින් කටයුතු කර ඇති අතර බාහිර උපාධි පාඨමාලා විෂය නිර්දේශ යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) පාඨමාලාවට අදාළ පාඨමාවේ ශිෂ්‍ය ලියාපදිංචිය 2021 වර්ෂයේ අවසන් කර ඇති අතර ප්‍රමාදය සඳහා කොවිඩ් - 19 වසංගත තත්වය හේතු විය. |
| (ව) 2018, 2019 වර්ෂවලදී බාහිර විභාග පාඨමාලා ගාස්තු සහ සම්මන්ත්‍රණ සඳහා සිසුන්ගෙන් ලද රු. 172,295,076 ක් අදාළ පාඨමාලා සහ සම්මන්ත්‍රණ නොපැවැත් වීම හේතුවෙන් විලම්බිත ආදායම් ලෙස දක්වා තිබුණි. | මෙම පාඨමාලා සඳහා වියදම් ඉදිරි වර්ෂ වල දැරීමට සිදුවීම හේතුවෙන් පාඨමාලාවේ ඉදිරි වර්ෂ සඳහා ලැබීම් විගණන ප්‍රමිතීන් අනුව විලම්බිත කිරීමට කටයුතු කර ඇත. |

| | |
|---|---|
| (ඒ) එකතුව රු. 9,053,294 ක් වූ ලැබිය යුතු ශේෂ 11 ක් සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක් ගත වී ඇති නමුත් එම ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් අතර තැන්පත් කිරීම් රු.මිලියන 2 ක් පවතින අතර අදාල සේවය නවමත් ලබා ගන්න බැවින් අයකර ගත නොහැක.<br>රු.මිලියන 2 ක ප්‍රමාණයක් අදාල පීඨයන්හි දැනටමත් අයකරගෙන ඇත.<br>අනෙකුත් ශේෂයන් අයකර ගැනීමේ කටයුතු සහ ශේෂයන් නිරවුල් කරමින් පවතින අතර 2021 ඔක්තෝම්බර් වර්ෂය සඳහා ගලපනු ලැබේ. |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ<br>උපකුලපති | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ<br>උපකුලපති<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |